ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1979 අංක 52 දරන
බුද්ධිමය දේපළ නීති සංග්‍රහය
පනත

[සභාපතිතුමා සතුගේ කළේ 1979 අගෝස්තු මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 අගෝස්තු මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : රු. 5.50 සි තැපැල් ගාස්තුව : රු. 1.00 සි

1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත

පටුන

වගන්තිය			පිටුව
1	...	ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය	1

I වන කොටස — පරිපාලනය

I වන පරිච්ඡේදය

2	...	රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සහ ඔහුගේ කාර්ය	1
3	...	නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන්	1
4	...	ලියාපදිංචි කිරීමේ කාර්යාලය සහ ලේඛන පවත්වා ගෙන යාම	2
5	...	රෙජිස්ට්‍රාර්වරයන් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව	2

II වන කොටස — ප්‍රකාශන අයිතිය

II වන පරිච්ඡේදය

6	...	අර්ථ නිරූපණය	3
7	...	ආරක්ෂිත කෘති	3
8	...	ව්‍යුත්පන්න කෘති	4
9	...	අනාරක්ෂිත කෘති	5
10	...	ආර්ථික අයිතිවාසිකම්	5
11	...	සදාචාර අයිතිවාසිකම්	5
12	...	ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘති	6
13	...	සාධාරණ ප්‍රයෝජනයට ගැනීම	6
14	...	අවිර තැටිගත කිරීම් හා පටිගත කිරීම්	8
15	...	පරිවර්තන අයිතිවාසිකමේ සීමාව	8
16	...	ශාබ්දික පටිගත කිරීම්, තැටිගත කිරීම් සහ විකාශනය කිරීම් පිළිබඳ අයිතිවාසිකමේ සීමාව ...	9
17	...	ප්‍රකාශන අයිතිය පිළිබඳ හිමිකම්	9
18	...	ප්‍රකාශන අයිතිය පැවරීම්	10
19	...	ආර්ථික අයිතිවාසිකම් පවත්නා කාලය	10
20	...	ශාබ්දික තැටිගත කිරීම් හෝ පටිගත කිරීම්	11
21	...	උල්ලංඝනය කිරීම් සහ දණ්ඩන	11
22	...	පනත අදාළ වන ක්ෂේත්‍ර	11
23	...	පොදු නීතියේ අයිතිවාසිකම් අහෝසි කිරීම	12
24	...	වෙනත් නීති යටතේ ඇති අයිතිවාසිකම්	12

III වන කොටස — කාර්මික සැලසුම්

III වන පරිච්ඡේදය — මේ කොටසේ විෂය පථය සහ අර්ථකථන

25	...	මෙම පනතෙහි විෂය පථය	12
26	...	ආරක්ෂාව පිළිබඳ කොන්දේසි	12
27	...	කාර්මික සැලසුම් යන්නෙහි අර්ථකථනය	12
28	...	නවකාව යන්නෙහි අර්ථකථනය	12

2—ඒ 40982—13,550 (79/04)

වගන්තිය			පිටුව
	IV වන පරිච්ඡේදය — කාර්මික සැලසුමක් ආරක්ෂා කිරීමට ඇති අයිතිවාසිකම		
29	...	කාර්මික සැලසුමක හිමිකම සහ එය ආරක්ෂා කර ගැනීමට ඇති අයිතිවාසිකම ...	13
30	...	පැහැර ගැනීම: ඉ ල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචි කිරීම අධිකරණය විසින් පැවරීම ...	13
31	...	සේවා නියුක්තයකු විසින් හෝ භාර දීමක් අනුව හෝ නිර්මාණය කරන ලද කාර්මික සැලසුමක්	14
32	...	කාර්මික සැලසුමක නිර්මාතෘවරයා නම් කරනු ලැබීම	14
	V වන පරිච්ඡේදය — ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍යතා කරුණු සහ ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය		
33	...	ඉල්ලුම්පත්‍රයකට අදාළ අවශ්‍ය කරුණු	15
34	...	ප්‍රමුඛත්ව අයිතිවාසිකම	16
35	...	ඉල්ලුම්පත්‍ර ගාස්තු	16
36	...	ඉල්ලුම්පත්‍රය පරීක්ෂා කිරීම	16
37	...	ලියාපදිංචි කිරීම	17
38	...	ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම	17
39	...	කාර්මික සැලසුම් ලේඛනය	17
40	...	ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික පිටපත්	17
41	...	ලියාපදිංචි කාර්මික සැලසුම් පළ කිරීම	17
	VI වන පරිච්ඡේදය — ලියාපදිංචිය පවත්නා කාලය		
42	...	ලියාපදිංචිය පවත්නා කාලය	18
43	...	අලුත් කිරීම	18
	VII වන පරිච්ඡේදය — කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්		
44	...	කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම	18
45	...	ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් සීමා කිරීම	19
	VIII වන පරිච්ඡේදය—ඉල්ලුම් පත්‍ර හා ලියාපදිංචි කිරීම් පැවරීම් සහ අන්‍යතු කිරීම		
46	...	ඉල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පැවරීම් සහ අන්‍යතු කිරීම	19
47	...	ඉල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පිළිබඳ හවුල් හිමිකම	20
	IX වන පරිච්ඡේදය—අවසර ගිවිසුම්		
48	...	අර්ථ නිරූපණය	20
49	...	අවසර ගිවිසුමේ ආකෘතිය සහ ඒ ගැන සටහන් කිරීම	20
50	...	අවසරලාභී සතු අයිතිවාසිකම්	20
51	...	අවසරදායීගේ අයිතිවාසිකම්	21
52	...	අවසර ගිවිසුම්වල නිර්බල වගන්ති	21
53	...	ලියාපදිංචිය බලරහිත කිරීම අවසර ගිවිසුම්වලට බලපාන ආකාරය	21
54	...	අවසර ගිවිසුමක් ඉකුත්වීම, අවසාන වීම හෝ නිර්බල වීම	22
55	...	විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන අවසර ගිවිසුම්	22
	X වන පරිච්ඡේදය—ලියාපදිංචිය අත්හැරීම සහ එහි බලරහිත බව		
56	...	ලියාපදිංචිය අත් හැරීම	22
57	...	ලියාපදිංචියේ බලරහිත බව	23
58	...	බලරහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය	24

වගන්තිය පිටුව

IV වන කොටස—පේටන්ට් බලපත්‍ර

XI වන පරිච්ඡේදය — අර්ථකථන

59 ... නව නිපැයුම පිළිබඳ අර්ථ කථනය 24
60 ... පේටන්ට් බලපත්‍රයක් ලබාගත හැකි නව නිපැයුම් 25
61 ... නවකාව 25
62 ... නව නිපැයුම්කාරී පියවර 25
63 ... කාර්මික වශයෙන් යොදා ගැනීම 26

XII වන පරිච්ඡේදය—පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට තිබෙන අයිතිවාසිකම්

64 ... පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම් 26
65 ... පැහැර ගැනීම : පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් අධිකරණය විසින් පැවරීම 26
66 ... සේවා නියුක්තයකු විසින් හෝ භාර දීමක් අනුව හෝ කරන ලද නව නිපැයුම් ... 26
67 ... නව නිපැයුම්කරු නම් කරනු ලැබීම 27

XIII වන පරිච්ඡේදය—ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ ප්‍රදානය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය

68 ... ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු... 27
69 ... ඉල්ලුම් පත්‍ර ගාස්තුව 29
70 ... සෝදිසි වාර්තාව 29
71 ... නව නිපැයුම් පිළිබඳ ඒකීය භාවය 30
72 ... ඉල්ලුම් පත්‍රය සංශෝධනය කිරීම හා විභජනය කිරීම් 30
73 ... ප්‍රමුඛත්වය පිළිබඳ අයිතිවාසිකම් 30
74 ... ඉදිරිපත් කිරීමේ දිනය 31
75 ... පරීක්ෂා කිරීම 31
76 ... පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම 32
77 ... පේටන්ට් බලපත්‍ර ලේඛනය 33
78 ... ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කරන ලද පිටපත් 33
79 ... ලිපිගොනු පරීක්ෂා කිරීම 33

XIV වන පරිච්ඡේදය—පේටන්ට් බලපත්‍රයක් වලංගු කාල සීමාව

80 ... පේටන්ට් බලපත්‍රයක් වලංගු කාල සීමාව 34

XV වන පරිච්ඡේදය—පේටන්ට් බලපත්‍ර හිමියාගේ අයිතිවාසිකම්

81 ... පේටන්ට් බලපත්‍ර හිමියාගේ අයිතිවාසිකම් 35
82 ... හිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව 35
83 ... පූර්ව සෑදීමකින් හෝ පාවිච්චි කිරීමකින් වැළැක්වෙන අයිතිවාසිකම් 36

XVI වන පරිච්ඡේදය—පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සහ පේටන්ට් බලපත්‍ර පැවරීම සහ අන්‍යසතු කිරීම

84 ... පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සහ පේටන්ට් බලපත්‍ර පැවරීම සහ අන්‍යසතු කිරීම... 36
85 ... පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර පිළිබඳ හෝ පේටන්ට් බලපත්‍ර පිළිබඳ හවුල් හිමිකම් 7

වගන්තිය පිටුව

XVII වන පරිච්ඡේදය—අවසර ගිවිසුම

86 ... අර්ථ නිරූපණය 37
87 ... අවසර ගිවිසුමේ ආකෘතිය සහ එය සටහන් කිරීම 37
88 ... අවසර ලාභී සතු අයිතිවාසිකම් 38
89 ... අවසරදයී සතු අයිතිවාසිකම් 38
90 ... අවසර ගිවිසුම්වල බලරහිත වගන්ති 38
91 ... පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සාර්ථක නොවීමේ හෝ පේටන්ට් බලපත්‍රයක් බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵල 39
92 ... අවසර ගිවිසුමක් ඉකුත් වීම, අවසාන කිරීම හෝ නිර්බල වීම 39
93 ... විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන අවසර ගිවිසුම් ... 40

XVIII වන පරිච්ඡේදය—පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම සහ පේටන්ට් බලපත්‍රයක බලරහිත බව

94 ... පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම 40
95 ... පේටන්ට් බලපත්‍රයක බල රහිත බව 41
96 ... බලරහිත වීමේ දිනය හා ප්‍රතිඵලය 42

V වන කොටස—ලකුණු, ව්‍යාපාර නාම සහ අසාධාරණ තරහ

XIX වන පරිච්ඡේදය—අර්ථ කථන

97 ... අර්ථ කථනය 42

XX වන පරිච්ඡේදය—ලකුණුවල ආවේශ්‍යතාව

98 ... ලකුණුවල ආවේශ්‍යතාව 44
99 ... විෂය මූලික හේතු නිසා ආවේශ්‍ය කළ නොහැකි ලකුණු 45
100 ... තෘතීය පාර්ශ්වික අයිතිවාසිකම් නිසා අවේශ්‍ය කළ නොහැකි ලකුණු 46
101 ... භාරයක් ලේඛනයේ සටහන් නොකළ යුතු බව 47

XXI වන පරිච්ඡේදය—ඉල්ලුම් පත්‍රයට අදළ අවශ්‍ය කරුණු සහ ලියාපදිංචිය පිළිබඳ කාර්ය පටිපාටිය

102 ... ඉල්ලුම් පත්‍රයට අදළ අවශ්‍ය කරුණු 48
103 ... ප්‍රමුඛත්වය පිළිබඳ අයිතිවාසිකම් 48
104 ... අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කරනු ලබන ලකුණක් සඳහා තාවකාලික ආරක්ෂාව 48
105 ... ඉල්ලුම් පත්‍ර ගාස්තු 49
106 ... ඉල්ලුම් පත්‍රයෙහි ආකෘතිය පිළිබඳ පරීක්ෂණය 49
107 ... වැඩිදුරටත් පරීක්ෂා කිරීමෙන් පසු ලකුණ ලියාපදිංචි කිරීම හා ලකුණ පළ කිරීම ... 50
108 ... ලියාපදිංචිය සම්පූර්ණ නොකිරීම 51
109 ... ලකුණු ලේඛනය සහ සහතික නිකුත් කිරීම 52
110 ... ලියාපදිංචි ලකුණු පළ කිරීම 52
111 ... ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපත් 52
112 ... ආශ්‍රිත ලකුණු 52
113 ... ආශ්‍රිත ලකුණු පැවරීම සහ පාවිච්චි කිරීම 53

XXII වන පරිච්ඡේදය—ලියාපදිංචිය පවත්නා කාලය

114 ... ලියාපදිංචිය පවත්නා කාලය 53
115 ... අලුත් කිරීම 53
116 ... ලියාපදිංචි ලකුණක් අවුතු කිරීම 54

වගන්තිය			පිටුව
		XXIII වන පරිච්ඡේදය—ලකුණක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්	
117	...	ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්	54
118	...	ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව	54
		XXIV වන පරිච්ඡේදය—ඉල්ලුම් පත්‍ර සහ ලියා පදිංචි කිරීම් පැවරීම සහ අන්සතු කිරීම	
119	...	ඉ ල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පැවරීම සහ අන්සතු කිරීම	55
		XXV වන පරිච්ඡේදය—අවසර ගිවිසුම්	
120	...	අර්ථ නිරූපණය	56
121	...	අවසර ගිවිසුමක ආකෘතිය සහ එය සටහන් කිරීම	56
122	...	අවසර ලාභී සතු අයිතිවාසිකම්	56
123	...	අවසරදායී සතු අයිතිවාසිකම්	57
124	...	අවසර ගිවිසුමක් සහ ඒවායේ ඇතැම් වගන්ති බලරහිත වීම	57
125	...	අවසර ගිවිසුම් අවලංගු කිරීම	57
126	...	විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන අවසර ගිවිසුම්	58
127	...	ලියාපදිංචිය බලරහිතවීම අවසර ගිවිසුම් කෙරෙහි බලපාන අන්දම	58
128	...	අවසර ගිවිසුමක් ඉකුත්වීම, අවසාන කිරීම, හෝ නිර්බල වීම	58
		XXVI වන පරිච්ඡේදය—ලියාපදිංචිය අත් හැරීම සහ එහි බලරහිත බව	
129	...	ලියාපදිංචිය අත් හැරීම	59
130	...	ලියාපදිංචියේ බලරහිත බව	59
131	...	බලරහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය	60
		XXVII වන පරිච්ඡේදය—ලකුණක් ඉවත් කිරීම	
132	...	ලකුණක් ඉවත් කිරීම	60
133	...	ලකුණක් ඉවත් කෙරෙන දිනය සහ ඉවත් කිරීමේ ප්‍රතිඵලය	61
		XXVIII වන පරිච්ඡේදය—සාමූහික ලකුණු	
134	...	සාමූහික ලකුණු	62
135	...	සාමූහික ලකුණක් ලියාපදිංචිකිරීම සඳහා ඉ ල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම ...	62
136	...	සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම සහ පළ කිරීම	62
137	...	සාමූහික ලකුණක් පාවිච්චි කිරීම පාලනය කෙරෙන කොන්දේසි වෙනස් කිරීම ...	62
138	..	සාමූහික ලකුණ පාවිච්චි කිරීම සහ වෙනත් කරුණු	63

වගන්තිය පිටුව

XXIX වන පරිච්ඡේදය—ව්‍යාපාර නාම සහ අසාධාරණ තරඟ

139 ... කෙනෙම් ව්‍යාපාර නාම 63
140 ... ව්‍යාපාර නාම ආරක්ෂා කිරීම 63
141 ... ව්‍යාපාර නාම පැවරීම සහ අන්සතු කිරීම 63
142 ... අසාධාරණ තරඟ 63

VI වන කොටස — වැරදි සහ දඬුවම්

XXX වන පරිච්ඡේදය

143 ... යම් ලේඛනයක සටහන් වංක ලෙස වෙනස් කිරීම 64
144 ... ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීම 64
145 ... කාර්මික සැලසුම් උල්ලංඝනය කිරීම 65
146 ... කාර්මික සැලසුම් පිළිබඳව අසත්‍ය කරුණු දක්වීම 65
147 ... පේටන්ට් බලපත්‍ර උල්ලංඝනය කිරීම 66
148 ... පේටන්ට් බලපත්‍ර පිළිබඳව අසත්‍ය කරුණු දක්වීම 66
149 .. පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු නීති විරෝධී ලෙස අනාවරණය කිරීම ... 66
150 ... ලකුණු උල්ලංඝනය කිරීම 67
151 ... වෙළෙඳ ලකුණු පිළිබඳව අසත්‍ය කරුණු දක්වීම 67
152 ... ලකුණු හා වෙළෙඳ චිත්තර පිළිබඳ වෙනත් වැරදි 67
153 ... සංස්ථා විසින් කරනු ලබන වැරදි 69
154 ... අර්ථ නිරූපණය 69
155 ... ව්‍යාජ නම් හෝ මුල් අකුරු 69
156 ... කූට ලකුණු සෑදීම 70
157 ... ලකුණු සහ චිත්කර යෙදීම 71
158 ... සාමාන්‍ය කටයුතුවල නියුක්ත ඇතැම් තැනැත්තන් නිදහස් කිරීම 72
159 ... ඔර්ලෝසු 72
160 ... ලකුණ උත්තරවාදයක චිත්තර කළ යුතු ආකාරය 73
161 ... සාක්ෂි පිළිබඳ රීති 73
162 ... අපසහායකයන්ට දඩුවම් කිරීම 73
163 ... සෝදිසි වරෙන්තු 73
164 ... චිත්තියේ සහ පැමිණිල්ලේ නඩු ගාස්තු 74
165 ... නඩු පැවරීමේ සීමාව 74
166 ... ආනයනය කිරීම තහනම් කිරීම 75
167 ... ලකුණු යෙදූ භාණ්ඩ විකිණීම පිළිබඳ ව්‍යාජිත ප්‍රතිඥාහාර 76
168 ... ව්‍යාජ චිත්තර පිළිබඳ විධිවිධාන ඇතැම් අවස්ථාවල දී අදාළ නොවීම 76
169 ... ආරක්ෂා කිරීම 77
170 ... සංඥයෙ හා ඇපදිය හැකි වැරදි 77

වගන්තිය පිටුව

VII වන කොටස—විවිධ කරුණු

XXXI වන පරිච්ඡේදය—නියෝග

171 ... නියෝග 77

XXXII වන පරිච්ඡේදය—රෙජිස්ට්‍රාර්වරයා වෙත සහ අධිකරණය වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පැවැත්වෙන කටයුතු සහ අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතු

172 ... ලේඛනයේ වැරදි හරිගැස්සීම සහ ලේඛනය නිවැරදි කිරීම 78

173 ... යම් ලේඛනයක පලුදු වූ වෙලුම්වල පිටපත් ගැනීමට සහ ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරු පිළියෙල කොට ඇතුළත් කිරීමට ඇති බලය 79

174 ... රෙජිස්ට්‍රාර්වරයාගේ සහතිකය සාක්ෂි විය යුතු බව 80

175 ... සහතික කරන ලද පිටපත් සාක්ෂි විය යුතු බව 81

176 ... සාක්ෂි දීමේ ක්‍රමය 81

177 ... රෙජිස්ට්‍රාර්වරයා විසින් අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීම 81

178 ... රෙජිස්ට්‍රාර්වරයා විසින් නීති නිලධරයන්ගේ උපදෙස් ලබා ගත හැකි බව ... 81

179 ... කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් උල්ලංඝනය කිරීම පිළිබඳව එහි ලියාපදිංචි හිමියා විසින් පවරනු ලබන නඩු කටයුතු 81

180 ... උල්ලංඝනය පිළිබඳව අවසරලාභී විසින් හෝ අවසරලාභීගේ ඉල්ලීම පිට හෝ පවරනු ලබන නඩු කටයුතු 82

181 ... උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශය 82

182 ... අභියාචන 83

183 ... රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට පැවැත්වෙන කටයුතු පිළිබඳ හා අධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු පිළිබඳ ගාස්තු 83

184 ... මුද්දර ගාස්තු 84

185 ... අරමුදල 84

186 ... අර්ථ නිරූපණය 85

XXXIII වන පරිච්ඡේදය—පරිවර්ජින්න කිරීම් සහ ආරක්ෂා කිරීම්

187 ... ප්‍රකාශන අයිතිය : 154 වන අධිකාරය පරිවර්ජින්න කිරීම සහ ආරක්ෂා කිරීම් ... 85

188 ... කාර්මික සැලසුම් : 153 වන අධිකාරය පරිවර්ජින්න කිරීම සහ ආරක්ෂා කිරීම් ... 85

189 ... පේටන්ට් බලපත්‍ර : 152 වන අධිකාරය පරිවර්ජින්න කිරීම සහ ආරක්ෂා කිරීම් ... 86

190 ... ළකුණු : 150 වන සහ 151 වන අධිකාර පරිවර්ජින්න කිරීම සහ ආරක්ෂා කිරීම් ... 86

191 ... අතිරේක පරිවර්ජින්න කිරීම් 88

192 ... අතිරේක ආරක්ෂා කිරීම් 88

1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත

[සභානිකය සටහන් යාළේ 1979 අගෝස්තු මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 53/78

ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ ලකුණු, ව්‍යාපාර නාම සහ අසාධාරණ තරඟ පිළිබඳ නීති ප්‍රතිශෝධනය කිරීම, ඒකාබද්ධ කිරීම, සංශෝධනය කිරීම සහ නීති සංග්‍රහයක් ලෙස ඒ නීති අන්තර්ගත කිරීම පිණිසත් ඒවා ලියා පදිංචි කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම් වඩා හොඳින් සිදු කරලීමට විධිවිධාන සැලැස්වීම පිණිසත් ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ප්‍රහුඹු කාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත (මෙහි මින් මතු "නීති සංග්‍රහය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ නීති සංග්‍රහයෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

පරිපාලනය

I වන පරිච්ඡේදය

රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම සහ ඔහුගේ කාර්ය.

2. (1) ශ්‍රී ලංකාවෙහි පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීමට හෝ (මෙහි මින් මතු "රෙජිස්ට්‍රාර්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි පත් කිරීමක් නොකරන ලද විටක, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඒ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් තත් කාලයේ වැඩ බලන යම් තැනැත්තකු විසින් හෝ මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්ය ඉටු කළ යුතු ය.

(3) මේ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳ සහ මේ නීති සංග්‍රහයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස පත් කරනු ලබන හෝ ඒවා ක්‍රියාත්මක කිරීමේ නිරත වන සියලු තැනැත්තන් පිළිබඳ සාමාන්‍ය පාලනය සහ අධීක්ෂණය අමාත්‍යවරයාගේ විධාන වලට යටත්ව රෙජිස්ට්‍රාර්වරයා වෙත පවරනු ලැබිය යුතු ය.

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන්.

3. (1) පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා ලෙස හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් ක්‍රියා කිරීමට හෝ යෝග්‍ය හා සුදුසු තැනැත්තකු හෝ පේටන්ට්

බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් ලෙස හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරුන් වශයෙන් ක්‍රියා කිරීමට හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන පරිදි, යෝග්‍ය සහ සුදුසු තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි ගණනක් සහ වෙනත් සහකාර රෙජිස්ට්‍රාර්වරුන් ලෙස හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් වශයෙන් ක්‍රියා කිරීමට හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන පරිදි යෝග්‍ය සහ සුදුසු තැනැත්තන් දෙදෙනකු හෝ වැඩි ගණනක් කලින් කල පත් කරනු ලැබිය හැකි ය.

(2) එසේ පත් කරනු ලබන යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයාට හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයාට ප්‍රකාශිතව ම පවරන ලද නොහොත් නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්යයක් ඉටු කිරීම හෝ කර්තව්‍යයක් කිරීම කරනු ලැබිය හැකි අතර මේ නීති සංග්‍රහය මගින් හෝ යටතේ රෙජිස්ට්‍රාර්වරයාට පවරන ලද හෝ නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම, කාර්යයක් ඉටු කිරීම හෝ කර්තව්‍යයක් කිරීම ද අමාත්‍යවරයාගේ විධානවලට යටත්ව හා රෙජිස්ට්‍රාර්වරයාගේ අධිකාරය හා පාලනය යටතේ කරනු ලැබිය හැකිය.

(3) එවැනි යම් පත් කිරීමක් නොකරන ලද විටක, පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු පිළිබඳ සහකාර රෙජිස්ට්‍රාර්වරයකුගේ කාර්ය, අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්වරයකු විසින් හෝ ඉටු කළ යුතු ය.

ලියාපදිංචි කිරීමේ කාර්යාලය සහ ලේඛන පවත්වාගෙන යෑම.

4. (1) (මෙහි මින් මතු "ලියාපදිංචි කිරීමේ කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පේටන්ට් බලපත්‍ර හා වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් පිහිටුවිය හැකි අතර, එය කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තිබෙන එකම කාර්යාලය විය යුතු ය.

(2) මේ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ තබා ගැනීමට හා පවත්වා ගෙන යෑමට නියමිත සියලුම ලේඛන රෙජිස්ට්‍රාර්වරයාගේ අධීක්ෂණය යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි තබා ගැනීම හා පවත්වා ගෙන යෑම කළ යුතු ය. තවද, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකාවෙහි නීත්‍යනුකූල ලෙස පිළිගනු ලබන එකම ලේඛන, මේ ලේඛන විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාත් රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු බව

5. තත් කාලයේ සෑම රෙජිස්ට්‍රාර්වරයකු ම, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයකු ම හා සහකාර රෙජිස්ට්‍රාර්වරයකු ම, ඔවුන් ධුරය දරන තාක් කල්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සැලකිය යුතු ය.

II වන කොටස

ප්‍රකාශන අයිතිය

II වන පරිච්ඡේදය

අර්ථ නිරූපණය.

6. මේ කොටසෙහි කාර්ය සඳහා—

"ලිඛාශනය" යන්නෙන් මහජනයා විසින් ග්‍රහණය කිරීම සඳහා ශබ්ද හෝ ප්‍රතිබිම්බ සහ ශබ්ද කම්බි විරහිතව හෝ කම්බි මාර්ගයෙන් සම්ප්‍රේෂණය කිරීම අදහස් වේ;

"ජනප්‍රවාද" යන්නෙන් විවිධ ජන කොටස් විසින් ශ්‍රී ලංකාවේ නිර්මාණය කරනු ලැබ, පරම්පරාවෙන් පරම්පරාවට පැවත ආවා වූ ද සම්ප්‍රදායානුකූල සංස්කෘතික උරුමයේ එක් මූලිකාංගයක් සාදාගත්ත වන්නා වූ ද සියලුම ශාස්ත්‍රීය හා කලාත්මක කෘතීන් අදහස් වේ;

"රූගම්" යන්නෙහි ප්‍රසිද්ධ රූගමක් නැතහොත් කුරිටි හෝ යම් මාර්ගයකින් කෘතියක් ඉදිරිපත් කිරීම අදහස් වේ;

"ප්‍රසිද්ධ කරන ලද කෘතීන්" යන්නෙන් කර්තෘන්ගේ කැමැත්ත ඇතිව, කවර හෝ යම් ආකාරයකින් ප්‍රසිද්ධ කරන ලද කෘතීන් අදහස් වේ; එසේ වුවද, එසේ ප්‍රසිද්ධ කරන ලද පිටපත් සංඛ්‍යාව, කෘතියෙහි ස්වභාවය ගැන සලකන විට, මහජනයාගේ සාධාරණ අවශ්‍යතාවන් සපුරා ලීමට ප්‍රමාණවත් විය යුතු ය;

"ප්‍රතිනිෂ්පාදනය" යන්නෙන් යම් ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් ඇතුළුව, ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක පිටපතක් හෝ ඊට වැඩි පිටපත් සංඛ්‍යාවක් යම් ද්‍රව්‍යමය ස්වරූපයකින් සෑදීම අදහස් වේ;

"පළමුව ප්‍රසිද්ධ කරන ලද කෘතීන්" යන්නෙන් පළමුවෙන් ම ශ්‍රී ලංකාවෙහි දී ප්‍රසිද්ධ කරන ලද කෘතීන් හෝ පළමුවෙන් ම විදේශයක දී ප්‍රසිද්ධ කරනු ලැබූ නමුත් එසේ කලින් ප්‍රසිද්ධ කරන ලද දින සිට දවස් තිහක් ඇතුළත ශ්‍රී ලංකාවෙහි දී ද ප්‍රසිද්ධ කරන ලද කෘතියක් අදහස් වේ;

"හවුල් කර්තෘත්ව කෘතිය" යන්නෙන් කර්තෘන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් සහයෝගීව නිර්මාණය කරනු ලැබූ සහ එසේ ලා එක් කර්තෘවරයකුගේ සහභාගය වෙනත් කර්තෘවරයකුගේ සහභාගයෙන් වෙන් කොට හඳුනාගත නොහැකි කෘතියක් අදහස් වේ.

ආරක්ෂිත කෘති.

7. (1) මූල් ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක කෘතිවල කර්තෘන් සිය කෘති ආරක්ෂා කර ගැනීමට මේ කොටස යටතේ නිමිකම් ලැබිය යුතු ය.

(2) ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක කෘතිවලට විශේෂයෙන්ම පහත දැක්වෙන ඒවා ඇතුළත් විය යුතු ය:—

(අ) පොත්, පත්‍රිකා සහ වෙනත් ලියවිලි;

(ආ) දේශන, ඇමතුම්, අනුශාසනා සහ ඒ ස්වභාවයේ වෙනත් කෘති;

(ඇ) නාටකිය සහ ගීතනාටකිය කෘති;

(ඈ) ලිඛිත ස්වරූපයක් වූ හෝ නොවූ; එසේම සංගීතය අනුව ගයන වචන ද ඇතුළත් වන හෝ ඇතුළත් නොවන සංගීතමය කෘති;

(ඉ) නෘත්‍ය විද්‍යාත්මක කෘතීන් සහ අභිරංගන නාට්‍ය;

(ඊ) සිනිමා ලේඛ්‍ය, විකිරණ ධ්වනික හා ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති;

(උ) චිත්‍ර, පින්තාරු කිරීම, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, කැටයම් කිරීම, ලිතෝ මුද්‍රණය හා විචිත්‍ර ගෙත්තම් පිළිබඳ කෘති;

(ඌ) ඡායාරූප ශිල්පයට සමාන ක්‍රියාවලියක් මගින් ප්‍රකාශිත කෘතීන් ඇතුළුව, ඡායාරූප ශිල්පය පිළිබඳ කෘති;

(එ) හස්ත කර්මාන්තයක් ලෙස හෝ විශාල කර්මාන්තයක නත්ත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන ව්‍යවහාරික කලා කෘති;

(ඒ) භූගෝල විද්‍යාව, භූ ලක්ෂණ, ගෘහ නිර්මාණ ශිල්පය හෝ විද්‍යාව යන මෙවාට අදාළ සිතියම්, පිඹුරු, කවුසටහන් සහ ත්‍රිමාන කෘති.

(3) කෘතිවල ගුණය සහ ඒවා නිර්මාණය කරන ලද කාර්යය කුමක් වුව ද ඒ කෘති ආරක්ෂා කළ යුතු ය.

ව්‍යුත්පන්න කෘති.

8. (1) පහත දැක්වෙන කෘතීන් ද මුල් කෘතීන් ලෙස ආරක්ෂා කළ යුතු ය:—

(අ) ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතිවල පරිවර්තන, අනුවර්තන, සංයෝජන හා වෙනත් පරිණාමන;

(ආ) අඩංගු වන කරුණු තෝරා ගැනීම් සහ ඒවා එකලස් කිරීම හේතුකොටගෙන බුද්ධිමය නිර්මාණ බවට පත්වන විශ්ව කෝෂ සහ ගද්‍ය පද්‍ය සංග්‍රහ වැනි ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘති; සහ

(ඇ) ශ්‍රී ලංකා ජනප්‍රවාදවලින් ව්‍යුත්පන්න කෘති.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් කෘතියක් ආරක්ෂා කිරීම ඒ කෘතිය නිර්මාණය කිරීමෙහි ලා උපයෝගි කොටගත් පෙර පැවති කෘතියක් සම්බන්ධයෙන් වූ යම් ආරක්ෂාවකට හානියක් නොවන ආකාරයෙන් කළ යුතු ය.

අනාරක්ෂිත කෘති.

9. 7 වන සහ 8 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද—

(අ) අධිකරණවල සහ පරිපාලන ආයතනවල නීතිවලට සහ නිරණවලට මෙන් ම ඒවායේ නිල පරිවර්තනවලට; සහ

(ආ) ප්‍රසිද්ධ කරනු ලබන, විකාශනය කරනු ලබන හෝ වෙනත් යම් ආකාරවලින් පොදුවේ නිවේදනය කරනු ලබන දෛනික ප්‍රවෘත්තිවලට

ආරක්ෂාව ව්‍යාප්ත නොවිය යුතු ය.

ආර්ථික අයිතිවාසිකම්.

10. 12 වන වගන්තියේ සිට 16 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධානවලට යටත්ව, සම්පූර්ණ කෘතියක් හෝ එහි කොටසක් හෝ සම්බන්ධයෙන් පහත දක්වෙන ක්‍රියා කිරීමේ හෝ ඒ ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකුට බලය පැවරීමේ හෝ තනි අයිතිවාසිකම ආරක්ෂිත කෘතියක කර්තෘට තිබිය යුතු ය:—

(අ) කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම;

(ආ) කෘතියෙහි පරිවර්තනයක්, අනුවර්තනයක්, සංයෝජනයක් හෝ වෙනත් පරිණාමනයක් පිළියෙළ කිරීම;

(ඇ) රහපෑමෙන් හෝ විකාශනය කිරීමෙන් හෝ රූපවාහිනියෙන් හෝ වෙනත් යම් මාර්ගවලින් කෘතිය මහජනයා වෙත ඉදිරිපත් කිරීම.

සදාචාර අයිතිවාසිකම්.

11. (1) ආරක්ෂිත කෘතියක කර්තෘට—

(අ) විකාශනය කිරීමෙන් හෝ රූපවාහිනී මාර්ගයෙන් ප්‍රවර්තන සිද්ධින් වාර්තා කිරීමේ දී කෘතිය ප්‍රාසංගික වශයෙන් හෝ අහම්බයෙන් වාර්තාවට ඇතුළත් වූ විටක හැර, විශේෂයෙන් ම, 10 වන වගන්තියේ සඳහන් ක්‍රියාවලින් කිසිවක් සම්බන්ධයෙන් තම කර්තෘත්වය දැක්විය යුතු බවට වූ හිමිකම් පෑම් ඇතුළුව තම කෘතියෙහි කර්තෘත්වයට හිමිකම් පෑමේ;

(ආ) තම කෘතිය පිළිබඳ යම් විකෘතියක්, විච්ඡේදනයක් හෝ සෙසු වෙනසක් කිරීම හා ඒ කෘතිය සම්බන්ධයෙන් වෙන යම් අවඥාසහගත ක්‍රියාවක් කිරීම තම ගෞරවයට හෝ කීර්තියට හානිකර විය හැකි හෝ හානිකර වන අවස්ථාවක, ඒ ක්‍රියාවලට විරෝධය පෑමේ සහ ඒ සම්බන්ධයෙන් සහනය පැතීමේ

අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම් කර්තෘගේ ජීවිත කාලය තුළ සහ ඉන් ඉන්බිති අවුරුදු පනහක් ගතවන තුරු පැවතිය යුතු ය. ඔහුගේ මරණයෙන් පසු එකී අයිතිවාසිකම් ඔහුගේ උරුමක්කාරයන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි විය යුතු ය.

(2) ශාස්ත්‍රීය, කලාත්මක හා විද්‍යාත්මක කෘතිවලට විශේෂයෙන්ම පහත දැක්වෙන ඒවා ඇතුළත් විය යුතු ය:—

(අ) පොත්, පත්‍රිකා සහ වෙනත් ලියවිලි;

(ආ) දේශන, ඇමතුම්, අනුශාසනා සහ ඒ ස්වභාවයේ වෙනත් කෘති;

(ඇ) නාටකිය සහ ගීතනාටකිය කෘති;

(ඈ) ලිඛිත ස්වරූපයක් වූ හෝ නොවූ; එසේම සංගීතය අනුව ගයන වචන ද ඇතුළත් වන හෝ ඇතුළත් නොවන සංගීතමය කෘති;

(ඉ) නෘත්‍ය විද්‍යාත්මක කෘතීන් සහ අභිරංගන නාට්‍ය;

(ඊ) සිනිමා ලේඛ්‍ය, විකිරණ ධ්වනික හා ශ්‍රව්‍ය දෘශ්‍ය කෘති;

(උ) චිත්‍ර, පින්තාරු කිරීම, ගෘහ නිර්මාණ ශිල්පය, මූර්ති කලාව, කැටයම් කිරීම, ලිතෝ මුද්‍රණය හා විචිත්‍ර ගෙත්තම් පිළිබඳ කෘති;

(ඌ) ඡායාරූප ශිල්පයට සමාන ක්‍රියාවලියක් මගින් ප්‍රකාශිත කෘතීන් ඇතුළුව, ඡායාරූප ශිල්පය පිළිබඳ කෘති;

(එ) හස්ත කර්මාන්තයක් ලෙස හෝ විශාල කර්මාන්තයක තත්ත්වයෙන් නිෂ්පාදනය කරනු ලබන ව්‍යවහාරික කලා කෘති;

(ඒ) භූගෝල විද්‍යාව, භූ ලක්ෂණ, ගෘහ නිර්මාණ ශිල්පය හෝ විද්‍යාව යන මෙවාට අදාළ සිතියම්, පිඹුරු, කටුසටහන් සහ ත්‍රිමාන කෘති.

(3) කෘතිවල ගුණය සහ ඒවා නිර්මාණය කරන ලද කාර්යය කුමක් වුව ද ඒ කෘති ආරක්ෂා කළ යුතු ය.

ව්‍යුත්පන්න කෘති.

8. (1) පහත දැක්වෙන කෘතීන් ද මුල් කෘතීන් ලෙස ආරක්ෂා කළ යුතු ය:—

(අ) ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතිවල පරිවර්තන, අනුවර්තන, සංයෝජන හා වෙනත් පරිණාමන;

(ආ) අඩංගු වන කරුණු තෝරා ගැනීම සහ ඒවා එකලස් කිරීම හේතුකොටගෙන බුද්ධිමය නිර්මාණ බවට පත්වන විශ්ව කෝෂ සහ ගද්‍ය පද්‍ය සංග්‍රහ වැනි ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘති; සහ

(ඇ) ශ්‍රී ලංකා ජනප්‍රවාදවලින් ව්‍යුත්පන්න කෘති.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් කෘතියක් ආරක්ෂා කිරීම ඒ කෘතිය නිර්මාණය කිරීමෙහි ලා උපයෝගි කොටගත් පෙර පැවති කෘතියක් සම්බන්ධයෙන් වූ යම් ආරක්ෂාවකට හානියක් නොවන ආකාරයෙන් කළ යුතු ය.

අනාරක්ෂිත කෘති.

9. 7 වන සහ 8 වන වගන්තිවල විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද—

(අ) අධිකරණවල සහ පරිපාලන ආයතනවල නීතිවලට සහ තීරණවලට මෙන් ම ඒවායේ නිල පරිවර්තනවලට; සහ

(ආ) ප්‍රසිද්ධ කරනු ලබන, විකාශනය කරනු ලබන හෝ වෙනත් යම් ආකාරවලින් පොදුවේ නිවේදනය කරනු ලබන දෛනික ප්‍රවෘත්තිවලට

ආරක්ෂාව ව්‍යාප්ත නොවිය යුතු ය.

ආර්ථික අයිතිවාසිකම්.

10. 12 වන වගන්තියේ සිට 16 වන වගන්තිය දක්වා වූ වගන්තිවල විධිවිධානවලට යටත්ව, සම්පූර්ණ කෘතියක් හෝ එහි කොටසක් හෝ සම්බන්ධයෙන් පහත දක්වෙන ක්‍රියා කිරීමේ හෝ ඒ ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකුට බලය පැවරීමේ හෝ තනි අයිතිවාසිකම ආරක්ෂිත කෘතියක කර්තෘට තිබිය යුතු ය:—

(අ) කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම;

(ආ) කෘතියෙහි පරිවර්තනයක්, අනුවර්තනයක්, සංයෝජනයක් හෝ වෙනත් පරිණාමනයක් පිළියෙළ කිරීම;

(ඇ) රහපෑමෙන් හෝ විකාශනය කිරීමෙන් හෝ රූපවාහිනියෙන් හෝ වෙනත් යම් මාර්ගවලින් කෘතිය මහජනයා වෙත ඉදිරිපත් කිරීම.

සදාචාර අයිතිවාසිකම්.

11. (1) ආරක්ෂිත කෘතියක කර්තෘට—

(අ) විකාශනය කිරීමෙන් හෝ රූපවාහිනී මාර්ගයෙන් ප්‍රචර්තන සිද්ධීන් වාර්තා කිරීමේ දී කෘතිය ප්‍රාසංගික වශයෙන් හෝ අහම්බයෙන් වාර්තාවට ඇතුළත් වූ විටක හැර, විශේෂයෙන් ම, 10 වන වගන්තියේ සඳහන් ක්‍රියාවලින් කිසිවක් සම්බන්ධයෙන් තම කර්තෘත්වය දැක්විය යුතු බවට වූ හිමිකම් පෑම් ඇතුළුව තම කෘතියෙහි කර්තෘත්වයට හිමිකම් පෑමේ;

(ආ) තම කෘතිය පිළිබඳ යම් විකෘතියක්, විච්ඡේදනයක් හෝ සෙසු වෙනසක් කිරීම හා ඒ කෘතිය සම්බන්ධයෙන් වෙන යම් අවඥාසහගත ක්‍රියාවක් කිරීම තම ගෞරවයට හෝ කීර්තියට හානිකර විය හැකි හෝ හානිකර වන අවස්ථාවක, ඒ ක්‍රියාවලට විරෝධය පෑමේ සහ ඒ සම්බන්ධයෙන් සහනය පැතීමේ

අයිතිවාසිකම තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම් කර්තෘගේ ජීවිත කාලය තුළ සහ ඉන් ඉක්බිති අවුරුදු පනහක් ගතවන තුරු පැවතිය යුතු ය. ඔහුගේ මරණයෙන් පසු එකී අයිතිවාසිකම් ඔහුගේ උරුමක්කාරයන් විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි විය යුතු ය.

(3) 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් කර්තෘට හෝ ඔහුගේ උරුමක්කාරයන්ට නොමැති අවස්ථාවක වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම් ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම් අන්‍යයකුට පවරාදීම් කළ නොහැකි විය යුතු ය.

ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘති.

12. (1) ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘති සම්බන්ධයෙන් වන විට, 10 වන සහ 11(1) වන වගන්තිවල සඳහන් අයිතිවාසිකම්, සංස්කෘතිය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘතීන් මේ කොටස යටතේ සලසා තිබෙන සියලුම ක්‍රමවලින්, කාලසීමාවක් නොමැතිව, ආරක්ෂා කළ යුතු ය.

(3) විදේශගවල දී ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘතිවලින් ගනු ලබන පිටපත් හා ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘතිවල පරිවර්තන, අනුවර්තන, සංයෝජන හෝ වෙනත් පරිණාමනයන් යන මේවායින් විදේශවල දී ගනු ලබන පිටපත්, සංස්කෘතිය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අවසරය නොමැතිව, ශ්‍රී ලංකාවට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවේ බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

සාධාරණ ප්‍රයෝජනයට ගැනීම.

13. 10 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, ආරක්ෂිත කෘතියක කර්තෘගේ කැමැත්ත නොමැතිව, මුල් භාෂාවෙන් හෝ පරිවර්තනයක් වශයෙන් හෝ ඒ කෘතිය පහත සඳහන් පරිදි ප්‍රයෝජනයට ගැනීමට අවසර දිය හැකි විය යුතු ය:—

(අ) නීත්‍යනුකූලව ප්‍රසිද්ධ කරන ලද යම් කෘතියක් සම්බන්ධයෙන් වන විට—

(i) තුදෙක් එය ප්‍රයෝජනයට ගන්නා තැනැත්තාගේ ම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා එය ප්‍රතිනිෂ්පාදනය කිරීම, පරිවර්තනය කිරීම, අනුවර්තනය කිරීම, සංයෝජනය කිරීම හෝ වෙනත් ආකාරයකින් පරිණාමනය කිරීම;

(ii) ප්‍රභවය සහ කර්තෘගේ නම සඳහන් කිරීමට යටත් ව, ඒ කෘතියෙන් උපුටාගත් කොටස් තවත් කෘතියක ඇතුළත් කිරීම; එසේ වුව ද, ප්‍රවෘත්ති පත්‍ර සාරාංශ වශයෙන් ප්‍රවෘත්ති පත්‍රවලින් සහ වාර සඟරාවලින් උපුටාගත් කොටස් ඇතුළුව, ඒ කෘතියෙන් උපුටා ගත් කොටස් සාධාරණ ව්‍යවහාරයට අනුරූප විය යුතු අතර එසේ උපුටා ගත් කොටසේ ද ප්‍රමාණය එහි කාර්යය අනුව සාධාරණීය වන ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය;

(iii) ඉගැන්වීම් සඳහා ඒ කාර්යය අනුව සාධාරණීය වන ප්‍රමාණයට ප්‍රකාශනවල දී, විකාශනවල දී නැත හොත් ශ්‍රව්‍ය හෝ දෘශ්‍ය තැටිගත කිරීම් හා පටිගත

කිරීම්වල දී නිදර්ශන වශයෙන් කෘතිය උපයෝගි කර ගැනීම නැතහොත් විකාශනය කරන ලද හෝ රූපවාහිනියෙන් ප්‍රචාරය කරන ලද කෘතිය, ඉගැන්වීමේ කාර්ය සඳහා පාසැල්වල දී, අධ්‍යාපනයෙහි දී, විශ්ව විද්‍යාලවල දී සහ වෘත්තිය ප්‍රහුණු කිරීම්වල දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ඉදිරිපත් කිරීම :

එසේ වුව ද, එසේ ප්‍රයෝජනයට ගැනීම සාධාරණ ව්‍යවහාරයට අනුරූප විය යුතු අතර ප්‍රභවය සහ කර්තෘගේ නම ප්‍රකාශනයෙහි, විකාශනයෙහි, රූපවාහිනී ප්‍රචාරයෙහි හෝ තැවිගත කිරීමෙහි හෝ පටිගත කිරීමෙහි සඳහන් කළ යුතු ය;

(ආ) ප්‍රවර්තන ආර්ථික, දේශපාලන හෝ ආගමික මාතෘකා යටතේ ප්‍රවෘත්ති පත්‍රවල හෝ වාරසඟරාවල ප්‍රසිද්ධ කරනු ලබන යම් ලිපියක් සම්බන්ධයෙන් වන විට හා විකාශනය කරන ලද හෝ රූපවාහිනී මඟින් ප්‍රචාරය කරන ලද කෘතියක් සම්බන්ධයෙන් වන විට, එකී ලිපිය ප්‍රථමයෙන් ම පළ කරනු ලැබූ විට හෝ විකාශනය කරන ලද හෝ රූපවාහිනියෙන් ප්‍රචාරය කරන ලද එකී කෘතිය එසේ විකාශනය කරනු ලැබූ හෝ ප්‍රචාරය කරනු ලැබූ විට, එය එසේ ප්‍රයෝජනයට ගැනීම තහනම් කෙරෙන බවට ප්‍රකාශිත කොන්දේසියක් ද එය සමඟ ඉදිරිපත් කර නොතිබූයේ නම් හා ඒ කෘතිය එකී ආකාරයෙන් ප්‍රයෝජනයට ගනු ලැබූ විට, එහි ප්‍රභවය පැහැදිලිව පෙන්වා තිබේ නම්, ඒ ලිපිය හෝ කෘතිය ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ එය මහජනයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඇ) ඡායාරූප ශිල්පය මඟින්, සිනිමාලේඛ මඟින් හෝ මහජනයා වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ ප්‍රවර්තන සිද්ධියක් වාර්තා කිරීමේ කාර්ය සඳහා, එකී ප්‍රවර්තන සිද්ධිය සිදුවන අතරතුර දැකිය හැකි වූ හෝ ඇසිය හැකි වූ යම් කෘතියක්, නිවේදනාත්මක කාර්ය අනුව සාධාරණීය වන තාක් දුර, ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ මහජනයාට ලබාගත හැකි කරලීම ;

(ඈ) කලාත්මක කෘතීන් හා ගෘහ නිර්මාණ ශිල්පීය කෘතීන් චිත්‍රපටියක් මඟින් හෝ රූපවාහිනී මඟින් ප්‍රතිනිෂ්පාදනය කිරීම සහ එකී කෘතීන් මහජනයා විසින් දැකගත හැකි ස්ථානයක ස්ථිර වශයෙන් පිහිටා තිබේ නම් හෝ ඒවා චිත්‍රපටියට හෝ රූපවාහිනියට ඇතුළත් කරන ලද්දේ පසුබිමක් වශයෙන් පමණක් නම් හෝ දක්වන ලද අත්‍යවශ්‍ය කරුණුවලට ආනුෂංගික වශයෙන් පමණක් නම්, එසේ ප්‍රතිනිෂ්පාදිත කෘතීන් මහජනයා වෙත ඉදිරිපත් කිරීම ;

(ඉ) එවකටත් මහජනයා විසින් ලබාගත හැකි පරිදි නීත්‍යනුකූලව ඉඩ සලසා තුබූ, ශාස්ත්‍රීය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතීන්, ශ්‍රව්‍ය තැවිගත කිරීම් නැතහොත් පටිගත කිරීම් මඟින් හෝ ඡායාරූප ශිල්පය මඟින් හෝ ඒ හා සමාන ක්‍රියා

පද්ධතියක් මගින් මහජන පුස්තකාල, ලේඛන සම්පාදනය කිරීමේ වාණිජ නොවන මධ්‍යස්ථාන, විද්‍යා ආයතන සහ අධ්‍යාපන ආයතන විසින් ප්‍රතිනිෂ්පාදනය කිරීම:

එසේ වුව ද, ඒ ප්‍රතිනිෂ්පාදනය සහ සාදන ලද පිටපත් ගණන ඒවායේ කටයුතුවල අවශ්‍යතාවලට සීමා විය යුතු ය. තව ද ප්‍රතිනිෂ්පාදනය සහ සාදන ලද පිටපත් ගණන සහ කෘතියෙහි සාමාන්‍ය උපයෝගිතාව අතර ගැටුමක් නොවිය යුතු අතර ඉන් කර්තෘගේ නීත්‍යනුකූල සම්බන්ධතාවලට අයුක්තිසහගත හානියක් සිදු නොවිය යුතු ය;

(ඊ) (i) ප්‍රසිද්ධියේ කරන ලද යම් දේශපාලන කථාවක් හෝ නඩු කටයුතු පවත්වනු ලබන අතරතුර කරන ලද කථාවක්; හෝ

(ii) හුදෙක් ප්‍රවර්තන තොරතුරු දැන ගැනීමේ කාර්යයක් සඳහා පමණක් ප්‍රයෝජනයට ගත යුතු වන ප්‍රසිද්ධියේ පවත්වනු ලබන යම් දේශනයක්, ඇමතුමක්, ධර්මදේශනයක් හෝ ඒ ස්වභාවයේ ම වෙනත් කෘතියක්

ඒ කෘති එකතුවක් වශයෙන් පළ කිරීමේ අයිතිවාසිකම කර්තෘ වෙත තබා ගෙන, ඒවා ප්‍රවෘත්ති පත්‍රවල ප්‍රතිනිෂ්පාදනය කිරීම.

අවිර තැටිගත කිරීම් හා පටිගත කිරීම්.

14. 10 වන වගන්තියේ කුමක් සඳහන් වී තිබුණ ද, ගුවන් විදුලියෙන් විකාශනය කිරීමට හෝ රූපවාහිනිය මගින් ප්‍රචාරණය කිරීමට අවසර දෙනු ලබන යම් කෘතියක අවිර තැටිගත කිරීමක් හෝ පටිගත කිරීමක් එක් පිටපතකින් හෝ පිටපත් කිපයකින් සකස් කර ගැනීම ගුවන් විදුලියෙන් විකාශනය කිරීමේ හෝ රූපවාහිනිය මගින් ප්‍රචාරණය කිරීමේ යම් සංවිධානයක් විසින්, තම ගුවන් විදුලි විකාශනයේ හෝ රූපවාහිනී ප්‍රචාරණයේ කාර්යය සඳහා, ස්වකීය පහසුකම් උපයෝගී කරගෙන කළ හැකි ය. පිටපත් ලබා ගත් තැන් සිට මාස හයක් ඇතුළත නැතහොත් කර්තෘ එකඟවන ඊට වඩා දිර්ඝ කාලයක් ඇතුළත, ඒ තැටිගත කිරීම්වල හෝ පටිගත කිරීම්වල සියලුම පිටපත් විනාශ කළ යුතු ය:

එසේ වුව ද ඒ තැටිගත කිරීම හෝ පටිගත කිරීම විශේෂ ලේඛනමය ස්වභාවයක් ගත් අවස්ථාවක, 11 වන වගන්තියේ විධිවිධාන අදාළ කිරීමට හානියක් නොමැතිව, එහි එක් පිටපතක් රජයේ ලේඛනාගාරයෙහි සුරක්ෂිත කොට තැබිය හැකි ය.

පරිවර්තන අයිතිවාසිකමේ සීමාව.

15. යම් කෘතියක මූල් භාෂාවෙන් එය ප්‍රථමවරට ප්‍රසිද්ධ කරනු ලැබීමෙන් පසු අවුරුදු දහයක් ඇතුළත එය සිංහලෙන් හෝ දෙමළෙන් ප්‍රසිද්ධ කරනු ලැබ නොමැති අවස්ථාවක, 11 වන වගන්තියේ විධිවිධාන අදාළ කිරීමට හානියක් නොමැතිව, එකී කෘතිය අවස්ථානෝචිත පරිදි, සිංහලට හෝ දෙමළට පරිවර්තනය කොට, කෘතියේ ප්‍රකාශන අයිතිය පිළිබඳව හිමියාගේ අවසරය නොමැති ව වුව ද සහ ඔහුට ඒ ප්‍රකාශන අයිතිය පිළිබඳව යම් ගෙවීමක් නොකොට, ඒ පරිවර්තනය ප්‍රසිද්ධ කිරීම නීත්‍යනුකූල විය යුතු ය.

ශාබ්දික පටිගත කිරීම හා තැටිගත කිරීම් සහ විකාශනය කිරීම් පිළිබඳ අයිතිවාසිකමේ සීමාව.

16. (1) සංගීතමය කෘතියක ප්‍රකාශන අයිතියේ හිමියා විසින් කෘතියේ ගායනය හෝ වාදනය ශාබ්දික තැටිගත කිරීමක් හෝ පටිගත කිරීමක් කරන ලෙසට යම් තැනැත්තකුට බලය පවරා ඇති අවස්ථාවක, ඒ කෘතියේ ම ගායනයක් හෝ වාදනයක් ශාබ්දික තැටිගත කිරීම හෝ පටිගත කිරීම පිණිස වෙනත් යම් තැනැත්තකු හා අයිතියේ හිමියා අතර එකඟත්වයක් ඇති කරගත නොහැකි නම්, අයිතියේ හිමියාගේ අවසරය නොමැතිව ඒ වෙනත් තැනැත්තා විසින් එකී කෘතියේ ගායනයක හෝ වාදනයක අලුත් ශාබ්දික තැටිගත කිරීමක් හෝ පටිගත කිරීමක් කළ හැකි ය. එසේ වුව ද ඒ වෙනත් තැනැත්තා විසින් සංස්කෘතිය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන සාධාරණ පාරිශ්‍රමිකයක් හිමියාට ගෙවිය යුතු ය. සංගීතය හා එක්ව යන වචනවලටද ඉහත සඳහන් විධිවිධාන අදාළ විය යුතු ය.

(2) ශ්‍රී ලංකාව තුළ හා ශ්‍රී ලංකාවෙන් බැහැරව ක්‍රියාත්මක වන යම් රජයේ විකාශන හෝ රූපවාහිනී සංවිධානයක් හා එය විසින් විකාශනය කිරීමෙන් හෝ රූපවාහිනියෙන් සම්ප්‍රේෂණය කිරීමට අදහස් කරනු ලබන යම් කෘතියක ප්‍රකාශන අයිතියේ හිමියා ද අතර කෘතිය විකාශනය කළ හැකි හෝ රූපවාහිනියෙන් ප්‍රචාරය කළ හැකි හෝ වන්නේ යම් කොන්දේසි මත ද ඒ කොන්දේසි පිළිබඳ එකඟත්වයක් ඇතිකර ගත නොහැකි අවස්ථාවක, අයිතියේ හිමියාගේ අවසරය නොමැතිව වුව ද, ඒ විකාශනය රූපවාහිනී ප්‍රචාරය කිරීමට සංවිධානයට හිමිකම් තිබිය යුතු ය. එසේ වුව ද, සංස්කෘතිය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන සාධාරණ පාරිශ්‍රමිකයක් සංවිධානය විසින් හිමියාට ගෙවිය යුතු ය.

(3) (1) වන හා (2) වන උපවගන්තිවල විධිවිධාන 11 වන වගන්තියේ විධිවිධාන අදාළ කිරීමට හානියක් නොමැතිව බල පැවැත් විය යුතු ය.

(4) (1) වන හා (2) වන උපවගන්ති යටතේ පාරිශ්‍රමිකය තක්සේරු කිරීම හා ගෙවීම නියමිත ක්‍රමය හා ආකාරය අනුව කළ යුතු ය.

ප්‍රකාශන අයිතිය පිළිබඳ හිමිකම්.

17. (1) මේ කොටස යටතේ ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකම්, කෘතිය නිර්මාණය කළ කර්තෘ හෝ කර්තෘන් වෙත ප්‍රථම යෙන් ම හිමි විය යුතු ය. හවුල් කර්තෘත්වයක් ඇති කෘතියක කර්තෘවරු එකී අයිතිවාසිකම්වල සම අයිතිකරුවෝ විය යුත්තාහ.

(2) පටහැනි කරුණු ඔප්පු කර නොමැති විට, කෘතියක් ප්‍රකාශයට පත් කෙරෙනුයේ යම් තැනැත්තකුගේ නම යටතේ ද ඒ තැනැත්තා ඒ කෘතියෙහි කර්තෘ වන්නේ ය.

(3) සංස්ථාගත කළ හෝ සංස්ථාගත නො කළ යම් තැනැත්තකු උදෙසා හෝ යම් පුද්ගල මණ්ඩලයක් උදෙසා සේවා ගිවිසුමක් යටතේ කර්තෘවරයකු විසින්, තම සේවා නියුක්තිය අතරතුර, නිර්මාණය කරන ලද කෘතියක් සම්බන්ධයෙන් වන විට හෝ ඒ තැනැත්තා විසින් හෝ පුද්ගල මණ්ඩලය විසින්, කර්තෘ ලවා කරවා ගත් කෘතියක් සම්බන්ධයෙන් වන විට, එකී ගිවිසුමෙහි

පටහැනි විධිවිධාන නොමැති විට 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් සේවා යෝජක වෙත හෝ කෘතිය භාර දුන් තැනැත්තා වෙත හෝ පවරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

ප්‍රකාශක අයිතිය පැවරීම්.

18. (1) 10 වන වගන්තියෙහි සඳහන් අයිතිවාසිකම් මුළුමණින් ම හෝ එයින් කොටසක් හෝ පවරා දිය හැකි විය යුතු ය.

(2) නීතිය ක්‍රියාත්මක වීමේ දී කෙරෙන පැවරීමක් නොවන, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකමක් පිළිබඳ යම් පවරාදීමක්, පැවරුම්කරු විසින් අත්සන් කරන ලද ලියවිල්ලකින් විය යුතු ය.

(3) 10 වන වගන්තියේ සඳහන් යම් අයිතිවාසිකමක් මුළුමණින් ම පවරාදීමකට හෝ එහි කොටසක් පවරාදීමකට, එහි සඳහන් වෙනත් යම් අයිතිවාසිකම් ඇතුළත් නොවිය යුතු ය; නැතහොත් එසේ ඇතුළත් වෙතැයි නොසැලකිය යුතු ය.

(4) 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම්වලින් එකක් සම්පූර්ණයෙන් පවරාදීම සඳහා ගිවිසුමක විධිවිධාන සලස්වා තිබෙන විටක, ඒ ගිවිසුමේ විෂය පථය එහි විධිවිධාන මගින් සලස්වා තිබෙන අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට සීමා විය යුතු ය.

(5) කෘතියක එකම පිටපතෙහි හිමිකම හෝ පිටපත් එකක හෝ කීපයක හිමිකම පැවරීමෙන් කෘතියෙහි ප්‍රකාශන අයිතිය පැවරෙ නැයි විටහා නොගත යුතු ය. නැතහොත් එය පැවරෙන බවක් වැටහෙන ලෙස නොසැලකිය යුතු ය.

ආර්ථික අයිතිවාසිකම් පවත්නා කාලය.

19. (1) මේ කොටසෙහි ප්‍රකාශිතව ම අන්‍යාකාර විධිවිධාන සලස වනු ලැබ ඇත්නම් මිස, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් කර්තෘගේ ජීවිත කාලය තුළ සහ ඔහුගේ මරණින් පසු අවුරුදු පනහක් ඉකුත් වන තුරු ආරක්ෂා කළ යුතු ය.

(2) හවුල් කර්තෘත්වයෙන් යුත් කෘතියක් සම්බන්ධයෙන් වන විට, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම් අන්තිමට ජීවත්ව සිටින කර්තෘගේ ජීවිත කාලය තුළ හා ඔහුගේ මරණින් පසු අවුරුදු පනහක් ඉකුත් වන තුරු ආරක්ෂා කළ යුතු ය.

(3) නිර්නාමිකව හෝ ව්‍යාජ නාමයක් යටතේ හෝ ප්‍රසිද්ධ කරන ලද කෘතියක් සම්බන්ධයෙන් වන විට, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම්, ඒ කෘතිය නීත්‍යනුකූලව ප්‍රථමයෙන් ම ප්‍රසිද්ධ කරනු ලැබූ දින සිට අවුරුදු පනහක් ඉකුත් වන තුරු ආරක්ෂා කළ යුතු ය:

එසේ වුව ද, එකී කාල සීමාව ඉකුත් වීමට පෙර කර්තෘ හෝ කර්තෘගේ අනන්‍යතාව අනාවරණය වූ අවස්ථාවක හෝ කර්තෘ හෝ කර්තෘගේ අනන්‍යතාව පිළිබඳව තවදුරටත් සැකයක් නොමැති අවස්ථාවක, (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ විධිවිධාන අවස්ථෝචිත පරිදි අදාළ විය යුතු ය.

(4) සිනිමා ලේඛ, විකිරණ ධ්වනික හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය කෘතියක් සම්බන්ධයෙන් වන විට, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම්, කෘතිය නිර්මාණය කළ තැන් සිට අවුරුදු පනහක් ඉකුත්

වන තුරු හෝ ඒ කාල සීමාව ඇතුළත කර්තෘගේ කෘතිය මහජනයා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, එය මහජනයා වෙත ඉදිරිපත් කළ දින සිට අවුරුදු පනහක් ඉකුත් වන තුරු ආරක්ෂා කළ යුතු ය.

(5) ඡායාරූප ශිල්පීය කෘතියක් හෝ ව්‍යවහාරික කලා කෘතියක් සම්බන්ධයෙන් වන විට, 10 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම්, කෘතිය නිර්මාණය කළ තැන් සිට අවුරුදු විසි පහක් ඉකුත් වන තුරු ආරක්ෂා කළ යුතු ය.

(6) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වූ සෑම කාලසීමාවක් ම, ඒ කාලසීමාව අවසාන වන, ලිත් වර්ෂයේ අවසානය දක්වා පැවතිය යුතු ය.

ශාබ්දික තැටිගත කිරීම් හෝ පටිගත කිරීම්.

20. (1) යම් ශාබ්දික තැටිගත කිරීමක් හෝ පටිගත කිරීමක් ප්‍රතිනිෂ්පාදනය කිරීමේ හෝ ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවසර දීමේ අනන්‍ය අයිතිවාසිකම ශාබ්දික තැටිගත කිරීම හෝ පටිගත කිරීම ප්‍රථමයෙන් ම ප්‍රසිද්ධ කළ තැන් සිට අවුරුදු පනහක කාලසීමාවක් ඉකුත් වන තුරු ශාබ්දික තැටිගත කිරීමේ හෝ පටිගත කිරීමේ නිත්‍යානුකූල නිර්මාතෘවරයා සතු විය යුතු ය.

(2) මෙහි 14 වන, 18 වන, 19(6) වන සහ 21 වන වගන්තිවල විධිවිධාන ශාබ්දික තැටිගත කිරීම්වලට සහ පටිගත කිරීම්වලට අදාළ විය යුතු ය.

උල්ලංඝනය කිරීම් සහ දණ්ඩන.

21. (1) මේ කොටස යටතේ ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකම් අතුරින් කිසිවක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් එසේ ඒ උල්ලංඝනය දිගටම කරනු ලැබීම ඉන්ජන්ක්ෂන් තහනමක් මගින් වළක්වා ලිය හැකි අතර ඔහු අලාභ ගෙවීමට ද යටත් කරනු ලැබිය හැකි ය.

(2) උල්ලංඝනය කිරීම්වලට අදාළ XXXII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ කොටස යටතේ ආරක්ෂා කරනු ලබන අයිතිවාසිකම්වලට අදාළ විය යුතු ය.

පනත අදාළ වන ක්ෂේත්‍ර.

22. මේ කොටස,—

(අ) ශ්‍රී ලංකා ජාතිකයන් වූ හෝ සිරිතක් වශයෙන් ශ්‍රී ලංකාව ස්වකීය වාසස්ථානය කොට ගෙන ඇති කර්තෘන්ගේ කෘතිවලට;

(ආ) කර්තෘන්ගේ ජාතිකත්වය සහ පදිංචිය කුමක් වුව ද, ප්‍රථම යෙන් ම ශ්‍රී ලංකාව තුළ ප්‍රසිද්ධ කරන ලද කෘතීන්ට; සහ

(ඇ) ශ්‍රී ලංකාව බැඳී සිටින ගිවිසුම් අනුව, ආරක්ෂා කළ යුතු සියලුම කෘතීන්ට මෙන් ම ශ්‍රී ලංකා ජනප්‍රවාද කෘතීන්ට

අදාළ විය යුතු ය.

පොදු නීතියේ අයිතිවාසිකම් අහෝසි කිරීම.

23. කිසිම ප්‍රකාශන අයිතියක් හෝ ප්‍රකාශන අයිතියක ස්වභාවයේ වූ අයිතිවාසිකමක් මේ කොටස ප්‍රකාර හෝ ඒ වෙනුවට පනවන ලද වෙනත් යම් ප්‍රඥප්තියක් ප්‍රකාර මිස අන් ලෙසකින් නොපැවතිය යුතු ය.

වෙනත් නීති යටතේ ඇති අයිතිවාසිකම්.

24. මින් පෙර පොදු නීතිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ අත්කර ගන්නා ලද අයිතිවාසිකම් කිසිවකට මේ කොටසේ විධිවිධාන බල නොපැවැත්විය යුතු ය.

III වන කොටස

කාර්මික සැලසුම්

III වන පරිච්ඡේදය

මේ කොටසේ විෂය පථය සහ අර්ථකථන

මේ පනතෙහි විෂය පථය.

25. මේ කොටස යටතේ සලසා ඇති කාර්මික සැලසුම් ආරක්ෂා කිරීම, වෙනත් යම් නීතියක් යටතේ සහ විශේෂයෙන් ම මේ නීති සංග්‍රහයේ II වන කොටස යටතේ සලසා ඇති වෙනත් යම් ආරක්ෂාවක් හිත කිරීමක් වශයෙන් නොව, ඒවාට අතිරේකව විය යුතු ය.

ආරක්ෂාව පිළිබඳ කොන්දේසි.

26. මේ කොටස යටතේ සලසා ඇති ආරක්ෂාව—

(1) නව කාර්මික සැලසුම්වලට පමණක් අදාළ විය යුතු ය.

(2) යම් ගර්හනීය සැලසුමකින් සමන්විත වන්නා වූ හෝ සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි වන්නා වූ හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ අධිකරණයේ හෝ මතය අනුව, යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් පැරවීමට ඉඩ ඇති කාර්මික සැලසුමකට අදාළ නොවිය යුතු ය.

කාර්මික සැලසුම යන්නෙහි අර්ථ කථනය.

27. මේ කොටසෙහි කාර්ය සඳහා, කාර්මික හෝ හස්ත කර්මාන්තජ නිෂ්පාදනයකට විශේෂ පෙනුමක් ගෙන දෙන සහ කාර්මික හෝ හස්ත කර්මාන්තජ නිෂ්පාදනයකට මෝස්තරයක් ලෙස උපයෝගී කර ගත හැකි යම් රේඛා පිළිබඳ හෝ වර්ණ පිළිබඳ සංයෝජනයක් නැතහොත් රේඛා හෝ වර්ණ ආශ්‍රිත වූ හෝ නොවූ යම් ත්‍රිමාන ආකෘතියක් කාර්මික සැලසුමක් ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, හුදෙක් තාක්ෂණික ප්‍රතිඵල ලබා ගැනීමෙහි ලා උපයෝගී වන කාර්මික සැලසුමක ඇති කිසිවක් මේ කොටස යටතේ ආරක්ෂා නොකළ යුතු ය.

නවතාව යන්නෙහි අර්ථ කථනය.

28. (1) මේ කොටසේ කාර්ය සඳහා, අලුත් කාර්මික සැලසුමක් යන්නෙන් ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ දිනයට පෙර හෝ ඒ සම්බන්ධයෙන් යථා පරිදි හිමිකම් දැක් වූ ප්‍රමුඛත්ව දිනයට පෙර හෝ විස්තරයක මාර්ගයෙන්, භාවිතයෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් කිසිම ස්ථානයක දී කවර වූ හෝ යම් වේලාවක දී මහජනයා වෙත ඉදිරිපත් කරනු නොලැබූ කාර්මික සැලසුමක් අදහස් වේ.

(2) ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමට පෙරාතුව වූ මාස හයක කාල සීමාව ඇතුළත යම් කාර්මික සැලසුමක් නිලමය හෝ නිල වශයෙන් සම්මත අන්තර්ජාතික ප්‍රදර්ශනයකට තැබීම පමණක් හේතුකොටගෙන එය මහජනයා වෙත ඉදිරිපත් කරනු ලැබූ ලෙස නොසැලකිය යුතු ය.

(3) හුදෙක් කාර්මික සැලසුමක් පෙර පැවති කාර්මික සැලසුමකට සුළු වශයෙන් වෙනස් වීම පමණක් හේතුකොටගෙන හෝ එය පෙර පැවති කාර්මික සැලසුම හා සම්බන්ධ නිෂ්පාදනයකට වෙනස් වූ නිෂ්පාදනයක් හා සම්බන්ධ වීම පමණක් හේතුකොටගෙන ඒ කාර්මික සැලසුම අලුත් කාර්මික සැලසුමක් ලෙස නොසැලකිය යුතු ය.

IV වන පරිච්ඡේදය

කාර්මික සැලසුමක් ආරක්ෂා කිරීමට ඇති අයිතිවාසිකම

කාර්මික සැලසුමක සීමාකම සහ එය ආරක්ෂා කර ගැනීමට ඇති අයිති වාසිකම.

29. (1) කාර්මික සැලසුමක ආරක්ෂාව ලබා ගැනීමේ අයිතිවාසිකම ඒ කාර්මික සැලසුමේ හිමියාට අයිති ය.

(2) 31 වන වගන්තියට යටත්ව, කාර්මික සැලැස්මක හිමියා වන්නේ, ඒ කාර්මික සැලැස්මේ නිර්මාතෘවරයා හෝ ඔහුගේ අයිති යට අනුප්‍රාප්තිකයා ය.

(3) තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු විසින් කාර්මික සැලසුමක් හවුලේ නිර්මාණය කරනු ලැබ ඇති අවස්ථාවක, ආරක්ෂාව ලැබීමේ අයිතිවාසිකම ඔවුන්ට හවුලේ අයිති විය යුතු ය:

එසේ වුව ද, හුදෙක් කාර්මික සැලසුමක් නිර්මාණය කිරීමෙහි ලා පමණක් සහාය වී ඇති එහෙත් නිර්මාණාත්මක ස්වභාවයකින් යුක්ත කිසිවක් කර නොමැති තැනැත්තකු ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා ලෙස හෝ සහනිර්මාතෘවරයා ලෙස හෝ නොසැලකිය යුතු ය.

(4) 30 වන හා 31 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත්‍රයක් ප්‍රථම යෙන් ම ඉදිරිපත් කළ තැනැත්තා හෝ තම ඉල්ලුම් පත්‍රය සඳහා මුල්ම ප්‍රමුඛත්වයට ප්‍රථමයෙන්ම යථා පරිදි හිමිකම් දක්වන තැනැත්තා ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා ලෙස සැලකිය යුතු ය.

පැහැර ගැනීම ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචි කිරීම අධිකරණය විසින් පැවරීම.

30. ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට විෂයය වූ කාර්මික සැලසුමක අත්‍යවශ්‍ය මූලාංග, වෙනත් තැනැත්තකුට ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම අයිතිව ඇති කාර්මික සැලසුමකින් නීති විරෝධී ලෙස ලබා ගෙන ඇති අවස්ථාවක, ඒ වෙනත් තැනැත්තා විසින් එකී ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචි කිරීම තමා වෙත පවරන ලෙසට ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය:

එසේ වුව ද, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු, ආරක්ෂා කිරීමේ අයිතිවාසිකම අයිති තැනැත්තා විසින් තම කැමැත්ත එකී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළ කරනු ලබන අවස්ථාවක, ඒ කැමැත්ත ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සියලු කාර්යයන් සඳහා බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

සේවා නියුක්තයකු විසින් හෝ භාරදීමක් අනුව හෝ නිර්මාණය කරන ලද කාර්මික සැලසුමක්.

31. (1) යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ යම් වැඩක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමක හෝ පටහැනිව යම් විධිවිධානයක් නොමැති විටක, ඒ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීමේ දී නිර්මාණය කරනු ලබන කාර්මික සැලසුමක නිමිකම, අවස්ථාවෝචිත පරිදි, සේවායෝජකට හෝ ඒ වැඩය භාර දුන් තැනැත්තාට හෝ උපචිත වෙතැයි සැලකිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, සේවා නියුක්ති ගිවිසුමට හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමට හෝ ඇතුළත් වූ අවස්ථාවේ දී, පාර්ශ්වකරුවනට කල්තියා සාධාරණව දැන ගැනීමට හැකි වූ ආර්ථික වටිනාකමට වැඩි ආර්ථික වටිනාකමක් කාර්මික සැලසුමට ඇතිවන අවස්ථාවක, පාර්ශ්වකරුවන් අතර පාරිශ්‍රමික යක් පිළිබඳ එකඟත්වයක් නොමැති නම්, අධිකරණය විසින් නියම කරනු ලබන සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට නිර්මාතෘවරයාට හිමිකම ලැබිය යුතු ය.

(2) යම් සේවා නියුක්තයකුට ඔහුගේ සේවා නියුක්ති ගිවිසුමෙන් නිර්මාණාත්මක කාර්යයක යෙදීමට නියම කර නොමැති විටක, ඒ සේවා නියුක්තයා විසින් උපයෝගී කර ගනු ලැබීම සඳහා සේවා යෝජක විසින් ඔහුට සපයන ලද දත්ත හෝ උපක්‍රම උපයෝගී කොට ගෙන, ඔහුගේ සේවායෝජකගේ කාර්ය ක්ෂේත්‍රයෙහි දී ඔහු විසින් කාර්මික සැලසුමක් නිර්මාණය කරනු ලබන අවස්ථාවක, සේවා නියුක්ති ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති නම්, ඒ කාර්මික සැලසුමෙහි හිමිකම සේවායෝජකට උපචිත වෙතැයි සැලකිය යුතු ය:

එසේ වුව ද, සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට සේවා නියුක්තයා හිමිකම ලැබිය යුතු අතර පාරිශ්‍රමිකය පිළිබඳව පාර්ශ්වකරුවන් අතර එකඟත්වයක් නොමැති විටක, ඔහුගේ පක්ෂයේ, කාර්මික සැලසුමෙහි ආර්ථික වටිනාකම සහ එයින් සේවායෝජක ලබන යම් ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, අධිකරණය විසින් ඒ පාරිශ්‍රමිකය නියම කළ හැකි ය.

(3) කාර්මික සැලසුමක නිර්මාතෘවරයා වෙත (1) වන සහ (2) වන උපවගන්තිවලින් පවරා ඇති අයිතිවාසිකම් ගිවිසුමක් මගින් සීමා නොකළ යුතු ය.

කාර්මික සැලසුමක නිර්මාතෘවරයා නම් කරනු ලැබීම.

32. (1) යම් කාර්මික සැලසුමක නිර්මාතෘවරයා විසින් ඒ නිර්මාතෘවරයා වශයෙන් ලියාපදිංචියෙහි තමා නම් කරනු ලැබීමට තමා එකඟ නොමැති බව ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ අත්සන් කරනු ලැබ, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ප්‍රකාශයකින් දන්වනු ලැබුවහොත් හැර, ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා එහි නිර්මාතෘවරයා වශයෙන් ලියාපදිංචියෙහි නම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යම් ගිවිසුමක නියමයන් මගින් වෙනස් කරනු නොලැබිය යුතු ය.

V වන පරිච්ඡේදය

ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ ලියාපදිංචි කිරීමේ කාර්ය පටිපාටිය

ඉල්ලුම් පත්‍රයකට අදාළ අවශ්‍ය කරුණු.

33. (1) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තවද එහි පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය:—

(අ) කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක්;

(ආ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය හා විස්තරය සහ ඉල්ලුම්කරු වාසය කරන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත නම්, ලිපි භාරදීම සඳහා ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනයක්;

(ඇ) කාර්මික සැලසුම අඩංගු භාණ්ඩයෙහි ආදර්ශයක් සහ කාර්මික සැලසුම වර්ණයෙන් වන අවස්ථාවක, එහි ඡායාරූප හෝ ප්‍රස්තාරික නිරූපනයක වර්ණයෙන් වූ පිටපත් සහ සැලසුමෙහි චිත්‍ර සහ අනුරේඛන;

(ඈ) කාර්මික සැලසුම භාවිත කරනු ලබන්නේ කුමන වර්ගයෙන නිෂ්පාදිත සඳහා ද යන්න පිළිබඳ සංඥුවක් හා වර්ගීකරණය සඳහා නියෝග මගින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක ඒ නිෂ්පාදිත ඇතුළත් කෙරෙන පන්තිය හෝ පන්ති පිළිබඳ සංඥුවක්;

(ඉ) තම උපරිම දැනුම අනුව කාර්මික සැලසුම අලුත් කාර්මික සැලසුමක් බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක්.

(2) කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා විසින් තමාගේ නම හා ලිපිනය සඳහන් කරමින් සහ තමා ඒ කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා බවට ලියාපදිංචියෙහි සඳහන් කරන ලෙස ඉල්ලීමක් ද කරමින් අත්සන් කරන ලද ප්‍රකාශයක් ලියාපදිංචිය සඳහා වූ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ හැකි ය.

(3) ඉල්ලුම්කරු කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා නොවන අවස්ථාවක, ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරුට ඇති අයිතිවාසිකම් යුක්තිසහගත බව පෙන්වන ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා විසින් (3) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශයෙහි පිටපතක් කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා වෙත යවනු ලැබිය යුතු අතර ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බැලීමේ ද, නියමිත ගාස්තුව ගෙවා එහි පිටපතක් ලබා ගැනීමේ ද අයිතිවාසිකම් ඒ නිර්මාතෘවරයාට තිබිය යුතු ය.

(5) ඉල්ලුම් පත්‍රය අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිතයාට ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් ඒ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුවද ඉල්ලුම්කරුගේ අත්සන නීත්‍යානුකූල කිරීමක් හෝ සහතික කිරීමක් අවශ්‍ය නොවන්නේ ය.

(6) එකම පන්තියට හෝ වර්ගයට අයත් වේ නම්, පනහකට නොවැඩි කවර හෝ කාර්මික සැලසුම් සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි ය.

ප්‍රමුඛත්ව අයිතිවාසිකම්.

34. සම්මුති රටක දී කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඇති ප්‍රමුඛත්වය තමන්ට ලබා ගැනීමට අපේක්ෂා කරන, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරුවන්ගෙන් විසින්, කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ දිනයෙහි සිට මාස හයක් ඇතුළත, කලින් වූ ඉල්ලුම්පත්‍රයෙහි දිනය හා අංකය ද, ඉල්ලුම්කරුගේ නම සහ ඔහු විසින් හෝ කලින් අයිතිකරු විසින් හෝ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ රට ද දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් තම ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතු ය. තව ද, ශ්‍රී ලංකාවේ දී පසුව ඉදිරිපත් කළ ඉල්ලුම්පත්‍රයෙහි දින සිට මාස තුනක් වූ කාල සීමාවක් ඇතුළත, කලින් වූ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන ලද රටෙහි නිසි බලධරයා විසින් නිවැරදි බවට සහතික කරන ලද ඒ කලින් වූ ඉල්ලුම්පත්‍රයෙහි පිටපතක් ඒ ඉල්ලුම්කරුගෙන් විසින් සැපයිය යුතු ය.

ඉල්ලුම්පත්‍ර ඇස්තු.

35. කාර්මික සැලැස්මක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක්, නියමිත ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවා ඇතහොත් මිස, භාර නොගත යුතු ය.

ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කිරීම්.

36. (1) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය (26(2) වන, 33 වන සහ 34 වන වගන්ති අදාළ වන අවස්ථාවල දී) එකී 26(2) වන, 33 වන සහ 34 වන වගන්තිවලට සහ 35 වන වගන්තියට අනුකූල වන්නේ දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් පරීක්ෂා කළ යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය 26(2) වන, 33 වන සහ 35 වන වගන්තිවලට අනුකූල නොවන අවස්ථාවක දී, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය:

එසේ වුව ද, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම් පත්‍රයෙහි ඇති යම් දෝෂයක් ගැන ප්‍රථමයෙන් ඉල්ලුම්කරු වෙත නිවේදනය කළ යුතු අතර, ඒ නිවේදනය ලැබූ දින සිට මාස තුනක් ඇතුළත ඒ දෝෂය නිදොස් කිරීම සඳහා අවස්ථාවක් ඉල්ලුම්කරුට සලසා දිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රය 34 වන වගන්තියට අනුකූල නොවන අවස්ථාවක දී, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, හිමිකම් පෑ ප්‍රමුඛත්වය පිළිබඳව යම් සඳහන් කිරීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නොකළ යුතු ය.

(4) ඉල්ලුම් පත්‍රය 34 වන වගන්තියට අනුකූල වන අවස්ථාවක දී, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, හිමිකම් පෑ ප්‍රමුඛත්වය පිළිබඳව සටහනක් රෙජිස්ට්‍රාර්වරයා විසින් කළ යුතු ය.

(5) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී, ඔහුගේ තීරණයට හේතු ලියවිල්ලකින් සඳහන් කරන ලෙස ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් එසේ කළ යුතු ය.

ලියාපදිංචි කිරීම.

37. ඉල්ලුම් පත්‍රය 26 (2) වන, 33 වන සහ 35 වන වගන්තිවලට අනුකූල වන අවස්ථාවකදී, 26 (1) වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තුබුණ ද, තවදුරටත් පරීක්ෂා කිරීමක් නොකර, කාර්මික සැලසුම ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

38. කාර්මික සැලසුමක් ලියාපදිංචි කරනු ලැබූ විට රෙජිස්ට්‍රාර් වරයා විසින් එහි ලියාපදිංචි හිමියාට ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කළ යුතු අතර, ලියාපදිංචි හිමියා ඉල්ලා සිටියහොත්, ඒ සහතිකය අන්තිමට ශ්‍රී ලංකාවේ සටහන් කරනු ලැබූ ඔහුගේ තැපැල් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාරදීම සඳහා අන්තිමට සටහන් කරගනු ලැබූ ඔහුගේ තැපැල් ලිපිනයට ඒ සහතිකය රෙජිස්ට්‍රාර්වරයා විසින් යැවිය යුතු ය.

කාර්මික සැලසුම් ලේඛනය.

39. (1) කාර්මික සැලසුම් ලේඛනය යනුවෙන් හඳුන්වනු ලබන ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් නබා ගෙන, පවත්වා ගෙන යා යුතු අතර ලියාපදිංචි කිරීමේ අනුපිළිවෙළ අනුව, සියලුම ලියාපදිංචි කරන ලද කාර්මික සැලසුම් සහ සටහන් කොට තැබීමට මේ කොටසින් බලය දී හෝ විධාන කර හෝ නිබෙන්නා වූ හෝ කලින් කල නියම කරනු ලබන්නා වූ ද කාර්මික සැලසුම්වලට අදාළ වන්නා වූ ද වෙනත් විස්තර එහි සටහන් කරනු ලැබිය යුතු ය.

(2) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීමට කාර්මික සැලසුම් නිරූපණයක් ඇතුළත් විය යුතු අතර, එහි අංකය ද, ලියාපදිංචි හිමියාගේ නම සහ ලිපිනය ද, ලියාපදිංචි හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාරදීම සඳහා තැපැල් ලිපිනයක් ද ඉල්ලුම් කරනු ලැබූ සහ ලියාපදිංචි කරනු ලැබූ දින ද, ප්‍රමුඛත්වය සඳහා විධිමත් ලෙස හිමිකම් පානු ලැබිණි නම්, ඒ බව පෙන්නුම් කිරීමක් ද, ප්‍රමුඛත්වය සඳහා හිමිකම් පෑම ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ අංකය, දිනය සහ ඒ ඉල්ලීම ඉදිරිපත් කළ රට ද, 33 (1) (ඈ) වන වගන්තියේ සඳහන් නිෂ්පාදිතවල වර්ග සහ පන්ති ද, තමා කාර්මික සැලසුමේ නිර්මාතෘවරයා බව ලියාපදිංචි කිරීමේ සඳහන් කරනු ලබන ලෙස ඔහු විසින් ඉල්ලා සිටිනු ලැබ තිබුණහොත්, කාර්මික සැලසුමේ නිර්මාතෘවරයාගේ නම සහ ලිපිනය ද ලියාපදිංචි කිරීමේ සටහන් කළ යුතු ය.

ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික පිටපත්.

40. ඕනෑම තැනැත්තකු විසින් ලේඛනය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, නියමිත ගාස්තුව ගෙවා, එහි සහතික පිටපත් ලබා ගත හැකි ය.

ලියාපදිංචි කාර්මික සැලසුම් පළ කිරීම.

41. ලියාපදිංචි කිරීමේ අනුපිළිවෙළ අනුව, සියලුම ලියාපදිංචි කාර්මික සැලසුම්, නියමිත ආකෘතියක ලා ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සලස්වනු ලැබිය යුතු ය. තව ද, එසේ පළ කරනු ලබන එක් එක් කාර්මික සැලසුම් සම්බන්ධයෙන්, නියම කරනු ලැබූ විස්තර පිළිබඳ සඳහනක් ද ඒ සමඟ පළ කරනු ලැබිය යුතු ය.

VI වන පරිච්ඡේදය

ලියාපදිංචිය පවත්නා කාලය

ලියාපදිංචිය පවත්නා කාලය.

42. මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඊට හානියක් නොමැතිව, කාර්මික සැලසුමක ලියාපදිංචිය, එසේ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ලැබුණු දිනයේ සිට අවුරුදු පහකට පසු, අවසාන විය යුතු ය.

අලුත් කිරීම.

43. (1) කාර්මික සැලසුමක ලියාපදිංචිය, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, එකක් අවුරුදු පහක් වූ අනුගාමී කාලසීමා දෙකකට අලුත් කරනු ලැබිය හැකි ය.

(2) අලුත් කිරීමේ ගාස්තුව ලියාපදිංචි කාලසීමාව අවසාන වන දිනයට ඉහතින් ම වූ මාස දොළහ ඇතුළත ගෙවිය යුතු ය:

එසේ වුව ද, නියම කරනු ලබන අයිගාස්තුවක් ගෙවන ලද විට, ඒ ලියාපදිංචි කාල සීමාව අවසාන වන දිනයෙන් පසු ගාස්තුව ගෙවීම පිණිස මාස හයක අනුග්‍රහ කාලසීමාවක් සඳහා ඉඩ දෙනු ලැබිය යුතු ය.

(3) ලියාපදිංචිය පිළිබඳ සියලුම අලුත් කිරීම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු අතර, ඒවා නියමිත ආකෘතියෙහි ලා ගැසට් පත්‍රයේ පළ කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(4) අලුත් කිරීමේ ගාස්තුව (2) වන උපවගන්තියේ සඳහන් කාලසීමාව ඇතුළත දී හෝ දීර්ඝ කරනු ලැබූ කාල සීමාව ඇතුළත දී හෝ ගෙවනු නොලැබූ අවස්ථාවක දී, රෙජිස්ට්‍රාර්වරයා විසින් කාර්මික සැලසුමේ ලියාපදිංචිය ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

VII වන පරිච්ඡේදය

කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්

කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්.

44. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියාට ඒ කාර්මික සැලැස්ම සම්බන්ධයෙන් පහත දැක්වෙන අනන්‍ය අයිතිවාසිකම් තිබිය යුතු ය:—

(අ) නිෂ්පාදිතයක් තැනීමේ දී ඒ කාර්මික සැලසුම් නැවත යෙදීමට සහ අඩංගු කිරීමට;

(ආ) ඒ කාර්මික සැලසුම් අඩංගු නිෂ්පාදිතයක්, ආනයනය කිරීමට, විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට, විකිණීමට හෝ පාවිච්චි කිරීමට;

(ඇ) ඒ කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතයක් විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ, විකිණීමේ හෝ පාවිච්චි කිරීමේ කාර්යය සඳහා රැස් කර තබා ගැනීමට;

(ඈ) කාර්මික සැලසුමේ ලියාපදිංචිය පැවරීමට හෝ අන්සතු කිරීමට;

(ඉ) අවසර ගිවිසුම්වලට ඇතුළත්වීමට.

(2) කාර්මික සැලසුමේ ලියාපදිංචි හිමියාගේ කැමැත්ත නොමැතිව, කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය.

(3) බලය නොලැබූ යම් තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා කරනු ලැබුවහොත්, නැවත යෙදූ ලියාපදිංචි කාර්මික සැලසුම ලියාපදිංචි කාර්මික සැලසුමට වඩා සුළු වශයෙන් වෙනස් වීමේ හෝ නැවත යෙදූ ලියාපදිංචි කාර්මික සැලසුම, ලියාපදිංචි කාර්මික සැලසුම අඩංගු වූ නිෂ්පාදිතයට වෙනස් වූ නිෂ්පාදන වර්ගයක අඩංගු වීමේ හෝ හේතුව නිසාම පමණක් ඒ ක්‍රියා නීත්‍යනුකූල නොවිය යුතු ය.

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් සීමා කිරීම.

45. (1) 44 (1) වන වගන්තියේ විධිවිධාන කාර්මික හෝ වාණිජ කාර්ය සඳහා කරනු ලැබූ ක්‍රියාවලට පමණක් ව්‍යාප්ත විය යුතු ය.

(2) ලියාපදිංචි කාර්මික සැලසුම අඩංගු නිෂ්පාදිතයක් නීත්‍යනුකූල ව සාදනු ලැබීමෙන්, ආනයනය කරනු ලැබීමෙන්, විකිණීමට ඉදිරිපත් කරනු ලැබීමෙන්, විකුණනු ලැබීමෙන්, පාවිච්චි කරනු ලැබීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රැස්කර තබනු ලැබීමෙන් පසු, බාහිර පාර්ශ්වකරුවන් විසින් එකී නිෂ්පාදිතය සම්බන්ධයෙන් ඒ විධිවිධානවල සඳහන් යම් ක්‍රියාවක් කරනු ලැබීම 44 (1) වන වගන්තියේ විධිවිධාන මගින් වළක්වනු නොලැබිය යුතු ය.

VIII වන පරිච්ඡේදය

ඉල්ලුම් පත්‍ර හා ලියාපදිංචි කිරීම් පැවරීම සහ අන්සතු කිරීම

ඉල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම්, පැවරීම් සහ අන්සතු කිරීම්.

46. (1) කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ කාර්මික සැලසුමක ලියාපදිංචිය හෝ පැවරීම හෝ අන්සතු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) පැවරීමක් හෝ අන්සතු කිරීමක් හෝ නිසා කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට හෝ කාර්මික සැලසුමක් පිළිබඳ ලියාපදිංචියකට හිමිකම ලබන යම් තැනැත්තකු විසින් පැවරීම හෝ අන්සතු කිරීම ලේඛනයේ සටහන් කරන ලෙස නියමිත ආකාරයෙන් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි කිසිම පැවරීමක් හෝ අන්සතු කිරීමක්—

(අ) නියමිත ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයාට ගෙවා ඇතහොත් මිස;

(ආ) පැවරීමක් සම්බන්ධයෙන් වන විට, ගිවිසුම් පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් එය තිබුණහොත් මිස,

ලේඛනයේ සටහන් කරනු නොලැබිය යුතු ය.

(4) එවැනි කිසිම පැවරීමක් හෝ අන්සතු කිරීමක් ලේඛනයේ එසේ සටහන් කරනු ලැබුවහොත් මිස, බාහිර පාර්ශ්වකරුවන් විෂයයෙහි බල නොපැවැත්විය යුතු ය.

ඉල්ලුම් පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පිළිබඳ හවුල් හිමිකම්.

47. පාර්ශ්වකරුවන් අතර යම් පටහැනි එකඟවීමක් නොමැති විටක, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ කාර්මික සැලසුමක් පිළිබඳ ලියාපදිංචියක හවුල් හිමියන් විසින් වෙන් වෙන් වශයෙන්, ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය පිළිබඳ ඔවුන්ගේ අයිතිවාසිකම් පැවරීම් හෝ අන්සතු කිරීම ද කාර්මික සැලසුම පාවිච්චි කිරීම ද 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් අනන්‍ය අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි නමුත් ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගැනීම ද, ලියාපදිංචිය අත්හැරීම ද අවසර ගිවිසුමකට එළඹීම ද හවුලේ පමණක් කරනු ලැබිය හැකි ය.

IX වන පරිච්ඡේදය

අවසර ගිවිසුම්

අර්ථ නිරූපණය.

48. මේ කොටසේ කාර්ය සඳහා, අවසර ගිවිසුමක් යන්නෙන්, 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් හෝ සියලුම ක්‍රියා හෝ කිරීම සඳහා කාර්මික සැලසුමක ලියාපංදිචි හිමියකු ("අවසරදායී") විසින් වෙනත් තැනැත්තකුට හෝ ව්‍යවසායකට ("අවසරලාභී") අවසරයක් ප්‍රදානය කරනු ලබන්නේ යම් ගිවිසුමක් මත ද, ඒ ගිවිසුම් අදහස් වේ.

අවසර ගිවිසුමේ ආකෘතිය සහ ඒ ගැන සටහන් කිරීම්.

49. (1) අවසර ගිවිසුමක්, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් විය යුතු ය.

(2) ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරනු ලැබූ ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින ලද කල්හි, ලේඛනයේ සටහන් කරනු ලැබීමට ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය ගිවිසුමට අදාළ විස්තර, නියමිත ගාස්තුව ගෙවන ලද විට, රෙජිස්ට්‍රාර් වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු ය:

එසේ වුව ද, එකී ගිවිසුමට අදාළවන්නා වූ වෙනත් යම් විස්තර හෙළිදරව් කිරීමට හෝ සටහන් කරනු ලැබීමට හෝ පාර්ශ්වකරුවන්ට නියම කරනු නොලැබිය යුතු ය.

අවසරලාභී සතු අයිතිවාසිකම්.

50. (1) අවසර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට,—

(අ) කාර්මික සැලසුමේ ලියාපදිංචි සම්පූර්ණ කාලසීමාව තුළ, අළුත් කිරීම් ඇතුළුව කාර්මික සැලසුම් උපයෝගී කර ගැනීම මගින්, 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් සියලුම ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකාවේ සම්පූර්ණ භූගෝලීය ප්‍රදේශය ඇතුළත කිරීමට අවසරලාභියාට හිමිකම් තිබිය යුතු ය;

(ආ) අවසර ගිවිසුම යටතේ වූ තමාගේ අයිතිවාසිකම් පැවරීමට හෝ අන්සතු කිරීමට හෝ තෘතීය පාර්ශ්වකරුවන්ට අතුරු අවසරදීම ප්‍රදානය කිරීමට හෝ අවසරලාභියාට හිමිකම් නොතිබිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පැවරීම්වලට සහ අතුරු අවසරදීම්වලට අදාළ විය යුතු ය.

අවසරදායීගේ අයිතිවාසිකම්.

51. (1) අවසර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට, අවසරදායී විසින් එකම කාර්මික සැලසුමක් සම්බන්ධයෙන්, තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසර දීම් ප්‍රදානය කිරීම හෝ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් හෝ සියලුම ක්‍රියා තමා විසින්ම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) අවසරය අනන්‍ය අවසරයක් බවට අවසර ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක සහ අවසරදායී විසින් එකම කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසරදීම් ප්‍රදානය කරනු ලැබීම සඳහා හෝ 44 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් යම් ක්‍රියාවක් අවසරදායී විසින්ම කරනු ලැබීම සඳහා, ඒ ගිවිසුමේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැති නම් මිස, අවසරදායී විසින් එසේ තෘතීය පාර්ශ්වකරුවන්ට අවසර දීම් ප්‍රදානය කිරීම හෝ ඒ ඡේදවල සඳහන් ක්‍රියා කිරීම හෝ නොකළ යුතු ය.

අවසර ගිවිසුම්වල නිර්බල වගන්ති.

52. කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියා වෙත මේ කොටසින් පවරා ඇති අයිතිවාසිකම්වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම් අවසර ගිවිසුමක යම් වගන්තියකින් හෝ කොන්දේසියකින් කාර්මික හෝ වාණිජ ක්ෂේත්‍රයෙහි ලා, අවසරලාභි වෙත පනවනු ලබන තාක් දුරට, ඒ අවසර ගිවිසුමේ ඒ වගන්තිය හෝ කොන්දේසිය බලරහිත සහ ශූන්‍ය විය යුතු ය:

එසේ වුවද—

(අ) කාර්මික සැලසුම පාවිච්චි කිරීමේ විෂය පථය, ප්‍රමාණය හෝ කාලය සම්බන්ධයෙන් වූ සීමාකිරීම් හෝ කාර්මික සැලසුම පාවිච්චි කරනු ලැබිය හැකි භූගෝලීය ප්‍රදේශය පිළිබඳ සීමා කිරීම් හෝ කාර්මික සැලසුම පාවිච්චි කරනු ලැබිය හැක්කේ යම් නිෂ්පාදිත සම්බන්ධයෙන් ද, ඒ නිෂ්පාදිතවල තත්ත්වය හෝ ප්‍රමාණය පිළිබඳ සීමාකිරීම්; සහ

(ආ) කාර්මික සැලසුමේ ලියාපදිංචිය පිළිබඳ වලංගුභාවයට හානි කර විය හැකි සියලුම ක්‍රියාවලින් වැළකී සිටින ලෙස අවසරලාභී වෙත පනවන ලද බැඳීම්

එකී සීමා කිරීම්වලට ඇතුළත් වන ලෙස නොසැලකිය යුතු ය.

ලියාපදිංචිය බල රහිත කිරීම, අවසර ගිවිසුම්වලට බලපාන ආකාරය.

53. අවසර ගිවිසුමේ කාලය ඉකුත්වීමට පෙර, එහි ලියාපදිංචිය බලරහිත සහ ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, අවසර ගිවිසුම යටතේ අවසරදායීට තවදුරටත් යම් ගෙවීමක් කරන ලෙස අවසරලාභීට නියම කරනු නොලැබිය යුතු අතර, ඒ වනවිට කර ඇති ගෙවීම් ආපසු ලබා ගැනීමට ද අවසරලාභීට හිමිකම් තිබිය යුතු ය:

එසේ වුව ද සියලු අවස්ථානුගත කරුණු යටතේ සහ විශේෂයෙන්ම අවසරලාභීට අවසරය නිසා සිදුවිදායක ලෙස ලාභයක් ලැබී තිබේ නම්, එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම සාධාරණීය නොවන බව අවසරදායී විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට, ඒ ආපසු ගෙවීම කිරීමට අවසරදායීට නියම නොකළ යුතු ය; නැතහොත් එසේ ඔප්පු කළ හැකි ප්‍රමාණයට, කොටසක් ආපසු ගෙවීම කරන ලෙස අවසරදායීට නියම කළ යුතු ය.

අවසර ගිවිසුමක් ඉකුත්වීම, අවසන වීම හෝ නිර්බල වීම.

54. රෙජිස්ට්‍රාර්වරයා විසින්,—

(1) සටහන් කරනු ලැබූ අවසර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති බවට හෝ අවසාන කර ඇති බවට ඔහු සෑහීමට පත් වුවහොත්, එහි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද, තත් කාර්යය සඳහා වූ ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ කරුණ ලේඛනයෙහි සටහන් කළ යුතු ය;

(2) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ අවසර ගිවිසුමක කාලය ඉකුත්වීම, ඒ ගිවිසුම අවසානවීම හෝ නිර්බල වීම ලේඛනයේ සටහන් කළ යුතු ය.

විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන අවසර ගිවිසුම්.

55. (1) (අ) විදේශයක දී ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් අවසර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක්; හෝ

(ආ) ඒ අවසර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොටගෙන, ඒ අවසර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයකට අදාළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම්දීමක් අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී අවසර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

X වන පරිච්ඡේදය

ලියාපදිංචිය අත්හැරීම සහ එහි බලරහිත බව

ලියාපදිංචිය අත්හැරීම.

56. (1) කාර්මික සැලසුමක ලියාපදිංචි හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබූ සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද, ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් ඔහු විසින් ලියාපදිංචිය අත්හරිනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය ලැබුණු කල්හි, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රකාශය ලේඛනයේ සටහන් කළ යුතු අතර ඒ සටහන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට ද සැලැස්විය යුතු ය.

(3) එකී ප්‍රකාශය රෙජිස්ට්‍රාර්වරයාට ලැබුණු දින සිට, ඒ අත්හැරීම බලපැවැත්විය යුතු ය.

(4) කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් වූ අවසර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අවසර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති අවසරලාභියා විසින් හෝ අතුරු අවසරලාභියා විසින් හෝ කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතව ම අවසර ගිවිසුමේ සඳහන් කර නිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම අවසරලාභියකුම විසින් හෝ අතුරු අවසරලාභියකුම විසින් හෝ එකී අත්හැරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිස, රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී අත්හැරීම පිළිගැනීම හෝ සටහන් කිරීම හෝ නොකළ යුතු ය.

ලියාපදිංචියේ බල රහිත බව.

57. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා ද ඇතුළුව යම් නිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ කාර්මික සැලසුමේ ලියාපදිංචි හිමියා ද, සටහන් කරනු ලැබූ සෑම පැවරුම්ලාභියකු, සෑම අවසරලාභියකු හෝ අතුරු අවසරලාභියකු ම ද පාර්ශ්වකරුවන් ලෙස සඳහන් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අධිකරණය විසින් පහත දැක්වෙන එක් හේතුවක් නිසා හෝ ඊට වැඩි හේතු ගණනක් නිසා හෝ කාර්මික සැලසුමේ ලියාපදිංචිය බල රහිත සහ ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය:—

(අ) 26 වන, 27 වන සහ 28 වන වගන්තිවල විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම:

එසේ වුව ද, 26 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් නිර්බලතාවේ හේතු, අධිකරණයට ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ දිනයේ දී නොපැවතියේ නම්, ඒ හේතු සැලකිල්ලට ගනු නොලැබිය යුතු ය;

(ආ) පූර්ව ඉල්ලීමක් අනුව, සමානුරූපී කාර්මික සැලසුමක් මීට පෙර ලියාපදිංචි කරනු ලැබ තිබීම හෝ වෙනත් රටක කරනු ලැබූ පූර්ව ලියාපදිංචියක් හේතු කොට ගෙන, තත් කාර්යය සඳහා කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර සමානුරූපී කාර්මික සැලසුමකට කලින් ප්‍රමුඛත්වය දෙනු ලැබීම;

(ඇ) ලියාපදිංචි කාර්මික සැලසුමේ අත්‍යවශ්‍ය මූලාංග, 30 වන වගන්තියේ අර්ථානුකූලව, වෙනත් තැනැත්තකුගේ නිර්මාණයකින් නීත්‍යානුකූල නොවන පරිදි ලබා ගෙන තිබීම.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචියේ ඇතුළත් කරනු ලැබූ කාර්මික සැලසුම් කිපයකට අදාළවන අවස්ථාවක දී සහ එය බලරහිත වීම සඳහා වූ හේතුව හෝ හේතු ඒ සියලුම කාර්මික සැලසුම්වලට නොව ඉන් කිපයකට

පමණක් අදාළ වන අවස්ථාවක දී, බලරහිත කිරීම සඳහා වූ හේතුව හෝ හේතු අදාළ වන්නේ යම් කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් ද, ඒ කාර්මික සැලසුමට ඒ ලියාපදිංචිය අදාළ වන තාක් දුරට, ඒ ලියාපදිංචිය බලරහිත සහ ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

බල රහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය.

58. (1) කාර්මික සැලසුමක ලියාපදිංචිය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් බලරහිත බව ප්‍රකාශ කරමින් අධිකරණය විසින් අවසානාත්මක තීරණයක් කරන ලද විටක, ලියාපදිංචියේ දින සිට, අවස්ථාවෝචිත පරිදි, ලියාපදිංචිය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් හෝ බලරහිත සහ ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලරහිතවීම පිළිබඳ ප්‍රකාශයක් අවසානාත්මක වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී ප්‍රකාශය ලේඛනයෙහි සටහන් කොට, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

IV වන කොටස

පේටන්ට් බලපත්‍ර

XI වන පරිච්ඡේදය

අර්ථකථන

නව නිපැයුම් පිළිබඳ අර්ථ කථනය.

59. (1) මේ කොටසේ කාර්ය සඳහා "නව නිපැයුම" යන්නෙන් තාක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයෙහි නිශ්චිත ගැටළුවක් විසඳීමට ව්‍යවහාරයෙහි ලා උපකාරිවන, නව නිපැයුම්කරුවකුගේ සංකල්පනාවන් අදහස් වේ.

(2) නව නිපැයුමක්, නිෂ්පාදිතයක් හෝ ක්‍රියාවලියක් හෝ විය හැකි ය; නැතහොත් එය නිෂ්පාදිතයකට හෝ ක්‍රියාවලියකට හෝ අදාළ විය හැකි ය.

(3) මෙහි පහත දැක්වෙන දේ, (1) වන උපවගන්තියේ අර්ථානුකූලව නව නිපැයුම් වුව ද ඒවාට පේටන්ට් බලපත්‍ර ලබාගත නොහැකි විය යුතු ය:—

(අ) අනාවරණය කර ගැනීම්, විද්‍යාත්මක සිද්ධාන්ත හා ගණිත ක්‍රම;

(ආ) ශාක හෝ සත්ත්ව වර්ග හෝ අණුජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් සහ ඒ ක්‍රියාවලියන්ගේ නිෂ්පාදිත හැර, ශාක හෝ සත්ත්වයන් උත්පාදනය කිරීම සඳහා වූ අවශ්‍යයෙන්ම ජීව විද්‍යාත්මක වූ ක්‍රියාවලියන්;

(ඇ) ව්‍යාපාර කටයුතු කිරීම, හුදු මනෝමය ක්‍රියා කිරීම හෝ ක්‍රීඩා කිරීම සඳහා වූ යෝජනා ක්‍රම, රීති හෝ ක්‍රම;

(ඈ) ශල්‍යකර්ම මඟින් හෝ චිකිත්සාව මඟින් මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීරයට ප්‍රතිකාර කිරීමේ ක්‍රම සහ මනුෂ්‍ය හෝ සත්ත්ව ශරීර සම්බන්ධයෙන් රෝග විනිශ්චය කිරීමෙහි ලා ව්‍යවහාරික ක්‍රම:

එසේ වුව ද, එකී යම් ක්‍රමයක් සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගනු ලබන නිෂ්පාදිතවලට මේ ඡේදය අදාළ නොවිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර ලබාගත හැකි නව නිපැයුම්.

60. යම් නව නිපැයුමක් අළුත් නම් සහ එහි නව නිපැයුම්කාරී පියවරක් තිබේ නම් සහ කාර්මික වශයෙන් යොදා ගත හැකි නම්, එය පේටන්ට් බලපත්‍ර ලබාගත හැකි නව නිපැයුමක් වේ.

නවතාව.

61. (1) නව නිපැයුමක් පූර්ව කලාවක් මගින් කලින් පෙන්නුම් කර නොමැති නම්, එය නව නිපැයුමක් වේ.

(2) පූර්ව කලාවක්—

(අ) නව නිපැයුමට හිමිකම් දක්වන පේටන්ට් බලපත්‍ර සඳහා ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමට පෙර හෝ උචිත අවස්ථාවක දී, ඒ ඉල්ලුම් පත්‍රයේ ප්‍රමුඛත්ව දිනයට පෙර, ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් ලෝකයේ කවර ස්ථානයක දී වුව ද, ලිඛිත ප්‍රකාශයක් මගින් හෝ ශ්‍රී ලංකාව තුළ දී වාචික අනාවරණයක් මගින් මහජනයාට අනාවරණය කළ සියලු දෙයින්;

(ආ) මෙහි (අ) ඡේදයේ සඳහන් පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ඉදිරිපත් කරනු ලැබූ හෝ උචිත අවස්ථාවක දී, ඒ ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ප්‍රමුඛත්ව දිනයක් ලත් දේශීය පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක අඩංගු කරුණු එකී දේශීය පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රය පදනම් කරගෙන ප්‍රදානය කරනු ලබන පේටන්ට් බලපත්‍රයෙහි ඇතුළත් වන ප්‍රමාණයකට, ඒ කරුණුවලින්

සමන්විත වන්නේ ය.

(3) (2) (අ) වන උපවගන්තිය යටතේ කරනු ලබන අනාවරණයක්—

(අ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුව වූ අවුරුද්ද ඇතුළත සිදු වූවක් නම්, සහ ඉල්ලුම්කරු විසින් හෝ ඔහුට කලින් අයිතිකරු විසින් හෝ කරන ලද ක්‍රියා හේතු කොට ගෙන හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ සිදු වූ වක් නම්;

(ආ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුව වූ මාස හය ඇතුළත සිදු වූවක් නම් සහ ඉල්ලුම්කරුගේ හෝ ඔහුට කලින් අයිතිකරුගේ අයිති වාසිකම් අහිමි ලෙස ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා හෝ වාචික ප්‍රතිවිපාකයක් නිසා හෝ සිදු වූවක් නම්,

නොසලකා හැරිය යුතු ය.

නව නිපැයුම්කාරී පියවර.

62. නව නිපැයුමට හිමිකම දක්වන, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ පූර්ව කලාව ද සැලකිල්ලට ගෙන බලන කල්හි, කලාව පිළිබඳ සාමාන්‍ය නිපුණතාවක් ඇති තැනැත්තකුට නව නිපැයුමක තිබෙන නව නිපැයුම්කාරී පියවර පැහැදිලිව නොපෙනේ නම් ඒ නව නිපැයුමේ නව නිපැයුම්කාරී පියවරක් තිබෙන ලෙස සැලකිය යුතු ය.

කාර්මික වශයෙන් යොදා ගැනීම.

63. යම් නව නිපැයුමක් කවර හෝ යම් කර්මාන්තයක දී සෑදීම හෝ භාවිත කිරීම හෝ කළ හැකි නම්, එය කාර්මික වශයෙන් යොදා ගත හැකි ලෙස සැලකිය යුතු ය.

XII වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට තිබෙන අයිතිවාසිකම

පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම්.

64. (1) 65 වන වගන්තියට යටත්ව, පේටන්ට් බලපත්‍රයක් ලබාගැනීමට ඇති අයිතිවාසිකම නව නිපැයුම්කරු සතු විය යුතු ය.

(2) තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ නව නිපැයුමක් කරනු ලැබූ අවස්ථාවක දී, පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම හවුලේ ඔවුන් සතු විය යුතු ය.

පැහැරගැනීම: පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකින් හෝ පේටන්ට් බලපත්‍රයකින් අධිකරණය විසින් පැවරීම.

65. පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකින් හෝ පේටන්ට් බලපත්‍රයකින් හිමිකම් පාන ලද නව නිපැයුමක අත්‍යාවශ්‍ය මූලාංග, වෙනත් තැනැත්තකුට පේටන්ට් බලපත්‍රය සඳහා අයිතිවාසිකම ඇති නව නිපැයුමකින් නීති විරෝධී ලෙස ලබා ගෙන ඇති අවස්ථාවක, ඒ වෙනත් තැනැත්තා විසින් පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය හෝ පේටන්ට් බලපත්‍රය තමා වෙත පවරන ලෙසට ආඥාවක් ලබා ගැනීම සඳහා අධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි ය:

එසේ වුව ද, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීමෙන් පසු, පේටන්ට් බලපත්‍රයට අයිතිවාසිකම හිමි තැනැත්තා විසින් තම කැමැත්ත එකී පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් දෙනු ලබන අවස්ථාවක, ඒ කැමැත්ත ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද දිනයේ සිට සියලු කාර්යයන් සඳහා බලපවත්වන බව සලකනු ලැබිය යුතු ය:

එසේ ම තවදුරටත්, පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ දින සිට අවුරුදු පහකට පසුව, ඒ පේටන්ට් බලපත්‍රය පැවරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අධිකරණය විසින් භාර නොගත යුතු ය.

සේවා නියුක්තයකු විසින් හෝ හාරදීමක් අනුව හෝ කරන ලද නව නිපැයුම්.

66. (1) යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ වැඩක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමක හෝ පටහැනි විධිවිධානයක් නොමැති විටක, ඒ සේවා නියුක්ති ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද නව නිපැයුමක් සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම, අවස්ථාවෝචිත පරිදි, සේවා යෝජකට හෝ ඒ වැඩය භාර දුන් තැනැත්තාට හෝ උපචිත වෙතැයි සැලකිය යුතු ය:

එසේ වුව ද, අවස්ථාවෝචිත පරිදි, සේවා නියුක්ති ගිවිසුමට හෝ ඒ වැඩය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුමට හෝ ඇතුළත් වූ අවස්ථාවේ දී, පාර්ශ්වකරුවන්ට කල්තියා සාධාරණව දැන ගැනීමට

හැකි වූ ආර්ථික වටිනාකමට වැඩි ආර්ථික වටිනාකමක් ඒ නව නිපැයුමට ඇති වන අවස්ථාවක, පාර්ශ්වකරුවන් අතර පාරිශ්‍රමික යක් පිළිබඳ එකඟත්වයක් නොමැති නම්, අධිකරණය විසින් නියම කරනු ලබන සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට නව නිපැයුම්කරුට හිමිකම ලැබිය යුතු ය.

(2) යම් සේවා නියුක්තයකුට ඔහුගේ සේවා නියුක්ති ගිවිසුමෙන් නව නිපැයුම්කාරී කාර්යයක යෙදීමට නියම කර නොමැති විටක, ඒ සේවා නියුක්තයා විසින් උපයෝගි කර ගනු ලැබීම සඳහා සේවායෝජක විසින් ඔහුට සපයන ලද දත්ත හෝ උපක්‍රම උපයෝගි කොට ගෙන, ඔහුගේ සේවායෝජකගේ කාර්ය ක්ෂේත්‍රයෙහි දී, ඔහු විසින් නව නිපැයුමක් කරනු ලබන අවස්ථාවක, සේවා නියුක්ති ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති නම්, ඒ නව නිපැයුම සඳහා පේටන්ට් බලපත්‍රයක් ලැබීමට ඇති අයිතිවාසිකම සේවායෝජකට උපචිත වෙතැයි සැලකිය යුතු ය:

එසේ වුව ද, සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට සේවා නියුක්තයා හිමිකම ලැබිය යුතු අතර පාරිශ්‍රමිකය පිළිබඳව පාර්ශ්වකරුවන් අතර එකඟත්වයක් නොමැති විටක, ඔහුගේ පඬි නඩි, නව නිපැයුමේ ආර්ථික වටිනාකම සහ එයින් සේවායෝජකයා ලබන යම් ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, අධිකරණය විසින් ඒ පාරිශ්‍රමිකය නියම කළ හැකි ය.

(3) නව නිපැයුම්කරු වෙත (1) වන සහ (2) වන උපවගන්තියටතේ පවරා ඇති අයිතිවාසිකම් ගිවිසුමක් මගින් සීමා නොකළ යුතු ය.

නව නිපැයුම්කරු නම් කරනු ලැබීම.

67. (1) නව නිපැයුම්කරු විසින් ඒ නව නිපැයුම්කරු වශයෙන් පේටන්ට් බලපත්‍රයෙහි තමා නම් කරනු ලැබීමට තමා එකඟ නොමැති බව ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබ, රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ලියවිල්ලකින් වූ ප්‍රකාශයකින් දන්වනු ලැබුව හොත් හැර, ඒ නව නිපැයුම්කරු ඒ නව නිපැයුම්කරු වශයෙන් පේටන්ට් බලපත්‍රයේ නම් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන යම් ගිවිසුමක නියමයන් මගින් වෙනස් කරනු නොලැබිය යුතු ය.

XIII වන පරිච්ඡේදය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ ප්‍රදානය කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු.

68. (1) (අ) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද එහි පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය:—

(i) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලෙස ඉල්ලීමක්;

(ii) විස්තරයක්;

(iii) හිමිකම් පෑමක් හෝ හිමිකම් පෑම්;

(iv) නියම කරනු ලැබූ අවස්ථාවක දී, චිත්‍රයක් හෝ චිත්‍ර;

(v) සාරාංශයක්.

(ආ) ඉල්ලුම්කරුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාවෙන් පිටත වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ පදිංචි අනුයෝජිතයකු විසින් ඔහු නියෝජනය කරනු ලැබිය යුතු අතර, ඒ අනුයෝජිතයාගේ නම සහ ලිපිනය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතු ය; තව ද, ඒ ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිත යාට දෙනු ලැබූ ඇටෝර්නි බලපත්‍රයක් ඒ ඉල්ලුම් පත්‍රය සමග ඉදිරි පත් කළ යුතු ය:

එසේ වුව ද, ඉල්ලුම්කරුගේ අත්සන නීත්‍යානුකූල කිරීම සහ සහතික කිරීම නියම නොකළ යුතු ය.

(ඇ) තම නම සහ ලිපිනය සඳහන් කරමින්, සහ තමා නව නිපැයුම්කරු ලෙස ඒ පේටන්ට් බලපත්‍රයේ නම් කරනු ලබන ලෙස ඉල්ලමින්, නව නිපැයුම්කරු විසින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) පහත දැක්වෙන දේ ඒ ඉල්ලීමෙහි අඩංගු විය යුතු ය:—

(i) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලෙස ඉල්ලන පෙත්සමක්;

(ii) නව නිපැයුමේ නීත්‍යානුකූල අයිතිය;

(iii) ඉල්ලුම්කරුගේ, නව නිපැයුම්කරුගේ සහ අනුයෝජිතයකු ස්ථිර නම්, ඔහුගේ නම, ලිපිනය, විස්තර සහ ඔවුන් පිළිබඳ වෙනත් නියමිත තොරතුරු.

(ආ) ඉල්ලුම්කරු නව නිපැයුම්කරු නොවන අවස්ථාවක, පේටන්ට් බලපත්‍රය සඳහා ඉල්ලුම්කරුට ඇති අයිතිවාසිකම යුක්ති සහගත බව පෙන්වන ප්‍රකාශයක් ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) රෙජිස්ට්‍රාර්වරයා විසින් (ආ) ඡේදයේ සඳහන් ප්‍රකාශනයෙහි පිටපතක් නව නිපැයුම්කරු වෙත යවනු ලැබිය යුතු අතර, ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බැලීමේ ද නියමිත ගාස්තුව ගෙවා එහි පිටපතක් ලබා ගැනීමේ ද අයිතිවාසිකම ඒ නව නිපැයුම්කරුට තිබිය යුතු ය.

(3) නව නිපැයුම අගය කිරීමේ සහ ක්‍රියාවට නැඟීමේ කලාව පිළිබඳව සාමාන්‍ය නිපුණත්වයක් ඇති තැනැත්තකු විසින් නව නිපැයුම අගය කරනු ලැබීම සඳහා සහ ක්‍රියාවට නැඟීම සඳහා ප්‍රමාණවත් ලෙස පැහැදිලි වූ සහ පූර්ණ වූ ආකාරයකින්, නව නිපැයුම එකී විස්තරයෙන් අනාවරණය විය යුතු අතර, විශේෂයෙන් ම, නව නිපැයුම ක්‍රියාවට නැඟීම සඳහා ඉල්ලුම්කරු දන්නා සුදුසුම ක්‍රමය එහි දැක්විය යුතු ය.

(4) හිමිකම් පෑම හෝ හිමිකම් පෑම් පැහැදිලි සහ සංක්ෂිප්ත විය යුතු අතර, ඒ හිමිකම් පෑම හෝ හිමිකම් පෑම් විස්තරයෙන් තහවුරු කළ යුතු ය.

(5) නව නිපැයුම් අවබෝධ කර ගැනීම සඳහා චිත්‍ර අවශ්‍ය කරන විට, ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතු ය.

(6) පේටන්ට් බලපත්‍රයෙන් සලසනු ලබන ආරක්ෂාව පිළිබඳ විෂය පථය සහ ප්‍රමාණය හිමිකම් පෑම හෝ හිමිකම් පෑම් පිළිබඳ නියමයන් මගින් නිශ්චය කළ යුතු අතර, හිමිකම් පෑම හෝ හිමිකම් පෑම් අර්ථකථනය කිරීම සඳහා විස්තරය සහ චිත්‍ර උපයෝගී කර ගත හැකි ය.

(7) ශිල්පීය නොරතුරුවල කාර්යය, සාරාංශයෙන් ඉටු විය යුතු අතර, පේටන්ට් බලපත්‍රයෙන් සලසනු ලබන ආරක්ෂාව පිළිබඳ විෂය පථය සහ ප්‍රමාණය නිශ්චය කිරීමේ හෝ අර්ථකථනය කිරීමේ හෝ කාර්යය සඳහා සාරාංශය උපයෝගී කර ගනු නොලැබිය යුතු ය.

ඉල්ලුම්පත්‍ර හාස්තුව.

69. නියමිත ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලැබුවහොත් හැර පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරන ලෙසට වූ ඉල්ලුම් පත්‍රය, භාරගනු නොලැබිය යුතු ය.

සෝදිසි වාර්තාව.

70. (1) සෑම ඉල්ලුම්කරුවකු ම විසින් නියමිත කාල සීමාව ඇතුළත අන්තර් ජාතික වර්ගයේ සෝදිසි වාර්තාවක් සැපයිය යුතු අතර, එය ඉංග්‍රිසි භාෂාවෙන් සකස් කර නොමැති නම්, එය සමග එහි ඉංග්‍රිසි පරිවර්තනයක් ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, එකී අන්තර් ජාතික වර්ගයේ සෝදිසිය වෙනුවට, ඉල්ලුම් පත්‍රය දේශීය පරීක්ෂකවරයකු වෙත යොමු කරන ලෙස ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි අතර ඒ පරීක්ෂකවරයා විසින් විස්තරය ද චිත්‍ර කිසිවක් වුවහොත්, ඒවා ද සැලකිල්ලට ගෙන හිමිකම් පෑම හෝ හිමිකම් පෑම් පදනම් කොට ගෙන ඒ ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බලා, ලැබෙන පහසුකම් අනුව, අදාළ පූර්ව කලාව හැකිතාක් දුරට අනාවරණය කිරීමට වැයම් දරා, අදාළ පූර්ව කලාව පිළිබඳ වාර්තාවක් නියමිත කාලසීමාව ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත සැපයිය යුතු ය; ඒ කෙසේ වුව ද ඒ කාර්යය සඳහා දේශීය පරීක්ෂක වරයා විසින් තමාට ලැබී ඇති, පූර්ව කලාව පිළිබඳ සියලුම ලිපිලේඛන කියවා බැලිය යුතු ය.

(2) ඉල්ලුම්කරුවකු විසින් තම ඉල්ලුම් පත්‍රය දේශීය පරීක්ෂක වරයකු වෙත යොමු කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලා සිටින ලද විටක, ඔහු විසින් නියමිත හාස්තුව රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරි පත් කළ යුතු ය.

(3) මේ වගන්තියේ "දේශීය පරීක්ෂකවරයා" යන්නෙන්, රෙජිස්ට්‍රාර්වරයා විසින් පේටන්ට් බලපත්‍ර සම්බන්ධ ප්‍රශ්න යොමු කරනු ලබන නිපුණතාවක් ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් අදහස් වේ.

නව නිපැයුම් වලිබඳ ඒ කියභාවය.

71. ඉල්ලුම් පත්‍රයක් එක් නව නිපැයුමකට පමණක් හෝ කේවල සාමාන්‍ය නව නිපැයුම්කාරී සංකල්පයක් ලෙස සංයුක්ත වන සේ එකට සම්බන්ධ වූ නව නිපැයුම් සමූහයකට හෝ අදාළ විය යුතු ය.

ඉල්ලුම් පත්‍රය සංශෝධනය කිරීම් හා විභජනය කිරීම.

72. (1) ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් පත්‍රය සංශෝධනය කරනු ලැබිය හැකි ය; එසේ වුව ද, සංශෝධනය, මුල් ඉල්ලුම් පත්‍රයෙන් කරන ලද අනාවරණය කිරීම නොඉක්මවිය යුතු ය.

(2) (අ) ඉල්ලුම්කරුවකු විසින් ඉල්ලුම් පත්‍රය, ඉල්ලුම් පත්‍ර දෙකකට හෝ ඊට වැඩි ගණනකට ("විභජිත ඉල්ලුම් පත්‍ර") විභජනය කරනු ලැබිය හැකි ය; එසේ වුව ද එක් එක් විභජිත ඉල්ලුම් පත්‍රය මුල් ඉල්ලුම් පත්‍රයෙන් කරන ලද අනාවරණය කිරීම නොඉක්ම විය යුතු ය.

(ආ) එක් එක් විභජිත ඉල්ලුම් පත්‍රය, මුල් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයට හෝ අදාළ අවස්ථාවක, මුල් ඉල්ලුම් පත්‍රයේ ප්‍රමුඛත්වය දිනයට හෝ හිමිකම් ලැබිය යුතු ය.

ප්‍රමුඛත්වය පිළිබඳ අයිතිවාසිකම්.

73. (1) ඉල්ලුම්කරු විසින් හෝ ඔහුට කලින් අයිතිකරු විසින් සම්මුතියට පාර්ශ්වකරුවකු වූ යම් රාජ්‍යයක දී හෝ ඒ රාජ්‍යය වෙනුවෙන්, කලින් ඉදිරිපත් කරන ලද ජාතික, ප්‍රාදේශීය හෝ අන්තර් ජාතික ඉල්ලුම්පත්‍ර එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා එකී සම්මුතිය අනුව, ප්‍රමුඛත්වයට හිමිකම් පෑමක් දැක්වෙන ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රයට අඩංගු කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ ප්‍රකාශයක් ඉල්ලුම් පත්‍රයට අඩංගු වන අවස්ථාවක, කලින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද කාර්යාලය විසින් නිවැරදි බවට සහතික කරන ලද, ඒ ඉල්ලුම් පත්‍රයේ පිටපතක්, හෝ කලින් ඉල්ලුම් පත්‍රය පේටන්ට් සහයෝගිතා ගිවිසුම යටතේ ඉදිරිපත් කරන ලද අන්තර් ජාතික ඉල්ලුම් පත්‍රයක් වූ අවස්ථාවක, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ අන්තර්ජාතික කාර්යාංශය විසින් නිවැරදි බවට සහතික කරන ලද, ඒ ඉල්ලුම් පත්‍රයේ පිටපතක්, නියමිත කාලය ඇතුළත ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් ප්‍රකාශයේ බලපෑම ඒ උපවගන්තියේ සඳහන් සම්මුතියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වූ යම් නියමයන් හෝ ඊට අදාළ යම් නියෝග හෝ අනුව ක්‍රියා කර නොමැති අවස්ථාවක, (1) වන උපවගන්තියේ සඳහන් ප්‍රකාශය බලරහිත සහ ශූන්‍ය ලෙස සැලකිය යුතු ය.

ඉදිරිපත් කිරීමේ දිනය.

74. (1) ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කළ යුතු ය:

එසේ වුව ද, පහත දැක්වෙන කරුණු ඉල්ලුම් පත්‍රයෙහි අඩංගු වී තිබිය යුතු ය:—

(අ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය;

(ආ) නව නිපැයුම්කරුගේ නම සහ ලිපිනය හා ඉල්ලුම්කරු නව නිපැයුම්කරු නොවන අවස්ථාවක, 68 (2) (ආ) වන වගන්තියේ සඳහන් ප්‍රකාශය;

(ඇ) විස්තරය;

(ඈ) හිමිකම් පෑමක් හෝ හිමිකම් පෑම්:

එසේ ම තවදුරටත් ඉල්ලුම් පත්‍රය ලැබුණු වේලාවේ දී, නියමිත ගාස්තුව ගෙවා තිබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන සපුරා නොමැති බව ඉල්ලුම් පත්‍රය ලැබුණු වේලාවේ දී, රෙජිස්ට්‍රාර්වරයාට පෙනී ගිය හොත්, අවශ්‍ය නිවැරදි විස්තර ඉදිරිපත් කරන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් (2) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම අනුව ක්‍රියා කරන ලද අවස්ථාවක, නියමිත නිවැරදි විස්තර ලැබුණු දිනය ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කළ යුතු ය; ඉල්ලුම්කරු විසින් එසේ ක්‍රියා කරනු නොලබන අවස්ථාවක, ඉල්ලුම්පත්‍රය බලරහිත සහ ශූන්‍ය ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සැලකිය යුතු ය.

(4) ඇත්ත වශයෙන්ම, ඉල්ලුම් පත්‍රයට ඇතුළත් නොකරන ලද චිත්‍ර ගැන ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කෙරෙන අවස්ථාවක, අඩු චිත්‍ර සපයන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(5) ඉල්ලුම්කරු විසින් (4) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම අනුව ක්‍රියා කරන ලද අවස්ථාවක, අඩු චිත්‍ර ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කළ යුතු ය; ඉල්ලුම්කරු විසින් එසේ ඒ අනුව ක්‍රියා කරනු නොලැබූ අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය ලැබුණු දිනය, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කළ යුතු අතර එකී චිත්‍ර පිළිබඳව කිසිම සටහනක් නොකළ යුතු ය.

පරීක්ෂා කිරීම

75. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කළ යුතු අතර, පහත දැක්වෙන කොන්දේසි සපුරා ඇති බවට ද ඔහු සෑහීමට පත්විය යුතු ය:—

(අ) අදාළ වන අවස්ථාවක, 68 (1) (ආ) වන වගන්තියෙහි නියමයන්;

(ආ) ඉල්ලීම 68(2)(අ) වන වගන්තියේ නියමයන්ට අනුකූල වීම;

(ඇ) අදාළ වන අවස්ථාවක, 68(2)(ආ) වන වගන්තියේ නියමයන්;

(ඈ) විස්තරය, හිමිකම් පෑම් හා අදාළ වන අවස්ථාවක, චිත්‍ර නියමිත නියමයන්ට අනුකූල වීම;

(ඉ) ඉල්ලුම් පත්‍රයට සාරාංශයක් අඩංගු වීම;

(ඊ) 70 වන වගන්තියෙහි සඳහන් සෝදිසි වාර්තාව ඉදිරිපත් කර තිබීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි සපුරා නොමැති බව රෙජිස්ට්‍රාර්වරයාට පෙනී ගිය අවස්ථාවක නියමිත නිවැරදි විස්තර ඉදිරිපත් කරන ලෙස ඔහු විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය; ඉල්ලුම්කරු විසින් එසේ ඉල්ලීමට අනුව ක්‍රියා කරනු නොලැබූ අවස්ථාවක (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව සාරාංශයක් සැපයීම නොකරන ලද අවස්ථාවක, නියමිත කාලසීමාව ඇතුළත, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ කල්හි, රෙජිස්ට්‍රාර්වරයා විසින් සාරාංශයක් පිළියෙළ කළ යුතු ය; නියමිත කාල සීමාව ඇතුළත නියමිත ගාස්තුව ගෙවනු නොලැබූ අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ ගනු ලැබූ යම් තීරණයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය; තවද ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම සඳහා ගත් යම් තීරණයක් ලියවිල්ලකින් විය යුතු අතර එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු එහි සඳහන් විය යුතු ය.

පේටන්ට් බලපත්‍ර ප්‍රදානය කිරීම්.

76. (1) හිමිකම් පාන ලද නව නිපැයුම සම්බන්ධයෙන් යම් ක්‍රියාවක් කිරීම මහජන සාමයට පටහැනි වන අවස්ථාවක දී හැර, ඒ ක්‍රියාව කිරීම යම් නීතියකින් හෝ නියෝගයකින් තහනම් කර තිබීමේ හේතුව මත පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ පේටන්ට් බලපත්‍රයක් නිර්බල කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය 75 (1) වන වගන්තියට අනුකූල වන බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඔහු විසින් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කළ යුතු ය. තව ද නොපමාවම ඔහු විසින්—

(අ) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම පිළිබඳව සහතිකයක් හා සෝදිසි වාර්තාවේ පිටපතක් ද සමග පේටන්ට් බලපත්‍රයේ පිටපතක් ඉල්ලුම්කරු වෙත නිකුත් කළ යුතු ය; තවද

(ආ) පේටන්ට් බලපත්‍රය පිළිබඳව ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(3) ඉන්පසු හැකිතාක් ඉක්මණින් රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම පිළිබඳව සඳහනක් ගැසට් පත්‍රයෙහි පළකිරීමට සැලැස්විය යුතු ය;

(ආ) නියමිත ගාස්තුව ගෙවනු ලැබූ කල්හි, සේදිසි වාර්තාවේ පිටපත් ද සමඟ පේටන්ට් බලපත්‍රයේ පිටපත් මහජනයා වෙත සැපයිය යුතු ය.

(4) පේටන්ට් බලපත්‍රය, (2) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා රෙජිස්ට්‍රාර්වරයා විසින් කරනු ලැබූ දින්යෙහි ප්‍රදානය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

77. පේටන්ට් බලපත්‍ර ලේඛනය යනුවෙන් හඳුන්වනු ලබන ලේඛනයක්, රෙජිස්ට්‍රාර්වරයා විසින් තබාගෙන පවත්වා ගෙන යා යුතු අතර පේටන්ට් බලපත්‍රයේ අංකය, ප්‍රදානලාභියාගේ නම සහ ලිපිනය සහ ප්‍රදානලාභියා ශ්‍රී ලංකාවේන් පිටත වාසය කරන්නේ නම් ලිපි හාරදීම් සඳහා ශ්‍රී ලංකාවේ තැපැල් ලිපිනයක්, ඉල්ලුම් පත්‍රයේ දිනය සහ ප්‍රදානය කරනු ලැබූ දිනය, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ පේටන්ට් බලපත්‍රයක හෝ හිමිකම් පිළිබඳව වූ යම් වෙනසක්, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සංශෝධනය කිරීම හෝ විභජනය කිරීම, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් හෝ පැවරීම හෝ අන්සතු කිරීම, ප්‍රමුඛත්වය සඳහා වූ යම් විලංගු හිමිකම් පෑමක්, පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම සහ සටහන් කරනු ලැබිය යුතු ලෙස හෝ කලින් කල නියම කරනු ලැබිය යුතු ලෙස මේ කොටසින් බලය දෙනු ලබන්නා වූ හෝ විධාන කරනු ලබන්නා වූ වෙනත් යම් කරුණු ද සඳහන් කරමින් සියලුම පේටන්ට් බලපත්‍ර, ඒවා ප්‍රදානය කරනු ලැබූ අනුපිළිවෙල අනුව, ඒ ලේඛනයේ සටහන් කරනු ලැබිය යුතු ය. පේටන්ට් බලපත්‍ර ලේඛනය.

78. යම් තැනැත්තකු විසින් ගාස්තුවක් නොගෙවා ලේඛනය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර නියමිත ගාස්තුව ගෙවා ඒ ලේඛනයෙහි සහතික කරන ලද උධෘත ලබාගත හැකි ය. ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කරන ලද පිටපත්.

79. (1) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබීමෙන් පසු, යම් තැනැත්තකු විසින් පේටන්ට් බලපත්‍රයට අදාළ ලිපිගොනුව සහ (2) වන උපවගන්තියට යටත්ව, යම් පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට අදාළ ලිපිගොනුව පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, නියමිත ගාස්තුව ගෙවා, ඒ ලිපිගොනුවලින් සහතික කරන ලද උධෘත ලබාගත හැකි ය. ලිපිගොනු පරීක්ෂා කිරීම්.

(2) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට අදාළ ලිපිගොනුව, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර ඉල්ලුම්කරුගේ ලිඛිත අවසරය ඇතිව පමණක්, පරීක්ෂා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර රෙජිස්ට්‍රාර් වරයා විසින් පහත දැක්වෙන තොරතුරු ඕනෑම තැනැත්තකුට හෙළිදරව් කරනු ලැබිය හැකිය:—

(අ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය සහ විස්තරය සහ අනුයෝජිත යකු සිටි නම්, ඔහුගේ නම සහ ලිපිනය;

(ආ) ඉල්ලුම් පත්‍රයේ අංකය;

(ඇ) ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීමේ දිනය, සහ ප්‍රමුඛත්වය සඳහා කිසිකම් පෑමක් කරනු ලැබේ නම්, ප්‍රමුඛත්ව දිනය, කලින් ඉල්ලුම් පත්‍රයේ අංකය, සහ කලින් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබුවේ යම් රාජ්‍යයක ද, ඒ රාජ්‍යයේ නම හෝ කලින් ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය හෝ අන්තර් ජාතික ඉල්ලුම් පත්‍රයක් වන අවස්ථාවක, එය ඉදිරිපත් කරනු ලැබුවේ යම් රාජ්‍යයක් හෝ රාජ්‍ය සඳහා ද, ඒ රාජ්‍යයේ නම හෝ රාජ්‍යවල නම් සහ ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම පිළිබඳ යම් සඳහනක්;

(ඈ) නව නිපැයුමක නිත්‍යනුකූල අයිතිය;

(ඉ) ඉල්ලුම් පත්‍රය පිළිබඳ හිමිකමේ වූ යම් වෙනසක් සහ ඉල්ලුම් පත්‍රයට අදාළ ලිපිගොනුවෙහි දැක්වෙන අවසර ගිවිසුමක් පිළිබඳ යම් සඳහනක්.

(3) යම් තැනැත්තකු ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවා නියුක්තියේ යෙදී සිටින කාලසීමාව ඇතුළත හෝ ඒ සේවා නියුක්තිය අවසාන කිරීමෙන් පසු එක් අවුරුද්දක් ඇතුළත ඒ තැනැත්තා විසින් පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් නොකළ යුතු අතර ඔහුට පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කිරීම ද නොකළ යුතු ය; තව ද, එසේ ම පේටන්ට් බලපත්‍රයකට අදාළව කවර හෝ යම් අයිතිවාසිකම් යම් ආකාරයකින් ඒ තැනැත්තා විසින් අත් කර ගනු ලැබීම හෝ දරනු ලැබීම හෝ නොකළ යුතු ය.

XIV වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍රයක් වලංගු කාල සීමාව

පේටන්ට් බලපත්‍රයක් වලංගු කාල සීමාව.

80. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබූ දින සිට පසළොස් අවුරුද්දකට පසු එහි වලංගු කාලය අවසාන විය යුතු ය.

(2) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන ලද දින සිට දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබාගැනීමට පේටන්ට් බලපත්‍රලාභියා අදහස් කරන්නේ නම්, දෙවන අවුරුද්ද සහ පේටන්ට් බලපත්‍රය වලංගු කාල සීමාව ඇතුළත වූ එක් එක් අනුප්‍රාප්ති අවුරුද්ද ඉකුත් වන දිනයට මාස දෙළහකට පෙර නියමිත වාර්ෂික ගාස්තුව ඔහු විසින් ගෙවිය යුතු ය:

එසේ වුව ද නියම කරනු ලැබිය හැකි යම් අධිගාස්තුවක් ගෙවනු ලැබූ විට, එසේ කාලය ඉකුත් වූ දිනයෙන් පසු, මාස හයක අනුග්‍රහ කාල සීමාවක් සඳහා ඉඩ දිය යුතු ය:

එසේම තවදුරටත්, නියමිත වාර්ෂික ගාස්තුවල එකතුව සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හෝ පේටන්ට් බලපත්‍රලාභිය විසින් කලින් ගෙවනු ලැබිය හැකි ය.

XV වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍ර කිමියාගේ අයිතිවාසිකම්

පේටන්ට් බලපත්‍ර කිමියාගේ අයිතිවාසිකම්.

81. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, පේටන්ට් බලපත්‍ර කිමියකුට පේටන්ට් බලපත්‍රයකට අදාළව පහත දැක්වෙන අනන්‍ය අයිතිවාසිකම් තිබිය යුතු ය:—

(අ) පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම තම ප්‍රයෝජනය සඳහා උපයෝගී කර ගැනීම;

(ආ) පේටන්ට් බලපත්‍රය පැවරීම හෝ අන්සතු කිරීම;

(ඇ) අවසර ගිවිසුම්වලට ඇතුළත් වීම.

(2) පේටන්ට් බලපත්‍ර කිමියාගේ කැමැත්ත නොමැතිව, කිසිම තැනැත්තකු විසින් (1) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු ය.

(3) මේ කොටසේ කාර්ය සඳහා, පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුමක් "තම ප්‍රයෝජනය සඳහා උපයෝගිකර ගැනීම" යන්න පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් යෙදෙන විට, පහත දක් වෙන ක්‍රියා අතුරින් කිඩිවක් ඉන් අදහස් වේ:—

(අ) පේටන්ට් බලපත්‍රය නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබ ඇති විටක—

(i) නිෂ්පාදිතය නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, විකිණීම සහ පාවිච්චි කිරීම;

(ii) ඒ නිෂ්පාදිතය විකිණීම සඳහා ඉදිරිපත් කිරීමේ, විකිණීමේ හෝ පාවිච්චි කිරීමේ කාර්යය සඳහා රැස්කර තබා ගැනීම;

(ආ) පේටන්ට් බලපත්‍රය ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ප්‍රදානය කරනු ලැබ ඇති විටක—

(i) ක්‍රියාවලිය පාවිච්චි කිරීම;

(ii) ක්‍රියාවලිය මාර්ගයෙන් කෙළින් ම ලබාගත් නිෂ්පාදිතයක් සම්බන්ධයෙන් (අ) ඡේදයෙහි සඳහන් ක්‍රියා අතුරින් කිසිවක් කිරීම.

කිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව.

82. (1) 81 වන වගන්තියේ විධිවිධාන කාර්මික හෝ වාණිජ කාර්ය සඳහා කරනු ලබන ක්‍රියාවලට පමණක් මිස හුදෙක් විද්‍යාත්මක පර්යේෂණ සඳහා කරනු ලබන ක්‍රියාවලට ව්‍යාප්ත නොවිය යුතු ය.

(2) 81 වන වගන්තියේ විධිවිධානවලින් 83 වන වගන්තියේ සඳහන් අයිතිවාසිකම ඇති තැනැත්තකු විසින් හෝ අවසර ලාභියකු විසින් හෝ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුමක් තම ප්‍රයෝජනය සඳහා උපයෝගි කර ගනු ලැබීම නොවැළැක්විය යුතු ය.

(3) 81 වන වගන්තියේ විධිවිධාන ශ්‍රී ලංකා ජලතීරයට, ගුවන් තීරයට හෝ දේශයට තාවකාලිකව හෝ අහඹුවකින් ඇතුළුවන විදේශීය යාත්‍රාවල, ගුවන් යානාවල, අභ්‍යවකාශ යානාවල හෝ ගොඩබිම් යානාවල නිෂ්පාදිතයන් තිබීම හෝ පාවිච්චි කිරීම කෙරෙහි ව්‍යාප්ත නොවිය යුතු ය.

පූර්ව සැදීමකින් හෝ පාවිච්චි කිරීමකින් ඇතුත් පැන්න අයිතිවාසිකම්.

83. (1) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද වේලාවේ දී හෝ, අදාළ වන අවස්ථාවක, පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයෙහි ප්‍රසිද්ධ කළ දිනයෙහි,—

(අ) තැනැත්තකු සද්භාවයෙන් ශ්‍රී ලංකාවේ දී, ඒ ඉල්ලුම් පත්‍රයෙහි හිමිකම් පාන ලද නව නිපැයුම විෂය කොටගත් නිෂ්පාදිතය සාදමින් හෝ ක්‍රියාවලිය භාවිත කරමින් සිටි අවස්ථාවක;

(ආ) තැනැත්තකු සද්භාවයෙන් ශ්‍රී ලංකාවේ දී (අ) ඡේදයෙහි සඳහන් නිෂ්පාදිතය තැනීම පිණිස හෝ ක්‍රියාවලිය භාවිත කිරීම පිණිස අවශ්‍යතාවයෙන් යුතුව කටයුතු පිළියෙළ කිරීම කර ඇති අවස්ථාවක,

පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබ නිබුණත්, පේටන්ට් බල පත්‍රය ලත් නව නිපැයුම නම ප්‍රයෝජනය සඳහා උපයෝගි කර ගැනීමේ අයිතිවාසිකම ඔහු සතු විය යුතු ය:

එසේ වුව ද, එකී තැනැත්තා විසින් ප්‍රස්තුත නිෂ්පාදිතය තැනීම හෝ ප්‍රස්තුත ක්‍රියාවලිය භාවිත කිරීම ශ්‍රී ලංකාවේ දී කරනු ලැබ නිබිය යුතු ය:

එසේ ම තවදුරටත්, 61 (3) (අ) වන හෝ (ආ) වන වගන්තියේ සඳහන් අවස්ථා යටතේ නව නිපැයුම අනාවරණය කරනු ලැබිණි නම්, නව නිපැයුම පිළිබඳ තම දැනුම ඒ අනාවරණය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූවක් නොවන බව ඔහු විසින් ඔප්පු කරනු ලැබීමට හැකි විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම, අනුකූල තැනැත්තාගේ ව්‍යාපාරයෙහි කොටසක් ලෙස හැර, පැවරීම හෝ අන්සතු කිරීම හෝ නොකළ යුතු ය.

XVI වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සහ පේටන්ට් බලපත්‍ර පැවරීම සහ අන්සතු කිරීම

පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම් පත්‍ර සහ පේටන්ට් බලපත්‍ර පැවරීම සහ අන්සතු කිරීම.

84. (1) පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ පේටන්ට් බලපත්‍රයක් පැවරීම හෝ අන්සතු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) පැවරීම නිසා හෝ අන්සතු කිරීම නිසා හෝ පේටන්ට් බල පත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයකට හෝ පේටන්ට් බලපත්‍රයකට හිමිකම් ලබන යම් තැනැත්තකු විසින්, ඒ පැවරීම හෝ අන්සතු කිරීම ලේඛනයෙහි සටහන් කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාගෙන් නියමිත ආකෘතියෙහි ලා ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(3) එවැනි කිසිම පැවරීමක් හෝ අන්සතු කිරීමක්—

(අ) නියමිත ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයාට ගෙවනු ලැබ තිබේ නම් මිස;

(ආ) පැවරීමක් සම්බන්ධයෙන් වන විටක, එය, ගිවිසි පාර්ශ්ව කරුවන් විසින් හෝ ගිවිසි පාර්ශ්වකරුවන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් වන්නේ නම් මිස

ලේඛනයේ සටහන් කරනු නොලැබිය යුතු ය.

(4) එවැනි කිසිම පැවරීමක් හෝ අන්සතු කිරීමක්, ලේඛනයෙහි එසේ සටහන් කරනු ලැබුවහොත් හැර, තෘතීය පාර්ශ්වකරුවන් සම්බන්ධයෙන් බල නොපැවැත්විය යුතු ය.

පේටන්ට් බලපත්‍ර සඳහා වූ ඉල්ලුම්පත්‍ර පිළිබඳ හෝ පේටන්ට් බලපත්‍ර පිළිබඳ හවුල් හිමිකම්.

85. පාර්ශ්වකරුවන් අතර යම් පටහැනි එකඟවීමක් නොමැති විටක, පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ පේටන්ට් බලපත්‍රයක හෝ හවුල් හිමියන් විසින් වෙන වෙන ම, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය පිළිබඳ හෝ පේටන්ට් බලපත්‍රය පිළිබඳ නම තමන් සතු අයිතිවාසිකම් පැවරීම හෝ අන්සතු කිරීම ද පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම තමන්ගේ ප්‍රයෝජනය සඳහා උපයෝගි කර ගැනීම ද, පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම ඔවුන්ගේ කැමැත්ත නොමැතිව තම ප්‍රයෝජනය සඳහා උපයෝගි කරගන්නා යම් තැනැත්තකුට විරුද්ධව ක්‍රියා කිරීම ද කරනු ලැබිය හැකි අතර, පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඉල්ලා අස්කර ගැනීම, පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම හෝ අවසර ගිවිසුමකට ඇතුළත් වීම හවුලේ පමණක් කරනු ලැබිය හැකි ය.

XVII වන පරිච්ඡේදය

අවසර ගිවිසුම

අර්ථ නිරූපණය.

86. මේ කොටසේ කාර්ය සඳහා, "අවසර ගිවිසුම" යන්නෙන් 81 (1) (අ) සහ (3) වන වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් හෝ සියලුම ක්‍රියා හෝ කිරීම සඳහා පේටන්ට් බලපත්‍රයක හිමියකු ("අවසරදෘ") විසින් වෙනත් තැනැත්තකුට හෝ ව්‍යවසායකට ("අවසරලාභි") අවසරයක් ප්‍රදානය කරනු ලබන්නේ යම් ගිවිසුමක් මත ද, ඒ ගිවිසුම අදහස් වේ.

අවසර ගිවිසුමේ ආකෘතිය සහ එය සටහන් කිරීම.

87. (1) අවසර ගිවිසුමක්, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් විය යුතු ය.

(2) ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලක් මගින් ඉල්ලා සිටින ලද කල්හි, ලේඛනයේ සටහන් කරනු ලැබීමට ගිවිසුමට සම්බන්ධ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය, ගිවිසුමට අදාළ විස්තර, නියමිත ගාස්තුව ගෙවන ලද විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයේ සටහන් කළ යුතු ය:

එසේ වුව ද, එකී ගිවිසුමට අදාළ වන්නා වූ වෙනත් යම් විස්තර හෙළිදරව් කිරීමට හෝ සටහන් කරනු ලැබීමට හෝ පාර්ශ්වකරුවන්ට නියම කරනු නොලැබිය යුතු ය.

අවසරලාභී සතු අයිතිවාසිකම්.

88. (1) අවසර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට,—

(අ) කාලය පිළිබඳ සීමාවක් නොමැතිව, පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම උපයෝගී කර ගැනීම මගින්, ශ්‍රී ලංකාවේ මුළු භූගෝලීය ප්‍රදේශ 81 (1) (අ) සහ (3) වන වගන්තියේ සඳහන් සියලුම ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් හෝ ශ්‍රී ලංකාවේ සම්පූර්ණ භූගෝලීය ප්‍රදේශය ඇතුළත කිරීමට අවසරලාභියාට හිමිකම තිබිය යුතු ය;

(ආ) අවසර ගිවිසුම යටතේ වූ තමාගේ අයිතිවාසිකම් පැවරීමට හෝ අන්සතු කිරීමට හෝ තෘතීය පාර්ශ්වකරුවන්ට අතුරු අවසර දීම් ප්‍රදානය කිරීමට හෝ අවසරලාභියාට හිමිකම නොතිබිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව පැවරීම්වලට හා අතුරු අවසරදීම්වලට, අදාළ විය යුතු ය.

අවසරදායී සතු අයිතිවාසිකම්.

89. (1) අවසර ගිවිසුමේ යම් පටහැනි විධිවිධානයක් නොමැති විට, අවසරදායී විසින් එකම පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසර දීම් ප්‍රදානය කිරීම හෝ 81 (1) (අ) සහ (3) වන වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් නැතහොත් සියලුම ක්‍රියා තමා විසින් ම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) අවසරය අනන්‍ය අවසරයක් බවට අවසර ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක සහ අවසරදායී විසින් එකම පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවත් අවසරදීම් ප්‍රදානය කරනු ලැබීම සඳහා හේ 81 (1) (අ) සහ (3) වන වගන්තියේ සඳහන් යම් ක්‍රියාවක් නැතහොත් සියලුම ක්‍රියා අවසරදායී විසින් ම කරනු ලැබීම සඳහා ඒ ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබේ නම් මිස, අවසරදායී විසින් එසේ තෘතීය පාර්ශ්ව කරුවන්ට අවසරදීම් ප්‍රදානය කිරීම හෝ ඒ වගන්තිවල සඳහන් ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතු ය.

අවසර ගිවිසුම්වල බලරහිත වගන්ති.

90. පේටන්ට් බලපත්‍රයේ හිමියා වෙත මේ කොටසින් පවරා ඇති අයිතිවාසිකම්වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම්, අවසර ගිවිසුමක යම් වගන්තියකින් හෝ කොන්දේසියකින් කාර්මික හෝ වාණිජ ක්ෂේත්‍රයෙහි ලා, අවසරලාභී වෙත පනවනු ලබන තාක් දුරට, ඒ අවසර ගිවිසුමේ ඒ වගන්තිය හෝ කොන්දේසිය බලරහිත හා ශූන්‍ය විය යුතු ය:

එසේ වුව ද—

(අ) පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම තම ප්‍රයෝජනය සඳහා උපයෝගී කර ගැනීම පිළිබඳ විෂය පථය, ප්‍රමාණය හෝ කාලය සම්බන්ධයෙන් වූ සීමා කිරීම් හෝ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම තම ප්‍රයෝජනය සඳහා උපයෝගී කරගනු ලැබිය හැකි භූගෝලීය ප්‍රදේශය පිළිබඳ සීමාකිරීම් හෝ පේටන්ට් බලපත්‍ර ලත් නව නිපැයුම තම ප්‍රයෝජනය සඳහා උපයෝගී කරගනු ලැබිය හැක්කේ

යම් නිශ්පාදිත සම්බන්ධයෙන් ද, ඒ නිශ්පාදිතවල තත්ත්වය හෝ ප්‍රමාණය පිළිබඳ සීමා කිරීම්; සහ

(ආ) පේටන්ට් බලපත්‍රයෙහි වලංගුභාවයට හානිකර විය හැකි සියලු ක්‍රියාවලින් වැළකී සිටින ලෙස අවසරලාභී වෙත පනවන ලද බැඳීම්,

එකී සීමාකිරීම්වලට ඇතුළත් වන ලෙස නොසැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම්පත්‍රයක් සාර්ථක නොවීමේ හෝ පේටන්ට් බලපත්‍රයක් බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵල.

91. අවසර ගිවිසුමේ කාලය ඉකුත්වීමට පෙර පේටන්ට් බලපත්‍රයක් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් පිළිබඳව හෝ ඒ ගිවිසුමේ සඳහන් වන පේටන්ට් බලපත්‍රය පිළිබඳව හෝ පහත දැක්වෙන යම් සිද්ධියක් එනම්:—

(අ) පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගනු ලැබීම:

(ආ) පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රය නිශ්චිත වශයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබීම;

(ඇ) පේටන්ට් බලපත්‍රය පවාරණය කරනු ලැබීම;

(ඈ) පේටන්ට් බලපත්‍රය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබීම; හෝ

(ඉ) බලපත්‍ර ගිවිසුම පිළිබඳ ලියාපදිංචිය නිර්බල කරනු ලැබීම්,

සිදු වූ අවස්ථාවක අවසර ගිවිසුම යටතේ අවසරදායී වෙත තවදුරටත් කිසිම ගෙවීමක් කරන ලෙස අවසරලාභීට නියම නොකළ යුතු අතර ඒ වන විට කර ඇති ගෙවීම් ආපසු ලබා ගැනීමට ද අවසරලාභීට හිමිකම් ලැබිය යුතු ය:

එසේ වුවද, සියලු අවස්ථානුගත කරුණු යටතේ එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම සාධාරණීය නොවන බව අවසරදායී විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට සහ, විශේෂයෙන්ම අවසරලාභීට අවසරය නිසා සිද්ධිදායක ලෙස ලාභයක් ලැබී තිබේ නම්, ඒ ආපසු ගෙවීම කිරීමට අවසරදායීට නියම නොකළ යුතු අතර, එසේ ඔප්පු කළ හැකි ප්‍රමාණයට, කොටසක් ආපසු ගෙවීම කරන ලෙස අවසරදායීට නියම කළ යුතු ය.

අවසර ගිවිසුමක් ඉකුත්වීම, අවසන් කිරීම හෝ නිර්බලවීම.

92. රෙජිස්ට්‍රාර්වරයා විසින්,—

(අ) සටහන් කරනු ලැබූ අවසර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති බවට හෝ ඒ ගිවිසුම අවසන කර ඇති බවට හෝ ඔහු සෑහීමට පත් වුවහොත්, ඒ බව ලේඛනයෙහි සටහන් කරන ලෙස එහි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ බව ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(ආ) මේ කොටසේ යම් විධිවිධානයක් යටතේ, අවසර ගිවිසුමක කාලය ඉකුත්වීම, ඒ ගිවිසුම අවසන කිරීම හෝ නිර්බලවීම ලේඛනයේ සටහන් කළ යුතු ය.

විදේශයක දී ගෙවීම් කිරීම අවශ්‍ය කරන අවසර ගිවිසුම්.

93. (1) (අ) විදේශයක දී ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් අවසර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක්; හෝ

(ආ) ඒ අවසර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොට ගෙන ඒ අවසර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලිය විල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයකට අදාළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම්දීමක් අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී අවසර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම හෝ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

XVIII වන පරිච්ඡේදය

පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම සහ පේටන්ට් බලපත්‍රයක බලරහිත බව

පේටන්ට් බලපත්‍රයක් පවාරණය කිරීම.

94. (1) පේටන්ට් බලපත්‍රයක හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබූ සහ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින්, ඒ හිමියා විසින් පේටන්ට් බලපත්‍රය පවාරණය කරනු ලැබිය හැකි ය.

(2) පවාරණය කිරීම, පේටන්ට් බලපත්‍රය පිළිබඳ හිමිකම් පෑම් අතුරෙන් එකකට හෝ වැඩි ගණනකට සීමා විය හැකි ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී ප්‍රකාශය ලැබුණු විට එය ලේඛනයෙහි සටහන් කළ යුතු අතර ඒ සටහන ගැසට් පත්‍රයෙහි පළ කිරීමට ද සැලැස්විය යුතු ය.

(4) එකී ප්‍රකාශය රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු දින සිට, ඒ පවාරණය කිරීම බලපැවැත්විය යුතු ය.

(5) පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් වූ අවසර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අවසර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති අවසරලාභී විසින් හෝ අතුරු අවසරලාභී විසින් හෝ කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතවම අවසර ගිවිසුමේ සඳහන් කර තිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම අවසරලාභියකු ම විසින් හෝ අතුරු අවසරලාභියකු ම විසින් හෝ එකී පවාරණය කිරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිස රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී පවාරණය කිරීම පිළි ගැනීම හෝ සටහන කිරීම හෝ නොකළ යුතු ය.

95. (1) නීත්‍යනුකූල සම්බන්ධතාවක් දක්වන යම් තැනැත්තකු විසින් හෝ පේටන්ට් බලපත්‍රයේ හිමියා ද සටහන් කරනු ලැබූ සෑම පැවරුම්ලාභියකුම ද රෙජිස්ට්‍රාර්වරයා ද ඇතුළුව, යම් නිසි බලධරයකු විසින් හෝ කරනු ලබන සහ සෑම අවසරලාභියකු හෝ අතුරු අවසරලාභියකුම ද පාර්ශ්වකරුවන් ලෙස සඳහන් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, අධිකරණය විසින් පහත දැක්වෙන එක් හේතුවක් නිසා හෝ ඊට වැඩි හේතු ගණනක් නිසා හෝ පේටන්ට් බලපත්‍රය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරනු ලැබිය හැකිය:— පේටන්ට් බලපත්‍රයක බලරහිත බව.

(අ) නව නිපැයුමක් ලෙස පේටන්ට් බලපත්‍රයෙහි හිමිකම් පාන ලද දෙය 59(1) වන වගන්තියේ අර්ථානුකූලව නව නිපැයුමක් නොවීම, හෝ 59(3) වන හෝ 76(1) වන වගන්තිය යටතේ ආරක්ෂාවෙන් බැහැර කරනු ලැබීම හෝ ඒ දෙය 60 සිට 63 දක්වා වූ වගන්තිවල සඳහන් නියමයන්ට අනුකූල නොවීම හේතුකොට ගෙන පේටන්ට් බලපත්‍ර ලබාගත නොහැකි වීම; හෝ

(ආ) විස්තරය හෝ හිමිකම් පෑම් 68(3) වන සහ (4) වන වගන්තියේ සඳහන් නියමයන්ට අනුකූල නොවීම; හෝ

(ඇ) හිමිකම් පාන ලද නව නිපැයුම අවබෝධ කර ගැනීම සඳහා අවශ්‍ය චිත්‍ර කිසිවක් ඉදිරිපත් කර නොතිබීම; හෝ

(ඈ) පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ තැනැත්තාට පේටන්ට් බලපත්‍ර අයිතිවාසිකම හිමි නොවීම:

එසේ වුව ද, පේටන්ට් බලපත්‍රය සඳහා අයිතිවාසිකම් තිබෙන තැනැත්තා වෙත පේටන්ට් බලපත්‍රය පවරා නොමැති නම් පමණක් මෙය අදාළ වේ.

(2) (අ) (1) වන උපවගන්තියේ විධිවිධාන හිමිකම් පෑම් කිහිපයකට පමණක් හෝ හිමිකම් පෑමක කොටස් කිහිපයකට පමණක් හෝ අදාළ වන අවස්ථාවක, ඒ හිමිකම් පෑම් හෝ හිමිකම් පෑමක ඒ කොටස් බලරහිත හා ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(ආ) හිමිකම් පෑමක කොටසක් බලරහිත බව ප්‍රකාශ කළ යුත්තේ ප්‍රස්තුත හිමිකම් පෑම අනුරූප ලෙස සීමාවන ආකාරයෙනි.

(3) (අ) පේටන්ට් බලපත්‍ර හිමියා සමඟ වූ යම් ගිවිසුමක හෝ එකඟවීමක යම් පටහැනි විධිවිධානයක් නොමැති විටක, අවස්ථාවෝචිත පරිදි (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රයට පාර්ශ්වකරුවකු කරනු ලැබූ, පැවරුම්ලාභියකුට, අවසරලාභියකුට හෝ අතුරු අවසරලාභියකුට, නඩුකටයුතුවලට හවුල්වීමේ හිමිකම තිබිය යුතු ය.

(ආ) (1) (ඈ) වන උපවගන්තියේ සඳහන් හේතුව මත අධිකරණය වෙත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, පේටන්ට් බලපත්‍රය සඳහා අයිති වාසිකම ඇතැයි කියනු ලබන තැනැත්තා වෙත ඉල්ලුම්කරු විසින් ඒ ඉල්ලුම් පත්‍රය පිළිබඳව දන්විය යුතු ය.

බලරහිත කිරීමේ දිනය හා ප්‍රතිඵලය.

96. (1) පේටන්ට් බලපත්‍රයක් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් බලරහිත බව ප්‍රකාශ කරමින් අධිකරණය විසින් අවසාන වශයෙන් තීරණය කරනු ලැබූ විටක, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කරනු ලැබූ දින සිට, අවස්ථාවෝචිත පරිදි, පේටන්ට් බලපත්‍රය සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් බලරහිත හා ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලරහිත කිරීමේ ප්‍රකාශයක් අවසානාත්මක වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ බව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු ය. එවිට රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී ප්‍රකාශය ලේඛනයේ සටහන් කළ යුතු අතර එය ගැසට් පත්‍රයේ පළ කිරීමට ද සැලැස්විය යුතු ය.

V වන කොටස

ලකුණු, ව්‍යාපාර නාම සහ අසාධාරණ තරඟය

XIX වන පරිච්ඡේදය

අර්ථකථන

අර්ථකථනය.

97. මේ කොටසේ කාර්ය සඳහා, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"සම්භව අභිධානය" යන්නෙන් යම් රටක, දිශාභාගයක හෝ ප්‍රදේශයක මූලාරම්භ වූ සහ නිෂ්පාදිතයේ තත්ත්වය සඳහා හෝ ආවේනික ලක්ෂණ සඳහා හුදෙක් හෝ අවශ්‍යයෙන් ම, ස්වාභාවික සහ මානව සාධක ඇතුළුව, භූගෝලීය පරිසරය හේතුභූත වූ නිෂ්පාදිතයක් නම් කිරීමෙහි ලා උපයෝගී වන්නා වූ, ඒ රටේ, දිශාභාගයේ හෝ ප්‍රදේශයේ භූගෝලීය නම අදහස් වේ;

"සාමූහික ලකුණ" යන්නෙන් එවැන්නක් ලෙස නම් කරනු ලබන්නා වූ ද ලියාපදිංචි හිමියාගේ පාලනය යටතේ ලකුණ පාවිච්චි කරන විවිධ ව්‍යවසායන්ගේ භාණ්ඩවල හෝ සේවාවල සම්භවය හෝ වෙන යම් පොදු ආවේණික ලක්ෂණයක් වෙන් කොට දැක්වීමෙහි ලා උපයෝගී වන්නා වූ ද යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන් කවර ස්ථානයක හෝ ලියාපදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සහ කවර හෝ ව්‍යාපාර කටයුත්තක යෙදී සිටින හෝ යෙදීමට අදහස් කරන, සමාගම් හෝ සමුපකාර සමිති හෝ වෙළෙඳ ව්‍යාපාර සම්බන්ධයෙන් තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ නොලැබූ, යම් වෙළෙඳ ව්‍යාපාර

යක්, කර්මාන්තයක් හෝ පුද්ගලයකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ සමාගමක් විසින් හෝ සමුපකාර සමිතියක් විසින් හෝ කරනු ලබන වෙනත් කටයුත්තක් අදහස් වන අතර, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යන ආණ්ඩුවේ හෝ යම් රාජ්‍ය සංස්ථාවක යම් ව්‍යාපාරයක් ද ඊට ඇතුළත් වේ;

"ව්‍යාජ වෙළෙඳ විස්තරය" යන්නෙන් වෙළෙඳ විස්තරය අදාළ වන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් වූ වැදගත් කරුණක් පිළිබඳ ව්‍යාජ හෝ නොමඟ යවන සුලු වෙළෙඳ විස්තරයක් අදහස් වන අතර එකතු කිරීමකින්, මකා දැමීමෙන් හෝ අන්‍යාකාරයකින් වෙළෙඳ විස්තරයක් වෙනස් කිරීම නිසා වැදගත් කරුණක් සම්බන්ධයෙන් ඒ විස්තරය ව්‍යාජ හෝ නොමඟ යවන සුලු බවට පත් කෙරෙන අවස්ථාවක, ඒ වෙනස් කිරීම ද ඊට ඇතුළත් වේ; තව ද, යම් වෙළෙඳ විස්තරයක් වෙළෙඳ ලකුණක් වීම හෝ වෙළෙඳ ලකුණක කොටසක් වීම, ඒ වෙළෙඳ විස්තරය මේ කොටසේ අර්ථානුකූලව ව්‍යාජ වෙළෙඳ විස්තරයක් බවට පත් වීම වැළැක්වෙන හේතුවක් නොවිය යුතු ය;

"භාණ්ඩ" යන්නෙන් වෙළෙඳාමට හෝ සැදීමට විෂය වන හෝ වෙළෙඳ බඩු වන හෝ යම් දෙයක් අදහස් වන අතර සේවා වන් ද ඊට ඇතුළත් වේ;

"ප්‍රභවය පිළිබඳ සංඥාව" යන්නෙන් නිෂ්පාදිතයක් හෝ සේවා වක් එක්තරා රටක හෝ රටවල් සමූහයක, දිශාභාගයක හෝ ප්‍රදේශයක මූලාරම්භ වූ බවට සංඥාවක් කිරීමට පාවිච්චි කරනු ලබන යම් යෙදුමක් හෝ ලාංඡනයක් අදහස් වේ;

"ලකුණ" යන්නෙන් වෙළෙඳ ලකුණක් හෝ සේවා ලකුණක් අදහස් වේ;

"නම" යන්නට නාමක යම් සංක්ෂිප්තයක් ඇතුළත් වේ;

"තැනැත්තා", "සාදන්නා", "බෙදන්නා", හෝ "වෙළෙන්දා" සහ "හිමියා" යන්නට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

"සේවා ලකුණ" යන්නෙන් එක් ව්‍යවසායක සේවාවන්, වෙනත් ව්‍යවසායන්ගේ සේවාවන්ගෙන් වෙන්කර දැක්වීම පිණිස උපයෝගී කරගනු ලබන යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ;

"වෙළෙඳ විස්තරය" යන්නෙන්—

(අ) භාණ්ඩ කිසිවක සංඛ්‍යාව, ප්‍රමාණය, මිම්ම, ආමානය හෝ බර; හෝ

(ආ) භාණ්ඩ කිසිවක් සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද ස්ථානය හෝ රට; හෝ

(ඇ) භාණ්ඩ කිසිවක් සැදීමේ හෝ නිෂ්පාදනය කිරීමේ ක්‍රමය; හෝ

(ඈ) භාණ්ඩ කිසිවක් සංයුක්ත කරනු ලැබූ ද්‍රව්‍ය; හෝ

(ඉ) පවත්නා ප්‍රකාශන අයිතියක, කර්මික සැලසුමක හෝ පේටන්ට් බලපත්‍රයක විෂය වූ භාණ්ඩ කිසිවක්; හෝ

(ඊ) සේවාවන්ගේ තත්ත්වය, වර්ගය හෝ ස්වභාවය; හෝ

(උ) වෙළෙඳාමෙහි ලා පොදුවේ භාවිත කෙරෙන හෝ පිළිගත් වර්ගීකරණයක් අනුව භාණ්ඩ කිසිවක තත්ත්ව ප්‍රමිතිය; හෝ

(ඌ) භාණ්ඩ කිසිවක පරමාර්ථය සඳහා සුදුසුකම, ප්‍රබලතාව, කාර්ය ඉටු කිරීම හෝ ක්‍රියාකාරිත්වය

පිළිබඳව කෙළින් ම හෝ අනාඥාකාරයකින් කරනු ලබන යම් විස්තරයක්, ප්‍රකාශයක් හෝ වෙනත් සංඥාවක් අදහස් වන අතර වෙළෙඳ චාරිත්‍රය අනුව, ඉහත සඳහන් කරුණුවලින් කිසිවක් පිළිබඳ සංඥාවක් ලෙස පොදුවේ පිළිගනු ලබන යම් රූපයක්, වචනයක් හෝ ලකුණක් භාවිත කිරීම මේ කොටසේ අර්ථානුකූලව වෙළෙඳ විස්තරයක් ලෙස සැලකිය යුතු ය;

"වෙළෙඳ ලකුණ" යන්නෙන් එක් ව්‍යවසායක භාණ්ඩ වෙනත් ව්‍යවසායන්ගේ භාණ්ඩවලින් වෙන් කොට දැක්වීමෙහි ලා උපයෝගි කර ගනු ලබන යම් දෘශ්‍යමාන ලාංඡනයක් අදහස් වේ; තව ද

"ව්‍යාපාර නාමය" යන්නෙන් ස්වාභාවික හෝ නෛතික පුද්ගලයකුගේ ව්‍යවසාය හඳුනා ගැනීමේ නාමය හෝ සංඥා නාමය අදහස් වේ.

XX වන පරිච්ඡේදය

ලකුණුවල ආවේශ්‍යතාව

ලකුණුවල ආවේශ්‍යතාව.

98. (1) මේ කොටසින් පවරනු ලබන ලකුණක අනන්‍ය අයිති වාසිකම, පහත දැක්වෙන විධිවිධානවලට යටත්ව, ලියාපදිංචි කිරීමෙන් අත්කර ගත යුතු ය.

(2) විධිමත් ඉල්ලුම් පත්‍රයක් සඳහා වූ කොන්දේසි ප්‍රථමයෙන් ම සපුරා ඇති තැනැත්තාට හෝ ඒ ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් අත්‍යන්ත ප්‍රමුඛත්වයට විධිමත් ලෙස හිමිකම් ප්‍රථමයෙන් දක්වන තැනැත්තාට හෝ පමණක් ලකුණක් ලියාපදිංචි කිරීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.

(3) ස්වාභිමත හෝ කාල්පනික සංඥා නාම, නාම, ව්‍යාජ නාම, භූගෝලීය නාම, උද්‍යෝග පාඨ, උපක්‍රම, ප්‍රලම්භතාවන්, අකුරු, අංක, ලේඛල, කවර, විග්න, මුද්‍රණ, මුද්‍රා, සිල් සලකුණු, ලතාකර්ම, වාරි, ගැට සහ දාර, භාණ්ඩවල හෝ බඳුන්වල වර්ණ සහ හැඩ සංයෝග

කිරීම් හෝ සංයෝජනය කිරීම් ආදියෙන් සමන්විත ලකුණු, 99 වන සහ 100 වන වගන්ති යටතේ අනාවේක්ෂා කරනු නොලබන්නේ නම්, ලකුණු ඒවායින් සමන්විත විය හැකි ය.

විෂය මූලික හේතු නිසා ආවේක්ෂා කළ නොහැකි ලකුණු.

99. (1) (අ) භාණ්ඩවල හෝ සේවාවල නෛසර්ගික ස්වභාවය නිසා, හෝ ඒවායේ කාර්මික ක්‍රියාකාරිත්වය නිසා හෝ ඇතිවන හැඩවලින් හෝ ස්වරූපවලින් සමන්විත ලකුණක්;

(ආ) වෙළෙඳාම කෙරෙන අතරතුර, ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල වර්ගය, තත්ත්වය, ප්‍රමාණය, අභිප්‍රේත කාර්යය, වටිනාකම, සම්භව ස්ථානය, නිෂ්පාදන හෝ සම්පාදන කාලය දැක්වීමෙහි ලා උපයෝගි විය හැනි හුදෙක් ලාංඡනයකින් හෝ සංඥුවකින් සමන්විත ලකුණක්;

(ඇ) ප්‍රවර්තන භාෂා ව්‍යවහාරය අනුව හෝ නිර්ව්‍යාජ සහ ශ්‍රී ලංකාවේ සම්මත වෙළෙඳ සිරිත් අනුව, ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල චාරිත්‍රානුකූල සංඥු නාමයක් වී ඇති හුදු ලාංඡනයකින් හෝ සංඥුවකින් සමන්විත ලකුණක්;

(ඈ) වෙනත් හේතූන් නිසා, එක් ව්‍යවසායක භාණ්ඩ හෝ සේවා අනෙක් ව්‍යවසායන්ගේ භාණ්ඩවලින් හෝ සේවාවලින් වෙන් කොට දැක්වීමේ හැකියාව නොමැති ලකුණක්;

(ඉ) ගර්හනීය සැලසුමකින් සමන්විත වූ හෝ සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ අධිකරණයේ මතය අනුව යම් ජන කොට්ඨාසයක ආගමික හෝ වාර්ගික හැඟීම් පෑරවිය හැකි හෝ ලකුණක්;

(ඊ) ප්‍රස්තුත භාණ්ඩවල හෝ සේවාවල ස්වභාවය, ප්‍රභවය, ඒවා සෑදීමේ ක්‍රියාවලිය, ඒවායේ ආවේණික ලක්ෂණ නැතහොත් ඒවා අවශ්‍ය කාර්යය සඳහා ඒවායේ සුදුසුකම සම්බන්ධයෙන් වෙළෙඳ අංශ හෝ මහජනයා නොමඟ යැවිය හැකි ලකුණක්;

(උ) පුද්ගලයකුගේ හෝ ව්‍යවසායක නම විශේෂ හෝ නිශ්චිත ආකාරයකින් නිරූපණය නොකරන ලකුණක්;

(ඌ) ලකුණේ සාමාන්‍ය අර්ථය අනුව භූගෝලීය නමක් හෝ පෙළපත් නමක් වන ලකුණක්;

(එ) යම් රාජ්‍යයක හෝ රාජ්‍යයන් අතර වූ යම් අන්තර් ජාතික සංවිධානයක හෝ අන්තර් ජාතික සම්මුතියක් මගින් පිහිටුවන ලද යම් සංවිධානයක නිසි බලධරයා විසින් බලය දෙනු ලැබුවහොත් හැර, ඒ රාජ්‍යයේ හෝ ඒ අන්තර් ජාතික සංවිධානයේ

යුද්ධෝපකරණ, ධ්වජ හෝ වෙනත් චිහ්න, මුල් අකුරු, නම් හෝ සංක්ෂිප්ත නම් නැවත යොදන හෝ අනුකරණය කරන ලකුණක්;

(ඒ) යම් රාජ්‍යයක නිසි බලධරයා විසින් බලය දෙනු ලැබුවහොත් හැර, ඒ රාජ්‍යයේ නිල ලාංඡන හෝ පාරිශුද්ධි මුද්‍රා නැවත යොදන හෝ අනුකරණය කරන ලකුණක්;

(ඔ) ලකුණක් හෝ සාමූහික ලකුණක් පිළිබඳ ලියාපදිංචි යෙහි කාලය ඉකුත් වී, යළි එය අලුත් කර නොමැති හෝ එය අත් හැරීම, ඉවත් කිරීම හෝ බල රහිත කිරීම ප්‍රස්තුත ලකුණ ඉදිරිපත් කිරීමට පෙර අවුරුදු දෙකක් වූ කාල සීමාවක් තුළ ලේඛනයේ සටහන් කරනු ලැබ ඇති අවස්ථාවක, මහජනයා නොමඟ යැවිය හැකි ආකාරයෙන් ඒ ලකුණට හෝ සාමූහික ලකුණට සමාන පෙනුමක් ඇති ලකුණක්;

(ඕ) නියම කරනු ලැබිය හැකි වෙන යම් වචනවලින් හෝ නිර්වචනවලින් සමන්විත ලකුණක්,

ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ), (ඈ), (ඊ), (උ) සහ (ඌ) ඡේදවල විධිවිධාන අදාළ කිරීමේ දී, රෙජිස්ට්‍රාර්වරයා විසින් අවස්ථානුගත කරුණු සියල්ල ගැනත්, විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවෙහි දී හෝ වෙනත් රටවල දී ලකුණු පාවිච්චි කරනු ලැබ ඇති කාලය ගැනත්, ලකුණ වෙනත් රටවල සහ වෙළෙඳ අංශවල විශේෂණීය ලකුණක් ලෙස සලකනු ලැබීම ගැනත් සැලකිල්ල දැක්විය යුතු ය.

තෘතීය පාර්ශ්වික අයිතිවාසිකම් නිසා ආවේශය කළ නොහැකි ලකුණු.

100. (1) (අ) එකම භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවකු විසින් එවකටත් විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද හෝ එකම භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් විධිමත් ලෙස ප්‍රමුඛත්වයට හිමිකම් පාන තැනැත්තකු විසින් තදනන්තරව ඉදිරිපත් කරන ලද ලකුණකට මහජනයා නොමඟ යැවිය හැකි ආකාරයේ, සමාන පෙනුමක් ඇති ලකුණක් හෝ වෙනත් යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ඒ ලකුණ පාවිච්චි කිරීම නිසා මහජනයා නොමඟ යාමට ඉඩ නිබෙන අවස්ථාවක, ඒ වෙනත් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවකු විසින් එවකටත් විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද හෝ ලියාපදිංචි කරන ලද හෝ ඒ වෙනත් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් විධිමත් ලෙස ප්‍රමුඛත්වයට හිමිකම් පාන තැනැත්තකු විසින් තදනන්තරව ඉදිරිපත් කරන ලද ඒ ලකුණට, මහජනයා නොමඟ යැවිය හැකි ආකාරයෙන් සමාන පෙනුමක් ඇති ලකුණක්;

(ආ) ලියාපදිංචි නොකරන ලද ලකුණක් අනන්‍ය හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවකු විසින් ශ්‍රී ලංකාවෙහි දී කලින් පාවිච්චි කරනු ලැබූ බව ඉල්ලුම්කරු දන්නේ නම් හෝ නොදැන සිටිය නොහැකි වන්නේ නම්, එසේ පාවිච්චි කරන ලද ඒ ලකුණට මහජනයා නොමඟ යැවිය හැකි ආකාරයෙන් සමාන වන ලකුණක්;

(ඇ) ව්‍යාපාර නාමයක් එවකටත් ශ්‍රී ලංකාවේ දී තෘතීය පාර්ශ්වකරුවකු විසින් පාවිච්චි කරනු ලැබූ බව ඉල්ලුම්කරු දන්නේ නම් හෝ නොදැන සිටිය නොහැකි වන්නේ නම්, එසේ පාවිච්චි කරන ලද ඒ වෙළෙඳ නාමයට මහජනයා නොමඟ යැවිය හැකි ආකාරයෙන් සමාන වන ලකුණක්;

(ඈ) ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ වූ ද තෘතීය පාර්ශ්වකරුවකු සතු වූ ද ලකුණක හෝ වෙළෙඳ නාමයක මහජනයා නොමඟ යැවිය හැකි, සම්පූර්ණ හෝ කොටසක් වශයෙන් නැවත යෙදීමකින්, අනුකරණයකින්, පරිවර්තනයකින් හෝ පිටපත් කිරීමකින් සංයුක්ත වන ලකුණක්;

(ඉ) වෙනත් තෘතීය පාර්ශ්වික අයිතිවාසිකම් උල්ලංඝනය කරන හෝ අසාධාරණ තරඟය වැළැක්වීමට අදාළ XXIX වන පරිච්ඡේදයේ විධිවිධාන වලට පටහැනි ලකුණක්;

(ඊ) ලකුණේ හිමිකරු වූ තෘතීය පාර්ශ්වකරුවකුගේ වෙනත් රටක අනුයෝජිතයකු හෝ නියෝජිතයකු විසින්, තම ක්‍රියාව සාධාරණ බව ඔප්පු කරනු ලැබුවහොත් හැර, ඒ අයිතිකරුගේ අවසරය නොමැතිව, ඉදිරිපත් කරනු ලබන ලකුණක්,

ලියාපදිංචි කරනු නො ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල විධිවිධාන අදාළ කිරීමේ දී, එහි සඳහන් තෘතීය පාර්ශ්වකරුවන් විසින්, ඒ ලකුණ ලියා පදිංචි කිරීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලැබ ඇති බව රෙජිස්ට්‍රාර්වරයා විසින්, සැලකිල්ලට ගත යුතු ය.

භාරයක් ලේඛනගේ පටහැන් නොකළ යුතු බව.

101. යම් ප්‍රකාශිත, ගම්‍යමාන හෝ අනුමිත භාරයක් පිළිබඳ කිසි දැනුම්දීමක් ලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ එවැනි යම් දැනුම්දීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් භාරගනු ලැබීම නොකළ යුතු ය.

XXI වන පරිච්ඡේදය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු සහ ලියාපදිංචිය පිළිබඳ කාර්ය පටිපාටිය

ඉල්ලුම් පත්‍රයට අදාළ අවශ්‍ය කරුණු

102. (1) ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ආකෘතියෙහි ලා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. තව ද එහි පහත දැක්වෙන කරුණු අඩංගු විය යුතු ය:—

(අ) ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලීමක්;

(ආ) ඉල්ලුම්කරුගේ නම, ලිපිනය සහ විස්තරය හා ඉල්ලුම්කරු වාසය කරන්නේ ශ්‍රී ලංකාවෙන් පිටත නම්, ලිපි භාරදීම සඳහා ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනයක්;

(ඇ) ලකුණේ නිරූපණයක පිටපත් හතරක්;

(ඈ) නියම කළ හැකි, අන්තර්ජාතික වර්ගීකරණයෙහි අනුරූප පන්තිය හෝ පන්ති පිළිබඳ සංඥුවක් සහිතව, ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලුම් කරනු ලැබුවේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩවල හෝ සේවා පිළිබඳ පැහැදිලි හා සම්පූර්ණ ලැයිස්තුවක්.

(2) ඉල්ලුම් පත්‍රය අනුයෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් ඒ අනුයෝජිතයා වෙත ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් ඒ ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුවද ඉල්ලුම්කරුගේ අන්සතු නිත්‍යානුකූල කිරීමක් හෝ සහතික කිරීමක් අවශ්‍ය නොවිය යුතු ය.

ප්‍රමුඛත්වය පිළිබඳ අයිතිවාසිකම්.

103. සම්මුති රටක දී කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ඇති ප්‍රමුඛත්වය තමන්ට ලබා ගැනීමට අපේක්ෂා කරන, ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන්නකු විසින් කලින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයේ දිනයෙහි සිට මාස හයක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි දිනය සහ අංකය ද, ඉල්ලුම්කරුගේ නම සහ ඔහු විසින් හෝ කලින් අයිතිකරු විසින් හෝ ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලැබූ රට ද දැක්වෙන ලිඛිත ප්‍රකාශයක් තම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය. තවද, ශ්‍රී ලංකාවේ දී පසුව ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයෙහි දින සිට මාස තුනක් වූ කාලසීමාවක් ඇතුළත, කලින් වූ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ලද රටෙහි නිසි බලධරයා විසින් නිවැරදි බවට සහතික කරන ලද ඒ කලින් වූ ඉල්ලුම් පත්‍රයෙහි පිටපතක් ඒ ඉල්ලුම්කරන්නා විසින් සැපයිය යුතු ය.

අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ප්‍රදර්ශනය කරනු ලබන ලකුණක් සඳහා තාවකාලික ආරක්ෂාව.

104. (1) නිල වශයෙන් වූ හෝ නිල වශයෙන් පිළිගනු ලැබූ හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී, යම් ලකුණක් දරන භාණ්ඩ ප්‍රදර්ශනය කළ හෝ යම් ලකුණක් යටතේ සේවා කිසිවක් ඉටු කළ හෝ තැනැත්තකු විසින් ඒ ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී සහ ඒ ලකුණ ලියාපදිංචි කරන ලෙස ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රථමවරට එහි ප්‍රදර්ශනයේ දී ප්‍රදර්ශනය කළ දින සිට නැතහොත් ඒ ලකුණ යටතේ

ප්‍රථමවරට එකී ප්‍රදර්ශනයේ දී සේවා ඉටු කළ දින සිට මාස හයක් ඇතුළත ඉල්ලුම් කරන ලද අවස්ථාවක දී, ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රථමවරට ප්‍රදර්ශනය කළ දිනය හෝ ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ යටතේ ප්‍රථමවරට සේවා ඉටු කළ දිනය, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කළ දිනය ලෙස සලකන ලෙස ඔහු ඉල්ලා සිටි විට, එසේ සැලකිය යුතු ය.

(2) ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ දරන භාණ්ඩ ප්‍රදර්ශනය කළ බවට හෝ ඒ ප්‍රදර්ශනයේ දී ඒ ලකුණ යටතේ සේවා ඉටු කළ බවට හෝ සාක්ෂි ඉදිරිපත් කිරීම, ප්‍රදර්ශනයේ දී ඒ භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ඒ ලකුණ ප්‍රථමවරට පාවිච්චි කළ දිනය සඳහන් කර, ඒ ප්‍රදර්ශනයේ නිසි බලධරයා විසින් නිකුත් කරන ලද සහතිකයක් මගින් කළ යුතු ය.

(3) ඉල්ලුම්කරු විසින් හිමිකම් පාන ලද වෙනත් යම් ප්‍රමුඛත්ව කාල සීමාවකට (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

ඉල්ලුම් පත්‍ර ගාස්තුව.

105. නියමිත ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයාට ගෙවා තිබුණහොත් මිස, ලකුණක් ලියා පදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් භාර නොගත යුතු ය.

ඉල්ලුම් පත්‍රයහි ආකෘතිය පිළිබඳ පරීක්ෂණය.

106. (1) ඉල්ලුම් පත්‍රය 102 වන සහ 105 වන වගන්තිවලටත්, 103 වන සහ 104 වන වගන්ති අදාළ වන අවස්ථාවක ඒ වගන්තිවලටත් අනුකූලවේ දැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් පරීක්ෂා කර බැලිය යුතු ය.

(2) ඉල්ලුම් පත්‍රය 102 වන සහ 105 වන වගන්තිවලට අනුකූල නොවන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලකුණ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය:

එසේ වුව ද, ඉල්ලුම් පත්‍රයේ ඇති යම් දෝෂයක් ප්‍රථමයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුට දැනුම් දී, ඒ දැන්වීම ලැබී මාස තුනක් ඇතුළත දී ඒ දෝෂය නිදොස් කිරීමට අවස්ථාවක් ඉල්ලුම්කරුට ලබා දිය යුතු ය.

(3) ඉල්ලුම් පත්‍රය 103 වන වගන්තියට හෝ 104 වන වගන්තියට හේ අනුකූල නොවන අවස්ථාවක, හිමිකම් පාන ලද ප්‍රමුඛත්වය පිළිබඳ කිසිදු සඳහනක් ඒ ලකුණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් නොකළ යුතු ය.

(4) ඉල්ලුම් පත්‍රය 103 වන වගන්තියට සහ 104 වන වගන්තියට අනුකූල වන අවස්ථාවක, හිමිකම් පාන ලද ප්‍රමුඛත්වය හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ඒ ලකුණ සහතික කොට පාවිච්චි කරන ලද දිනය, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් සටහන් කළ යුතු ය.

(5) යම් ලකුණක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී, ඉල්ලුම්කරු ඉල්ලා සිටිය හොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් තම තීරණයට හේතු ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

වැඩිදුරටත් පරීක්ෂා කිරීමෙන් පසු ලකුණ ලියාපදිංචි කිරීම හා ලකුණ පළ කිරීම.

107. (1) ඉල්ලුම් පත්‍රය 102 වන හා 105 වන වගන්තිවලට අනුකූල වන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් 99 වන සහ 100 වන වගන්තිවල විධිවිධානවලට අදාළව, ලකුණ පරීක්ෂා කළ යුතු ය.

(2) 99 වන වගන්තිය හෝ 100 වන වගන්තිය හෝ යටතේ ලකුණ ආවේශ්‍ය කළ නොහැකි අවස්ථාවක දී, ඒ බව, ඒ ලකුණ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු ද ලියවිල්ලකින් සඳහන් කරමින්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් දැන්වීමෙහි රෙජිස්ට්‍රාර්වරයා විසින් සඳහන් කරන ලද හේතු සියල්ල ම ගැන හෝ ඉන් කිසිවක් ගැන හෝ ඉල්ලුම්කරු අතෘප්තියට පත් වන අවස්ථාවක දී, ඔහු විසින් එකී ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව තමා දක්වන කරුණු, ඒ දැන්වීමේ දින සිට මාසයක් ඇතුළත, රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

(4) රෙජිස්ට්‍රාර්වරයා වෙත ඒ කරුණු ඉදිරිපත් කරනු ලැබූ විට, විභාගයකට පෙනී සිටීමේ අවස්ථාව රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුට ලබා දිය යුතු අතර ඒ විභාගය පවත්වන දිනය සහ වේලාව ද ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු ය.

(5) රෙජිස්ට්‍රාර්වරයා විසින් සුදුසුයයි තමා අදහස් කරන පරීක්ෂණයකින් පසුව, ඒ ලකුණ ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එසේ නැතහොත් ඔහු විසින් ඒ ඉල්ලුම් පත්‍රය සම්පූර්ණයෙන් ම හෝ, කොන්දේසිවලට, සංශෝධනවලට හෝ වෙනස්කිරීම්වලට යටත්ව හෝ පාවිච්චි කළ යුතු ආකාරය හෝ ස්ථානය හෝ වෙනත් කරුණක් හෝ පිළිබඳව පැනවීම සුදුසු යයි ඔහුට හැඟී යා හැකි සීමාකිරීම් කිසිවක් වේ නම් ඒවාට ද යටත්ව, පිළිගනු ලැබිය හැකි ය.

(6) ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක හෝ කොන්දේසිවලට යටත්ව පිළිගනු ලැබූ විටක, ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත්, රෙජිස්ට්‍රාර්වරයා විසින් තම තීරණයට හේතු ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය.

(7) ලකුණ 99 වන වගන්තිය හෝ 100 වන වගන්තිය හෝ යටතේ ආවේශ්‍ය කළ හැකි යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන අවස්ථාවක, ඉල්ලුම් පත්‍රය පළ කිරීම සඳහා නියමිත ගාස්තුව මාස දෙකක කාලසීමාවක් ඇතුළත දී ගෙවන ලෙස රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(8) ඉල්ලුම් පත්‍රය පළ කිරීම සඳහා වූ ගාස්තුව නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ ලකුණ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(9) පළ කිරීම සඳහා වූ ගාස්තුව නියමිත කාල සීමාව ඇතුළත ගෙවනු ලැබුවහොත්, ඉල්ලුම් පත්‍රයෙහි දිනය, ලකුණේ නිරූපණය, ලකුණ ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිනු ලැබුවේ යම් භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ සේවා, අනුරූප පන්තිය හෝ පන්ති ද සඳහන් කරමින්, ඉල්ලුම්කරුගේ නම සහ

ලිපිනය සහ ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ශ්‍රී ලංකාව තුළ ඔහුට ලියුම් භාර දිය හැකි තැපැල් ලිපිනයක්, හිමිකම් පාන ලද ප්‍රමුඛත්වයක් තිබේ නම්, එය හෝ අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී ඒ ලකුණ සහතික කොට පාවිච්චි කරන ලද දිනය යන මේ කරුණු සඳහන් කරමින්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම් පත්‍රය පළ කිරීමට කටයුතු කළ යුතු ය.

(10) 99 වන හෝ 100 වන වගන්තියේ සඳහන් හේතු එකක් හෝ කිපයක් හෝ නිසා ඒ ලකුණ ආවේශ්‍ය කළ නොහැකි යයි යම් තැනැත්තකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඒ ලකුණ ලියාපදිංචි කිරීම පිළිබඳව නියමිත ආකෘතියේ වූ තම විරෝධය දැක්වෙන දැන්වීමක්, ඒ විරෝධයට හේතු ද දක්වමින්, නියමිත ගාස්තුව ද සමග, එකී ඉල්ලුම් පත්‍රය පළ කරන ලද දින සිට මාස තුනක් ඇතුළත දී, රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් ලැබිය හැකි ය.

(11) විරෝධය දක්වන දැන්වීම (10) වන උපවගන්තියේ සඳහන් කාල සීමාව තුළ දී රෙජිස්ට්‍රාර්වරයා වෙත නොලැබුණ අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලකුණ ලියාපදිංචි කළ යුතු ය.

(12) නියමිත ආකෘතියෙහි වූ විරෝධය දක්වන දැන්වීම නියමිත ගාස්තුව ද සමඟ, (10) වන උපවගන්තියෙහි සඳහන් කාල සීමාව තුළ දී රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු අවස්ථාවක, ඒ විරෝධයට හේතුවල පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරු වෙත යවා, ඒ හේතු පිළිබඳ තම නිරීක්ෂණ මාස තුනක් ඇතුළත දී ලියවිල්ලකින් ඉදිරිපත් කරන ලෙස ද ඉල්ලුම්කරුගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(13) ඉල්ලුම්කරුගේ නිරීක්ෂණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු විට, කරුණු විභාග කිරීම අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලැබුවහොත්, පාර්ශ්වකරුවන්ගෙන් කරුණු විභාග කිරීමෙන් පසු, ඒ ලකුණ ලියාපදිංචි කළ හැකි ද නොහැකි ද යන්න රෙජිස්ට්‍රාර්වරයා විසින් හැකි තාක් ඉක්මණින් තීරණය කළ යුතු ය. ලකුණ ලියාපදිංචි කළ හැකි යයි ඔහු තීරණය කළහොත් ඒ අනුව ඔහු විසින් ඒ ලකුණ ලියාපදිංචි කළ යුතු ය.

(14) මේ වගන්තිය යටතේ යම් ක්‍රියාවක් කළ යුතුව ඇත්තේ හෝ යම් ගාස්තුවක් ගෙවිය යුතුව ඇත්තේ යම් නියමිත කාල සීමාවක් තුළ ද ඒ නියමිත කාල සීමාව රෙජිස්ට්‍රාර්වරයා විසින් යුක්ති සහගත කාලයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචිය සම්පූර්ණ කොකිරීම.

108. ඉල්ලුම් පත්‍රය රෙජිස්ට්‍රාර්වරයා වෙත ලැබුණු දින සිට මාස දෙළහක් තුළ දී, යම් ලකුණක් ලියාපදිංචි කිරීම, ඉල්ලුම්කරුගේ පැහැර හැරීමක් හේතු කොට ගෙන, සම්පූර්ණ කර නොමැති අවස්ථාවක, සම්පූර්ණ නොකිරීම පිළිබඳ ලියවිල්ලකින් වූ සහ නියමිත ආකෘතියේ වූ දැන්වීමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරු වෙත යැවීමෙන් පසු, තත් කාර්යය සඳහා ඉඩ දී ඇති කාලය තුළ දී එය සම්පූර්ණ කළහොත් හැර, ඒ ඉල්ලුම් පත්‍රය අත්හැර දමනු ලැබුවක් ලෙස සලකනු ලැබිය හැකි ය.

ලකුණු ලේඛනය සහ සහතික නිකුත් කිරීම.

109. (1) ලකුණු ලේඛනය යනුවෙන් හඳුන්වන ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් තබා, පවත්වා ගෙන යා යුතු අතර, සියලුම ලියාපදිංචි ලකුණු සහ ඒ ලකුණුවලට අදාළව සටහන් කළ යුතු යයි මේ කොටසින් බලය දී ඇති හෝ විධාන කර ඇති හෝ කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් කරුණු, ඒ ලකුණු ලියාපදිංචි කළ අනුපිළිවෙල අනුව, ඒ ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

(2) ලකුණක ලියාපදිංචියට ඒ ලකුණෙහි නිරූපනයක් ද ඇතුළත් විය යුතු අතර, එහි අංකය, ලියාපදිංචි හිමියාගේ නම සහ ලිපිනය ද ලියාපදිංචි හිමියාගේ ලිපිනය ශ්‍රී ලංකාවෙන් පිටත එකක් නම්, ශ්‍රී ලංකාව තුළ ලියුම් භාර දිය හැකි තැපැල් ලිපිනයක් ද, ඉල්ලුම් පත්‍රයෙහි දිනය සහ ලියාපදිංචි කළ දිනය ද ප්‍රමුඛත්වයට විධිමත් ලෙස හිමිකම් පා තිබේ නම් ඒ බවට සටහනක් සහ ඒ ප්‍රමුඛත්වයට හිමිකම් පානු ලැබුවේ යම් ඉල්ලුම් පත්‍රයක් පදනම් කොට ගෙන ද ඒ ඉල්ලුම් පත්‍රයෙහි අංකය, දිනය සහ රට ද යම් ලකුණක් අන්තර් ජාතික ප්‍රදර්ශනයක දී පාවිච්චි කළ බවට විධිමත් සහතිකයක් ඉදිරිපත් කර තිබේ නම් ඒ සහතිකයේ අඩංගු කරුණු ද අනුරූප පන්තිය හෝ පන්ති හෝ පිළිබඳ සංඥුවක් ද සමඟ, ඒ ලකුණ ලියාපදිංචි කිරීමට ඉඩ දෙන ලද්දේ යම් භාණ්ඩ සහ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සහ සේවා පිළිබඳ ලැයිස්තුවක් ද ඒ ලියාපදිංචියේ සඳහන් කළ යුතු ය.

(3) ලකුණක් ලියාපදිංචි කිරීමෙන් පසු, ඒ ලියාපදිංචිය පිළිබඳ සහතිකයක් ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා වෙත රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ යුතු අතර, ලියාපදිංචි හිමියා විසින් ඉල්ලා සිටි විටක, අන්තිමවරට සටහන් කර ගෙන ඇති ශ්‍රී ලංකාවේ ඔහුගේ තැපැල් ලිපිනයට හෝ ඔහු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම් ඔහුට ලියුම් භාර දීම සඳහා අන්තිමවරට සටහන් කර ගෙන ඇති ශ්‍රී ලංකාවේ තැපැල් ලිපිනයට හෝ ලියාපදිංචි තැපෑලෙන් ඒ සහතිකය රෙජිස්ට්‍රාර්වරයා විසින් ඔහුට යැවිය යුතු ය.

ලියාපදිංචි ලකුණු පළ කිරීම.

110. සියලුම ලියාපදිංචි ලකුණු, ඒවා ලියාපදිංචි කරන ලද අනුපිළිවෙළ අනුව, නියමිත ආකෘතියේ ලා ගැසට් පත්‍රයෙහි පළ කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සැලැස්විය යුතු අතර, එසේ පළ කරනු ලබන එක් එක් ලකුණ සම්බන්ධයෙන් නියම කරනු ලබන විස්තර පිළිබඳ යොමු සටහනක් ද ඒ පළ කිරීමෙහි ඇතුළත් කළ යුතු ය.

ලේඛනය පරීක්ෂා කිරීම සහ සහතික කළ පිටපත්.

111. යම් තැනැත්තකු විසින් ලේඛනය පරීක්ෂා කිරීම ද නියමිත ගාස්තුව ගෙවා, ඒ ලේඛනයේ උඩෘතවල සහතික කළ පිටපත් ලබා ගැනීම ද කරනු ලැබිය හැකි ය.

ආශ්‍රිත ලකුණු.

112. එවකටත් ලේඛනයේ ඇතුළත් ඉල්ලුම්කරුගේ ලකුණක් ඉල්ලුම්කරු නොවන වෙනත් තැනැත්තකු විසින් පාවිච්චි කරනු ලැබිණි නම්, නොමඟ යාමට හෝ ව්‍යාකූල තත්ත්වයකට පත් වීමට ඉඩ ඇති තරම් ඒ ලකුණට සමානුරූපී වූ හෝ බොහෝ සෙයින් සමාන වූ ලකුණක් එකම භාණ්ඩ හෝ එකම විස්තරයෙන් යුත් භාණ්ඩ සඳහා ලියාපදිංචි කිරීම පිණිස ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක, ඒ ලකුණ ලියාපදිංචි කිරීම පිළිබඳ කොන් දේසියක් ලෙස, ඒ ලකුණ ආශ්‍රිත ලකුණු වශයෙන් ලේඛනයේ ඇතුළත් කළ යුතු යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

ආශ්‍රිත ලකුණු පැවරීම සහ පාවිච්චි කිරීම.

113. ආශ්‍රිත ලකුණු වෙන් වෙන් වශයෙන් නොව සම්පූර්ණ සමස්තයක් වශයෙන් පමණක් පැවරීම හෝ අන්සතු කිරීම හෝ කළ යුතු නමුත්, ඒවා වෙන් වෙන් වශයෙන් ලියාපදිංචි කළ ලකුණු ලෙස අනෙක් සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය:

එසේ වුව ද, ලියාපදිංචි ලකුණක් පාවිච්චි කිරීම මේ කොටසේ විධිවිධාන යටතේ යම් කාර්යයක් සඳහා ඔප්පු කිරීමට අවශ්‍ය වන අවස්ථාවක, ආශ්‍රිත ලියාපදිංචි ලකුණක් පාවිච්චි කිරීම හෝ ලකුණෙහි අනන්‍යතාව කෙරෙහි සාරානුකූලව බල නොපාන පරිදි කරන ලද එකතුකිරීම් හෝ වෙනස්කිරීම් සහිතව ඒ ලකුණ පාවිච්චි කිරීම ඉහත කී පාවිච්චි කිරීමට සමාන බව පිළිගනු ලැබීම මැනවැයි රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන්නේ නම් සහ එසේ සලකනු ලබන තාක් දුරට, ඔහු විසින් එසේ පිළිගනු ලැබිය හැකි ය.

XXII වන පරිච්ඡේදය

ලියාපදිංචිය පවත්නා කාලය

ලියාපදිංචිය පවත්නා කාලය.

114. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, ලකුණක ලියාපදිංචිය, එය ලියාපදිංචි කළ දින සිට අවුරුදු දහයකට පසු, අවසන් විය යුතු ය.

(2) ලකුණක් ලියාපදිංචි කරනු ලබන විට, එය ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය රෙජිස්ට්‍රාර්වරයාට ලැබුණ දින සිට එය ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර ඒ දිනය මේ කොටසේ කාර්ය සඳහා, ලියාපදිංචි දිනය ලෙස සැලකිය යුතු ය.

අලුත් කිරීම.

115. (1) ලකුණක ලියාපදිංචිය, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, එකක් අවුරුදු දහයක් වූ අනුගාමී කාල සීමා සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(2) ලකුණක ලියාපදිංචිය අලුත් කිරීම, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලකුණ තවදුරටත් පරීක්ෂා කරනු ලැබීමට හෝ යම් තැනැත්තකු මගේ විරෝධය පැමකට හෝ යටත් නොවිය යුතු ය.

(3) අලුත් කිරීමේ ගාස්තුව ලියාපදිංචිය වලංගු කාලසීමාව අවසන් වන දිනයට පූර්වයෙන් වූ මාස දොළහ ඇතුළත ගෙවිය යුතු ය:

එසේ වුව ද, නියම කරනු ලබන අධිගාස්තුව ගෙවූ විට, එකී කාල සීමාව අවසන් වන දිනයෙන් පසු, මාස හයක් වූ අනුග්‍රහ කාල සීමාවක් ඒ ගාස්තුව ගෙවීම සඳහා ඉඩ දෙනු ලැබිය යුතු ය.

(4) ලියාපදිංචි පිළිබඳ සියලු අලුත් කිරීම්, ලැයිස්තුවලින් යම් භාණ්ඩයක් හෝ සේවයක් ඉවත් කර තිබුණහොත් ඒ ඉවත් කිරීම් ද සඳහන් කරමින්, රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයෙහි සටහන් කළ යුතු අතර නියමිත ආකෘතියෙහිලා එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමට ද සැලැස්විය යුතු ය.

(5) අලුත් කිරීමේ ගාස්තුව (3) වන උපවගන්තියෙහි සඳහන් කාලසීමාව තුළ දී හෝ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී හෝ ගෙවනු නොලැබූ අවස්ථාවක දී, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ලකුණ ලේඛනයෙන් ඉවත් කළ යුතු ය.

ලියාපදිංචි ලකුණක් අමුතු කිරීම.

116. යම් ලකුණක ලියාපදිංචි හිමිකරු විසින් ඒ ලකුණෙහි අනන්‍යතාවට සාධානුකූලව බල නොපාන යම් ආකාරයකින් ඊට කිසිවක් එකතු කිරීම පිණිස හෝ එය අමුතු කිරීම පිණිස හෝ අවසර ලබා ගැනීමට නියමිත ආකාරයෙන් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලුම් කළ හැකිය. එවිට රෙජිස්ට්‍රාර්වරයා විසින් ඊට අවසරදීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. නැතහොත් ඒ ලකුණ පාවිච්චි කරන ක්‍රමය හෝ ස්ථානය හෝ පිළිබඳව සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන නියම හා සීමාකිරීම්වලට යටත්ව ඒ අවසරය ඔහු විසින් දෙනු ලැබිය හැකි ය. අවසරය දෙනු ලැබුවහොත් අමුතු කරන ලද ආකාරයෙන් ඒ ලකුණ නියමිත ආකාරයට පළ කරනු ලැබිය යුතු ය.

XXIII වන පරිච්ඡේදය

ලකුණක ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම්.

117. (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොවන පරිදි, ලියාපදිංචි ලකුණක් සම්බන්ධයෙන් පහත දක්වෙන අනන්‍ය අයිතිවාසිකම් ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා සතු විය යුතු ය:—

(අ) ලකුණ පාවිච්චි කිරීම;

(ආ) ලකුණෙහි ලියාපදිංචිය පැවරීම හෝ අන්සතු කිරීම;

(ඇ) අවසර නිවිසුම්වලට ඇතුල්වීම.

(2) ලකුණක ලියාපදිංචි හිමියාගේ කැමැත්ත නොමැතිව, තෘතීය පාර්ශ්වකරුවන් විසින් පහත දක්වෙන ක්‍රියා කරනු ලැබිය නොහැකි ය:—

(අ) ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා සඳහා, මහජනයා නොමග යාමට ඉඩ ඇති ආකාරයකින්, ඒ ලකුණ හෝ පෙනුමෙන් ඊට සමාන ලාංඡනයක් හෝ පාවිච්චි කිරීම, හෝ වෙනත් යම් භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ඒ ලකුණ හෝ ලාංඡනය හෝ පාවිච්චි කිරීමෙන් මහජනයා නොමග යාමට ඉඩ ඇති අවස්ථාවක, ඒ වෙනත් භාණ්ඩ හෝ සේවා සඳහා ඒ ලකුණ හෝ ලාංඡනය හෝ පාවිච්චි කිරීම; සහ

(ආ) සාධාරණ හේතුවක් නොමැතිව හා ලකුණේ ලියාපදිංචි හිමියාගේ ස්වාර්ථවලට හානිකර විය හැකි තත්වයන් යටතේ, ඒ ලකුණ හෝ පෙනුමෙන් ඊට සමානවන ලාංඡනයක් හෝ ව්‍යාපාර නාමයක් වෙනත් කවර හෝ අන්දමකින් පාවිච්චි කිරීම.

ලියාපදිංචි හිමියාගේ අයිතිවාසිකම් පිළිබඳ සීමාව.

118. තෘතීය පාර්ශ්වකරුවන් විසින් පහත දක්වෙන ක්‍රියා කරනු ලැබීම වැළැක්වීමේ අයිතිවාසිකම්, ලකුණ ලියාපදිංචි කිරීම් හේතුකොට ගෙන එහි ලියාපදිංචි හිමියා වෙත නොපැවරේ:—

(අ) ස්වකීය නම්, ලිපිනයන්, ව්‍යාජ නාම හෝ භූගෝලීය නාමයක් හෝ, ස්වකීය භාණ්ඩවල සහ සේවාවල වර්ගය, තත්ත්වය, ප්‍රමාණය, ගමනාන්තය, වටිනාකම, සම්භව ස්ථානය,

නිෂ්පාදන හෝ සම්පාදන කාලය යන මේවා පිළිබඳ සැබෑ සංඥා නිර්ව්‍යාජ ලෙස පාවිච්චි කිරීම හුදෙක් හැඳින ගැනීමේ හෝ තොරතුරු සැපයීමේ හෝ කාර්යවලට සීමාවන තාක් දුරට සහ ඒ භාණ්ඩවල සෝ සේවාවල හෝ මූලාරම්භය පිළිබඳව මහජනයා නොමග යැවීමක් නොවන තාක් දුරට, එසේ නිර්ව්‍යාජ ලෙස පාවිච්චි කිරීම;

(ආ) ඒ ලකුණ යටතේ ශ්‍රී ලංකාවේ දී නීත්‍යනුකූලව සැදුන ලද, ආයාතනය කරන ලද, වෙළෙඳාම සඳහා ඉදිරිපත් කරන ලද, විකුණන ලද, පාවිච්චි කරන ලද හෝ රැස් කර තබන ලද භාණ්ඩ කිසිදු වෙනසකට භාජන වී නොමැති නම්, එකී භාණ්ඩ සම්බන්ධයෙන් ඒ ලකුණ පාවිච්චි කිරීම.

XXIV වන පරිච්ඡේදය

ඉල්ලුම්පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පැවරීම සහ අන්සතු කිරීම්

ඉල්ලුම්පත්‍ර සහ ලියාපදිංචි කිරීම් පැවරීම සහ අන්සතු කිරීම්.

119. (1) යම් ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ හෝ ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ හෝ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා සියල්ලම හෝ ඉන් කොටසක් හෝ සම්බන්ධයෙන්, එකී ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය පැවරීම හෝ අන්සතු කිරීම, ඒ ලකුණ පාවිච්චි කරන ව්‍යවසාය සම්පූර්ණයෙන් ම නැතහොත් කොටසක් වශයෙන් හෝ පැවරීම ගැන නොතකා, කරනු ලැබිය හැකි ය.

(2) ඒ පැවරීමේ හෝ අන්සතු කිරීමේ හෝ අරමුණ හෝ ප්‍රති ඵලය වනුයේ මහජනයා නොමග යැවීම නම්, විශේෂයෙන් ම, ඒ ලකුණ යොදනු ලබන භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය, මූලාරම්භය, නිෂ්පාදන ක්‍රියාවලිය, ආවේණික ලක්ෂණ හෝ ඒ භාණ්ඩ හෝ සේවා අදහස් කර ඇත්තේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යයට ඒවායේ ඇති යෝග්‍යතාව යන මේවා සම්බන්ධයෙන් මහජනයා නොමග යැවීම නම්, ඒ පැවරීම හෝ අන්සතු කිරීම හෝ නිර්බල විය යුතු ය.

(3) ලකුණක් ලියාපදිංචි කිරීම් සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් හෝ ලකුණක ලියාපදිංචියක් හෝ පැවරීම හෝ අන්සතු කිරීම හේතු කොට ගෙන ඒ ඉල්ලුම් පත්‍රයට හෝ ලියාපදිංචියට හෝ හිමිකම් ලබන යම් තැනැත්තකු විසින් ඒ පැවරීම හෝ අන්සතු කිරීම හෝ ලේඛනයෙහි සටහන් කරන ලෙස නියමිත ආකාරයෙන් රෙජිස්ට්‍රාර්වරයාගෙන් ඉල්ලුම් කරනු ලැබිය හැකි ය.

(4) (අ) නියමිත හාස්තුව රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලැබුව හොත්;

(ආ) පැවරීමක් සම්බන්ධයෙන් වන විට, ඒ පැවරීම, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් වුවහොත්

හැර එවැනි කිසිම පැවරීමක් හෝ අන්සතු කිරීමක් ලේඛනයෙහි සටහන් නොකළ යුතු ය.

(5) එවැනි යම් පැවරීමක් හෝ අන්සතු කිරීමක් තෘතීය පාර්ශ්ව කරුවන් විෂයයෙහි බලපවත්වන්නේ යයි ලේඛනයෙහි සටහන් කර තිබේ නම් මිස, ඒ පැවරීම හෝ අන්සතු කිරීම් හෝ තෘතීය පාර්ශ්වකරුවන් විෂයයෙහි බලනොපැවැත්විය යුතු ය.

XXV වන පරිච්ඡේදය

අවසර ගිවිසුම්

අර්ථ නිරූපණය.

120. (1) මේ කොටසේ කාර්යය සඳහා, අවසර ගිවිසුමක් යන්නෙන්, යම් ලකුණක් ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ සේවා සියල්ලම හෝ ඉන් කොටසක් හෝ සඳහා ඒ ලකුණ පාවිච්චි කිරීමට ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා ("අවසරදායී") විසින් වෙනත් යම් තැනැත්තකුට හෝ ව්‍යාවසායකට හෝ ("අවසරලාභී") අවසර දෙන ගිවිසුමක් අදහස් වේ.

(2) අවසරලාභී විසින් ඒ ලකුණ පාවිච්චි කිරීම, ඒ ලකුණෙහි ලියාපදිංචි හිමියා විසින් ඒ ලකුණ පාවිච්චි කිරීම ලෙස සලකනු ලැබිය යුතු ය.

අවසර ගිවිසුමක ආකෘතිය සහ එය සටහන් කිරීම.

121. (1) අවසර ගිවිසුමක් ලියවිල්ලකින් විය යුතු අතර, ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ එය අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) ගිවිසි පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් හෝ අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලීමක් කරන ලද විටක, නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු, ඒ ගිවිසුමට අදාළව සටහන් කර ගැනීමට ඒ පාර්ශ්වකරුවන් අපේක්ෂා කරන විස්තර රෙජිස්ට්‍රාර් වරයා විසින් ලේඛනයෙහි සටහන් කළ යුතු ය:

එසේ වුව ද, ඒ ගිවිසුමට අදාළ වෙනත් විස්තර කිසිවක් අනාවරණය කිරීමට හෝ සටහන් කිරීමට හෝ ඒ පාර්ශ්වකරුවන්ට නියම නොකළ යුතු ය.

අවසරලාභී සතු අයිතිවාසිකම්.

122. (1) පහත දක්වෙන කරුණුවලට පටහැනි විධිවිධාන කිසිවක් අවසර ගිවිසුමේ ඇතුළත්ව නොමැති විටක,—

(අ) ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ සියල්ල හෝ සේවා සියල්ල සම්බන්ධයෙන් ඒ ලකුණ, ලියාපදිංචිය අලුත්කිරීම් ද ඇතුළුව, ඒ ලකුණ ලියාපදිංචිය පවතින මුළු කාලසීමාව ම තුළ ශ්‍රී ලංකාවේ සම්පූර්ණ භූගෝලීය ප්‍රදේශය මුළුල්ලේ ම පාවිච්චි කිරීමට අවසරලාභියාට හිමිකම ලැබිය යුතු ය;

(ආ) අවසර ගිවිසුම යටතේ වූ තම් අයිතිවාසිකම් තෘතීය පාර්ශ්වකරුවන්ට පැවරීමට හෝ අන්සතු කිරීමට හෝ අතුරු අවසර දීම්වලට හෝ අවසරලාභියාට හිමිකම නොලැබිය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, පැවරීම්වලට හා අතුරු අවසරදීම්වලට අදාළ විය යුතු ය.

අවසරදායී සතු අයිතිවාසිකම්.

123. (1) යම් පටහැනි විධිවිධානයක් අවසර ගිවිසුමේ ඇතුළත්ව නොමැති විටක, ඒ ලකුණ ම සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරු වන්ට තවදුරටත් අවසර දීම හෝ තමා විසින් ම ඒ ලකුණ පාවිච්චි කිරීම හෝ අවසරදායී විසින් කරනු ලැබිය හැකි ය.

(2) අවසරය අනන්‍ය අවසරයක් බවට අවසර ගිවිසුමේ විධිවිධාන සලස්වා තිබෙන අවස්ථාවක, සහ අන්‍යාකාර විධිවිධාන ප්‍රකාශිතව ම සලස්වා තිබෙන විටක හැර, ඒ ලකුණ සම්බන්ධයෙන් තෘතීය පාර්ශ්වකරුවන්ට තවදුරටත් අවසර දීම හෝ තමා විසින් ම ඒ ලකුණ පාවිච්චි කිරීම හෝ අවසරදායී විසින් නොකළ යුතු ය.

අවසර ගිවිසුමක් සහ ඒවායේ ඇතැම් වගන්ති බලරහිත වීම.

124. (1) ලකුණ පාවිච්චි කරනු ලැබිය හැක්කේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවල හෝ සේවාවල තත්ත්වය අවසරදායී විසින් කාර්ය සාධක ලෙස පාලනය කරනු ලැබීම සහතික කෙරෙන කොන්දේසි ඇතුළත්ව නොමැති විටක අවසර ගිවිසුම බලරහිත හා ශූන්‍ය විය යුතු ය.

(2) ලකුණෙහි ලියාපදිංචි හිමියා වෙත මේ/ කොටසින් පවරනු ලැබූ අයිතිවාසිකම්වලින් ව්‍යුත්පන්න නොවූ හෝ ඒ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නොවන්නා වූ හෝ සීමාකිරීම්, අවසර ගිවිසුමක යම් වගන්තියකින් හෝ කොන්දේසියකින් හෝ අවසර ලාභී වෙත පනවනු ලබන තාක් දුරට, ඒ වගන්තිය හෝ කොන්දේසිය හෝ බලරහිත හා ශූන්‍ය විය යුතු ය:

එසේ වුව ද, ඉහත සඳහන් සීමාකිරීම්,—

(අ) ලකුණ පාවිච්චි කිරීමේ විෂය පථය, ප්‍රමාණය හෝ කාල සීමාව සම්බන්ධයෙන් වූ හෝ ඒ ලකුණ පාවිච්චි කරනු ලබන භූගෝලීය ප්‍රදේශය සම්බන්ධයෙන් වූ හෝ ඒ ලකුණ පාවිච්චි කරනු ලබන භාණ්ඩවල හෝ සේවාවල තත්ත්වය හෝ ප්‍රමාණය සම්බන්ධයෙන් වූ සීමාකිරීම්වලින්;

(ආ) (1) වන උපවගන්තියේ සඳහන් කොන්දේසි මගින් යුක්තියුක්ත කරන ලද සීමාකිරීම්වලින්; සහ

(ඇ) ලකුණෙහි ලියාපදිංචිය පිළිබඳ වලංගු භාවයට හානිකර විය හැකි සියලු ක්‍රියාවලින් වැළකී සිටීමට අවසරලාභී වෙත නියම කර ඇති බැඳීම්වලින්

සංයුක්ත වන ලෙස නොසැලකිය යුතු ය.

අවසර ගිවිසුම් අවලංගු කිරීම.

125. නිත්‍යානුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා ද ඇතුළු, යම් කිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණෙහි ලියාපදිංචි හිමියා සහ සටහන් කර ඇති සෑම පැවරුම්ලාභියකු ම, අවසරලාභියකු ම හෝ අතුරු අවසරලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු, ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට, අධිකරණය විසින්—

(අ) ඒ ලකුණ පාවිච්චි කරනු ලබන්නේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩවල හෝ සේවාවල තත්ත්වය පිළිබඳ කාර්ය සාධක පාලනය අවසරදායීට අහිමි වී තිබේ නම්;

(ආ) මහජනයා නොමග යවන හෝ ව්‍යාකූල බවට පත් කෙරෙන හෝ ආකාරයෙන් අවසරලාභී විසින් ඒ ලකුණ පාවිච්චි කරනු ලැබ තිබේ නම්,

ඒ ගිවිසුම බලරහිත සහ අවලංගු කරනු ලැබිය හැකි ය.

විදේශයක දී ගෙවීම් අවශ්‍ය කරන අවසර ගිවිසුම්.

126. (1) (අ) විදේශයක දී ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් අවසර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක්; හෝ

(ආ) ඒ අවසර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතු කොට, ඒ අවසර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලිය විල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයකට අදාළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම් දීමක් අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී අවසර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

ලියාපදිංචිය බලරහිත වීම අවසර ගිවිසුම කෙරෙහි බලපාන අන්දම.

127. අවසර ගිවිසුමේ කාලසීමාව ඉකුත් වීමට පෙර, ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කරන ලද අවස්ථාවක ඒ අවසර ගිවිසුම යටතේ අවසරලාභී විසින් අවසරදායිට යම් ගෙවීමක් කරන ලෙස තවදුරටත් ඔහුට නියම නොකළ යුතු අතර එවකටත් ගෙවා ඇති යම් ගෙවීමක් ආපසු ලබා ගැනීමට ද අවසරලාභීට හිමිකම ලැබිය යුතු ය:

එසේ වුවද, සියලු අවස්ථානුගත කරුණු යටතේ සහ විශේෂයෙන් ම අවසරලාභියාට අවසරය නිසා සිද්ධියක ලෙස ලාභයක් ලැබී තිබේ නම්, එවැනි යම් ආපසු ගෙවීමක් කිරීම සාධාරණීය නොවන බව අවසරදායී විසින් ඔප්පු කරනු ලැබිය හැකි ප්‍රමාණයට ඒ ආපසු ගෙවීම් කිරීම අවසරදායීට නියම නොකළ යුතු අතර එසේ ඔප්පු කළ හැකි ප්‍රමාණයට කොටසක් ආපසු ගෙවීම කරන ලෙස අවසරදායීට නියම කළ යුතු ය.

අවසර ගිවිසුමක් ඉකුත්වීම, අවසාන කිරීම හෝ නිර්බල වීම.

128. රෙජිස්ට්‍රාර්වරයා විසින්,—

(අ) සටහන් කරනු ලැබූ අවසර ගිවිසුමක කාලය ඉකුත් වී ඇති බවට හෝ ඒ ගිවිසුම අවසන කර ඇති බවට හෝ ඔහු සෑහීමට පත් වුවහොත්, ඒ බව සටහන් කරන ලෙස එහි භාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද ලියවිල්ලකින් ඉල්ලා සිටින ලද කල්හි, ඒ බව ලේඛනයෙහි සටහන් කළ යුතු ය;

(ආ) මේ කොටසේ වෙනත් යම් විධිවිධානයක් යටතේ අවසර ගිවිසුමක කාලය ඉකුත්වීම, එය අවසාන කිරීම, බලරහිත කිරීම හෝ නිර්බල කිරීම ලේඛනයෙහි සටහන් කළ යුතු ය.

XXVI වන පරිච්ඡේදය

ලියාපදිංචිය අත්හැරීම සහ එහි බලරහිත බව

ලියාපදිංචිය අත්හැරීම.

129. (1) ලකුණක ලියාපදිංචි හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් අත්සන් කරනු ලැබ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් ඔහු විසින්, ලියාපදිංචිය සම්පූර්ණයෙන් ම හෝ ඒ ලකුණ ලියාපදිංචි කර තිබෙන්නේ යම් භාණ්ඩ හෝ සේවා හෝ සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවල හෝ සේවාවල කොටසක් සම්බන්ධයෙන් හෝ අත්හරිනු ලැබිය හැකි ය.

(2) එකී ප්‍රකාශය ලැබුණු කල්හි රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රකාශය ලේඛනයේ සටහන් කළ යුතු අතර ඒ සටහන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(3) එකී ප්‍රකාශය රෙජිස්ට්‍රාර්වරයාට ලැබුණු දින සිට, ඒ අත්හැරීම බල පැවැත්විය යුතු ය.

(4) ලකුණක් සම්බන්ධයෙන් වූ අවසර ගිවිසුමක් ලේඛනයේ සටහන් කරනු ලැබූ අවස්ථාවක දී, ඒ අවසර ගිවිසුමේ පටහැනි විධිවිධානයක් නොමැති විටක, සටහන් කරනු ලැබ ඇති පැවරුම්ලාභී විසින් හෝ අවසරලාභී විසින් හෝ අතුරු අවසරලාභී විසින් හෝ කැමැත්ත දිය යුතු බවට වූ නියමය අනවශ්‍ය බව ප්‍රකාශිතව ම අවසර ගිවිසුමේ සඳහන් කර තිබේ නම් හැර, සටහන් කරනු ලැබ ඇති සෑම පැවරුම්ලාභියකු ම විසින් හෝ අවසරලාභියකු ම විසින් හෝ අතුරු අවසරලාභියකු ම විසින් හෝ එකී අත්හැරීමට කැමැත්ත දෙමින් අත්සන් කරනු ලැබූ ප්‍රකාශයක් ලැබුණු විට මිස, රෙජිස්ට්‍රාර් වරයා විසින් එකී අත්හැරීම පිළිගැනීම හෝ සටහන් කිරීම හෝ නොකළ යුතු ය.

ලියාපදිංචියේ බල රහිතභාවය.

130. (1) නීත්‍යනුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා ද ඇතුළු, යම් කිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණේ ලියාපදිංචි හිමියා සහ සටහන් කර ඇති සෑම පැවරුම්ලාභියකුම, අවසරලාභියකුම හෝ අතුරු අවසරලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් අධිකරණය වෙත ලැබුණු විට, ඒ ලකුණ ලියාපදිංචි කිරීම 99 වන සහ 100 වන වගන්තිවල විධිවිධාන යටතේ වලක්වා තිබේ නම්, ඒ ලකුණෙහි ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, අධිකරණය වෙත ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේ දී නොපැවති, බලරහිත කිරීමේ හේතු සැලකිල්ලට නොගත යුතු ය.

(2) ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩවලින් හෝ සේවාවලින් යම් කොටසක් සම්බන්ධයෙන් පමණක් ලියාපදිංචිය බලරහිත කිරීම සඳහා හේතු පවතී නම්, ඒ භාණ්ඩවල හෝ ඒ සේවාවල ඒ කොටස සඳහා පමණක් ලියාපදිංචිය බලරහිත වන බවට ප්‍රකාශයක් කළ යුතු ය.

(3) 100 (1) වන වගන්තියේ සඳහන් හේතු අතුරින් යම් හේතුවක් පදනම් කොට ගෙන බලරහිත බවට ප්‍රකාශයක් කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍රයක්, ලකුණ ලියාපදිංචි කළ දින සිට අවුරුදු පහක් ඇතුළත ඉදිරිපත් කළ යුතු ය.

බලරහිත වීමේ දිනය සහ ප්‍රතිඵලය.

131. (1) ලකුණක ලියාපදිංචිය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් බලරහිත බව ප්‍රකාශ කරමින් අධිකරණය විසින් අවසානාත්මක නිරණයක් කරන ලද විටක, ලියාපදිංචියේ දින සිට, අවස්ථාවෝචිත පරිදි, ඒ ලියාපදිංචිය සම්පූර්ණයෙන් ම හෝ කොටසක් වශයෙන් හෝ බලරහිත සහ ශූන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) බලරහිත කිරීම පිළිබඳ ප්‍රකාශයක් අවසානාත්මක වූ විට, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් එකී ප්‍රකාශය ලේඛනයෙහි සටහන් කොට, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

XXVII වන පරිච්ඡේදය

ලකුණක් ඉවත් කිරීම

ලකුණක් ඉවත් කිරීම.

132. (1) නීත්‍යානුකූල සම්බන්ධතාවක් ඇති යම් තැනැත්තකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයා ද ඇතුළු, යම් නිසි බලධරයකු විසින් හෝ ඉදිරිපත් කරනු ලබන සහ ලකුණෙහි ලියාපදිංචි හිමියා සහ සටහන් කර ඇති සෑම පැවරුම්ලාභියකු ම, අවසරලාභියකු ම හෝ අතුරු අවසරලාභියකු ම පාර්ශ්වකරුවන් වශයෙන් නම් කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන ලද විට අධිකරණය විසින්,—

(අ) අධිකරණය වෙත ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනට පූර්වයෙන් ම වූ අනුගාමී අවුරුදු පහ ඇතුළත පිළිගත හැකි හේතු නොමැතිව, ලියාපදිංචි හිමියා යම් ලියාපදිංචි ලකුණක් ශ්‍රී ලංකාව තුළ පාවිච්චි කිරීම හෝ අවසරයක් ප්‍රකාර ශ්‍රී ලංකාව තුළ ඒ ලකුණ පාවිච්චි කිරීමට සැලැස්වීම පැහැර හැර තිබේ නම්;

(ආ) ඒ ලකුණ ලියාපදිංචි කර ඇත්තේ යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ හෝ සේවා එකක හෝ ඊට වැඩි ගණනක වර්ග නාමයක් බවට පත් වන ලෙස සහ වෙළෙඳ අංශවල හා මහජනයාගේ මතය අනුව ඒ වෙළෙඳ ලකුණේ වැදගත්කම අහෝසිවන ලෙස, ඒ ලකුණ පරිණාමනය කිරීමට එහි ලියාපදිංචි හිමියා විසින් සලස්වනු ලැබිණි නම්, පොළඹවනු ලැබිණි නම් හෝ එවැනි පරිණාමනයක් ඔහු විසින් ඉවසා නිහඬව සිටි නම්

අධිකරණය විසින් ඒ ලියාපදිංචි ලකුණ ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) (1) (අ) උපවගන්තිය යටතේ වූ යම් ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් විත විට, ඒ ලකුණ පාවිච්චි නොකිරීම එහි ලියාපදිංචි හිමියාගේ පාලනයට විෂය නොවන හේතු නිසා සිදු වී තිබේ නම්, අධිකරණය විසින් ඒ බව සැලකිල්ලට ගනු ලැබිය හැකි ය. ලියාපදිංචි හිමියා මූණ පා ඇති මුදල් හිඟය ඒ ලකුණ පාවිච්චි නොකිරීමට හේතුවක් වශයෙන් අධිකරණය විසින් නොසැලකිය යුතු ය.

(3) යම් ලකුණක්,—

(අ) එය ලියාපදිංචි කර තිබෙන්නේ යම් ස්වරූපයක් අනුව ද, ඒ ස්වරූපයේ මූලාංග ඒ ලකුණේ අනන්‍යතා ලක්ෂණ වෙනස් නොවන පරිදි වෙනස් කර, එකී ස්වරූපයට වෙනස් ස්වරූපයකින් පාවිච්චි කිරීම, ඒ ලකුණ ඉවත් කිරීමට හේතුවක් නොවිය යුතු ය;

(ආ) එය ලියාපදිංචි කර තිබෙන්නේ යම් පන්තියකට අයත් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ද, ඒ පන්තියට අයත් භාණ්ඩ හෝ සේවා එකක් හෝ ඊට වැඩි ගණනක් සම්බන්ධයෙන් පාවිච්චි කිරීම, ඒ පන්තියට ම අයත් සෙසු සියලු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ඒ ලකුණ ඉවත් කිරීම වැළැක්වීමට ප්‍රමාණවත් හේතුවක් විය යුතු ය.

ලකුණක් ඉවත් කෙරෙන දිනය සහ ඉවත් කිරීමේ ප්‍රතිඵලය.

133. ලියාපදිංචි කළ යම් ලකුණක් ලේඛනයෙන් ඉවත් කිරීමට අධිකරණය විසින් අවසාන තීරණයක් කරනු ලැබූ අවස්ථාවක,—

(1) අධිකරණය විසින්, ඒ ලකුණ ඉවත් කිරීමට හේතු භූත වූ සිද්ධිවල හා වෙනත් අවස්ථානුගත කරුණුවල දිනය සැලකිල්ලට ගෙන, ඒ ලකුණේ ලියාපදිංචියෙහි ඇති කවර වුව ද නීත්‍යනුකූල බලපැවැත්මක් අවසාන වූ දිනය ලෙස සැලකිය යුතු දිනය නිශ්චය කරනු ලැබිය හැකි ය.

(2) අධිකරණයේ තීරණය ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, ලකුණ ඉවත් කළ යුතු යයි අධිකරණය තීරණය කළහොත්, ඒ ඉවත් කිරීම රෙජිස්ට්‍රාර්වරයා විසින් ලේඛනයෙහි සටහන් කර, අධිකරණයේ තීරණය ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

XXVIII වන පරිච්ඡේදය

සාමූහික ලකුණු

සාමූහික ලකුණු

134. මේ කොටසේ 102 වන, 116 වන, 118 වන, 119 වන වගන්ති හා 129 සිට 133 දක්වා වූ වගන්ති සාමූහික ලකුණුවලට අදාළ විය යුතු ය.

සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කිරීම.

135. (1) සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක ඒ ලකුණ සාමූහික ලකුණක් ලෙස නම් කොට තිබේ නම් හැර සහ ඒ ලකුණ පාවිච්චි කිරීම පාලනය කෙරෙන නියමිත කොන්දේසිවල පිටපතක් ඉල්ලුම්කරු විසින් යථා පරිදි සහතික කොට ඉල්ලුම් පත්‍රයට අමුණා තිබේ නම් හැර, සාමූහික ලකුණ ලියාපදිංචි කිරීම සඳහා වූ එකී ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් නොකළ යුතු ය.

(2) සාමූහික ලකුණක් දක්වා ඇති භාණ්ඩවල හෝ සේවාවල පොදු ආවේණික ලක්ෂණ හෝ තත්ත්වය කවරේදැයි යන්න ද ඒ ලකුණ පාවිච්චි කරනු ලැබිය හැකි තැනැත්තා කවුරුන්දැයි යන්න සහ ඒ ලකුණ පාවිච්චි කරනු ලබන්නේ කවර තත්ත්වයන් යටතේ දැයි යන්න ද (1) වන උපවගන්තිය යටතේ නියමිත කොන්දේසිවල සඳහන් කළ යුතු ය. ලකුණ පාවිච්චි කිරීම පිළිබඳව කාර්යසාධක පාලනයක් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ කොන්දේසිවල විධිවිධාන ද සැලැස්විය යුතු අතර, ඒ කොන්දේසිවලට පටහැනිව ඒ ලකුණ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සුදුසු දණ්ඩන ද ඒ කොන්දේසිවල සඳහන් විය යුතු ය.

සාමූහික ලකුණ ලියාපදිංචි කිරීම සහ පළකිරීම.

136. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් තීරණය කරනු ලබන, ලේඛන යෙහි යම් කොටසක සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම කළ යුතු අතර, ඒ ලකුණ පාවිච්චි කිරීම පාලනය කෙරෙන කොන්දේසිවල පිටපතක් ඒ ලියාපදිංචි කිරීමට අමුණා තැබිය යුතු ය.

(2) සාමූහික ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් 107 (9) වන වගන්තියට අනුකූලව පළ කිරීමේ දී, ඒ ලියාපදිංචි කිරීමට ඇමිණිය යුතු කොන්දේසිවල සම්පිණ්ඩනයක් ද ඒ පළ කිරීමට ඇතුළත් විය යුතු ය.

(3) සාමූහික ලකුණක්, එසේ (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට එය ලියාපදිංචි කරන ලද ලකුණක් ලෙස සියලු කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු ය.

සාමූහික ලකුණක් පාවිච්චි කිරීම පාලනය කෙරෙන කොන්දේසි වෙනස් කිරීම.

137. (1) සාමූහික ලකුණක් පාවිච්චි කිරීම පාලනය කෙරෙන කොන්දේසිවල කරන ලද යම් වෙනස් කිරීම්, ඒ ලකුණේ ලියාපදිංචි හිමියා විසින් නියමිත ආකාරයෙන් රෙජිස්ට්‍රාර්වරයා වෙත නිවේදනය කළ යුතු ය.

(2) ඒ වෙනස් කිරීම පිළිබඳ යම් නිවේදනයක්, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට, ලේඛනයෙහි සටහන් කළ යුතු ය. කොන්දේසිවල කරන ලද යම් වෙනස් කිරීමක් එසේ සටහන් කරනු ලැබුව හොත් පමණක්, එය බලපැවැත්විය යුතු ය.

(3) ලේඛනයෙහි එසේ සටහන් කරන ලද වෙනස් කිරීම්වල සම්පිණ්ඩනයක් ගැසට් පත්‍රයේ පළ කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සැලැස්විය යුතු ය.

සාමූහික ලකුණක් පාවිච්චි කිරීම සහ වෙනත් කරුණු.

138. 117 වන වගන්තියේ සිට 133 වන වගන්තිය දක්වා වූ වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සාමූහික ලකුණුවලට අදාළ විය යුතු ය.

XXIX වන පරිච්ඡේදය

ව්‍යාපාර නාම සහ අසාධාරණ තරඟ

තහනම් ව්‍යාපාර නාම.

139. යම් නාමයක හෝ සංඥා නාමයක ස්වභාවය හේතු කොට ගෙන හෝ එයින් ගත හැකි ප්‍රයෝජන හේතු කොට ගෙන, එය සදාචාරයට හෝ මහජන සාමයට පටහැනි නම් හෝ එයින් යම් ජන ඒකාධිකාරයක ආගමික හෝ වාර්ගික හැඟීම් පැරවීමට ඉඩ තිබේ නම් හෝ ඒ නාමයෙන් හැඳින්වෙන ව්‍යවසායේ ස්වභාවය පිළිබඳව වෙළෙඳ අංශ හෝ මහජනයා නොමඟ යාමට ඉන් ඉඩ තිබේ නම් ඒ නාමය හෝ සංඥා නාමය ව්‍යාපාර නාමයක් ලෙස ආවේශ්‍ය කළ නොහැකි විය යුතු ය.

ව්‍යාපාර නාම ආරක්ෂා කිරීම.

140. (1) ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලස්වන යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, ඒ නාමය ලියාපදිංචි කිරීමට පෙර වුව ද නැතහොත් ලියාපදිංචි කර නොතිබුණ ද, තෘතීය පාර්ශ්වකරුවන් විසින් කරනු ලබන යම් නීතිවිරෝධී ක්‍රියාවකින් ඒ නාමය ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

(2) තෘතීය පාර්ශ්වකරුවකු විසින් ව්‍යාපාර නාමයක්, වෙළෙඳ ලකුණක්, සේවා ලකුණක් හෝ සාමූහික ලකුණක් ලෙස ව්‍යාපාර නාමයක් යම් ලෙසකින් තදනන්තරව පාවිච්චි කරනු ලැබීම හේතු මහජනයා නොමඟ යාමට ඉඩ ඇති ආකාරයකින් එවැනි ව්‍යාපාර නාමයක්, වෙළෙඳ ලකුණක්, සේවා ලකුණක් හෝ සාමූහික ලකුණක් පාවිච්චි කරනු ලැබීම නීති විරෝධී ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ කොටසේ 118 වන වගන්තිය ව්‍යාපාර නාමවලට අදාළ විය යුතු ය.

ව්‍යාපාර නාම පැවරීම සහ අන්සතු කිරීම.

141. (1) ව්‍යාපාර නාමයකින් හැඳින්වෙන ව්‍යවසාය හෝ ඒ ව්‍යවසායේ කොටසක් පැවරීම හෝ අන්සතු කිරීම සමඟ ඒ ව්‍යාපාර නාමය පැවරීම හෝ අන්සතු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) 119 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ව්‍යාපාර නාමවලට අදාළ විය යුතු ය.

අසාධාරණ තරඟ.

142. (1) කාර්මික හෝ වාණිජ කටයුතුවල දී භාවිත වන අවංක ව්‍යවහාරයන්ට පටහැනි යම් තරඟකාරී ක්‍රියාවක් අසාධාරණ තරඟ කාරී ක්‍රියාවක් වන්නේ ය.

(2) අසාධාරණ තරඟකාරී ක්‍රියාවලට පහත දැක්වෙන ක්‍රියා ඇතුළත් වන්නේ ය:—

(අ) තරඟකරුවකුගේ ආයතනයෙහි, භාණ්ඩ, සේවා හෝ කාර්මික හෝ වාණිජ කටයුතු පිළිබඳව කවර හෝ ආකාරයකින් ව්‍යාකූලතාවයක් ඇති කෙරෙන ස්වභාවයේ වූ සියලුම ක්‍රියා;

(ආ) වෙළෙඳාම කෙරෙන අතරතුර කරනු ලබන, තරඟකරුවකුගේ ආයතනය, භාණ්ඩ, හෝ සේවා, කාර්මික හෝ වාණිජ කටයුතු අපකීර්තියට ලක් කිරීමට තරම් වූ ස්වභාවයක අසත්‍ය චෝදනාවක්;

(ඇ) වෙළෙඳාම කෙරෙන අතරතුර භාවිත කිරීම නිසා, භාණ්ඩවල ස්වභාවය භාණ්ඩ සෑදීමේ ක්‍රියාවලිය, ආවේනික ලක්ෂණ, ඒවා අවශ්‍ය කාර්යය සඳහා ඒවායේ සුදුසුකම් හෝ ඒවායේ ප්‍රමාණය පිළිබඳව මහජනයා නොමඟ යැවිය හැකි යම් ප්‍රභවය පිළිබඳ සංඥාවක් හෝ සම්භව අභිධානයක්;

(ඈ) භාණ්ඩවල හෝ සේවාවල සම්භවය පිළිබඳ හෝ ඒවායේ නිෂ්පාදකයාගේ, සාදන්නාගේ හෝ සපයන්නාගේ අනන්‍යතාව පිළිබඳ ව්‍යාජ හෝ මුලාවිය හැකි සංඥාවක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් භාවිත කිරීම;

(ඉ) ව්‍යාජ හෝ මුලාවිය හැකි සම්භව අභිධානයක් කෙළින්ම හෝ අන්‍යාකාරයකින් භාවිත කිරීම හෝ නිෂ්පාදනයේ සත්‍ය සම්භවය පෙන්නුම් කර නිබුණ ද, සම්භව අභිධානයක් අනුකරණය කිරීම හෝ අභිධානය පරිවර්තිත ස්වරූපයකින් නැතහොත් "ජාතිය", "වර්ගය", "ලකුණ", "අනුකරණය" වැනි යෙදුම් වෙනත් යෙදුමක් සමඟ භාවිත කිරීම.

(3) (2) වන උපවගන්තියේ සඳහන් ක්‍රියා අතුරින් යම් ක්‍රියාවක් නිසා අනාඥප්තියට පත් යම් තැනැත්තකු විසින් හෝ නිෂ්පාදකයන්ගේ, සාදන්නන්ගේ හෝ වෙළෙන්දන්ගේ සංගමයක් විසින්, ඒ ක්‍රියාව දිගට ම කරගෙන යාම වැළැක්වීම සඳහා අධිකරණයේ නඩු කටයුතු පවරනු ලැබිය හැකි අතර උල්ලංඝනය කිරීම්වලට අදාළව XXXII වන පරිච්ඡේදයේ ඇති විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නඩු කටයුතුවලට අදාළ විය යුතු ය.

VI වන කොටස
වැරදි සහ දණ්ඩන
XXX වන පරිච්ඡේදය

යම් ලේඛනයක සටහන් වංක ලෙස වෙනස් කිරීම.

143. මේ සංග්‍රහය යටතේ තබා ඇති යම් ලේඛනයක අසත්‍ය සටහනක් කරන හෝ කිරීමට සලස්වන හෝ එවැනි යම් ලේඛනයක වූ සටහනක පිටපතක් බවට ව්‍යාජ ලෙස හැඟවෙන යම් ලියවිල්ලක් කරන හෝ කිරීමට සලස්වන හෝ ඒ සටහන හෝ ලියවිල්ල අසත්‍ය බව දැනුවත්ව ඒ ලියවිල්ල ඉදිරිපත් කරන හෝ භාර දෙන හෝ ඉදිරිපත් කිරීමට හෝ භාර දීමට සලස්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු හතක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීම.

144. (1) මේ සංග්‍රහයේ II වන කොටස යටතේ ආරක්ෂිත අයිතිවාසිකම්වලින් යම් අයිතිවාසිකමක් ඕනෑකමින් ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ

දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

(2) වරද කළේ යයි කියනු ලබන තැනැත්තා වරදකරු කරනු ලැබුව ද, නොලැබුව ද කෘතිවල උල්ලංඝනීය පිටපත් ලෙස මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන සහ ඒ තැනැත්තාගේ සන්තකයේ තිබෙන සියලු පිටපත් සහිත උල්ලංඝනය කිරීම සඳහා පාවිච්චි කරන ලද සියලු උපකරණ හෝ උල්ලංඝනීය පිටපත් සෑදීමේ කාර්යය සඳහා වූ තහඩු ලෙස මහෙස්ත්‍රාත්වරයාට පෙනීයන සහ ඒ තැනැත්තා සන්තකයේ තිබෙන සියලු තහඩු විනාශ කරන ලෙස හෝ ප්‍රකාශන අයිතිය හිමියාට භාර දෙන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා සුදුසුයයි අදහස් කරන අන්‍යාකාරයකින් ඒ පිළිබඳව ක්‍රියා කරන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

කර්මික සැලසුම් උල්ලංඝනය කිරීම.

145. කර්මික සැලසුමක යම් ලියාපදිංචි හිමියකුගේ, පැවරුම්ලාභියකුගේ හෝ අවසරලාභියකුගේ අයිතිවාසිකම් හිතාමතාම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

කර්මික සැලසුම් පිළිබඳව අසත්‍ය ප්‍රකාශ දැක්වීම.

146. (1) (අ) ලියාපදිංචි කර්මික සැලසුමක් නොවන කර්මික සැලසුමක් සම්බන්ධයෙන් ඒ කර්මික සැලසුම ලියාපදිංචි කර්මික සැලසුමක් බවට;

(ආ) යම් නිෂ්පාදිත සම්බන්ධයෙන් ලියාපදිංචි නොකරන ලද ලියාපදිංචි කර්මික සැලසුමක් ඒ නිෂ්පාදිතය සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද කර්මික සැලසුමක් බවට; හෝ

(ඇ) ලේඛනයේ සටහන් කරන ලද සීමාකිරීම් සැලකිල්ලට ගත් කළ, කර්මික සැලසුම ලියාපදිංචි කිරීමෙන් ඒ කර්මික සැලසුම පාවිච්චි කිරීමේ අනන්‍ය අයිතිවාසිකම නොලැබෙන යම් අවස්ථාවල දී, එය පාවිච්චි කිරීමේ ඒ අනන්‍ය අයිතිවාසිකම් ඒ ලියාපදිංචි කිරීමෙන් ලැබෙන බවට,

කර්මික හෝ වාණිජ කාර්ය සඳහා, කරුණු දක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් කාර්මික සැලසුමක් සම්බන්ධයෙන් "ලියාපදිංචි" යන වචනය හෝ ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කර ඇති බව ප්‍රකාශ කෙරෙන හෝ හඟවන යම් වචනයක් හෝ වචන භාවිත කළහොත්, ඒ කාර්මික සැලසුම ලියාපදිංචි කර ඇති බවට ඔහු කරුණු දක්වන බව සැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර උල්ලංඝනය කිරීම.

147. පේටන්ට් බලපත්‍රයක යම් ලියාපදිංචි හිමියකුගේ, පැවරුම් ලාභියකුගේ හෝ අවසරලාභියකුගේ අයිතිවාසිකම් ඕනෑකමින්ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිදහසක් නොඉක්මවන දඩය කට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙක ටම හෝ ඔහු යටත් විය යුතු ය. තවද, දෙවන වරට හෝ තදනන්තර ව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

පේටන්ට් බලපත්‍ර පිළිබඳව අසත්‍ය කරුණු දැක්වීම.

148. (1) (අ) ලියාපදිංචි පේටන්ට් බලපත්‍රයක් නොවන පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන්, ඒ පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි පේටන්ට් බලපත්‍රයක් බවට;

(ආ) යම් නිෂ්පාදිතයක් හෝ ක්‍රියාවලියක් සම්බන්ධයෙන් ලියාපදිංචි නොකරන ලද ලියාපදිංචි පේටන්ට් බලපත්‍රයක් ඒ නිෂ්පාදිතය හෝ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍රයක් බවට; හෝ

(ඇ) ලේඛනයේ සටහන් කරන ලද සීමාකිරීම් සැලකිල්ලට ගත් කළ, පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කිරීමෙන් ඒ පේටන්ට් බලපත්‍රය පාවිච්චි කිරීමේ අනන්‍ය අයිතිවාසිකම් නොලැබෙන යම් අවස්ථාවල දී, එය පාවිච්චි කිරීමේ අනන්‍ය අයිතිවාසිකම ලියාපදිංචි කිරීමෙන් ලැබෙන බවට

කාර්මික හෝ වාණිජ කාර්යයන් සඳහා, කරුණු දක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් පේටන්ට් බලපත්‍රයක් සම්බන්ධයෙන් "ලියාපදිංචි" යන වචනය හෝ පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කර ඇති බව ප්‍රකාශ කෙරෙන හෝ හඟවන යම් වචනයක් හෝ වචන භාවිත කළ හොත්, ඒ පේටන්ට් බලපත්‍රය ලියාපදිංචි කර ඇති බවට ඔහු කරුණු දක්වන බව සැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර පිළිබඳ තොරතුරු යිති විරෝධී ලෙස අනාවරණය කිරීම.

149. ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සේවා නියුක්තියේ යෙදී සිටින හෝ සිටි යම් තැනැත්තකු විසින්, ඒ කාර්යාලයේ ඔහුගේ සේවා නියුක්ති කාලය අතරතුර, පේටන්ට් බලපත්‍රවලට හෝ ඊට සම්බන්ධ කාරණාවලට අදාළව ඔහු ලබාගත් යම් තොරතුරක්, ඒ තොරතුර ලබාගැනීමට හිමිකම් නොමැති හෝ බලය ලැබී නොමැති යම් තැනැත්තකුට දන්වුවහොත් හෝ ඒ තොරතුර මහජනයාට

අනාවරණය කළ හොත් හෝ ඒ තොරතුර වෙනත් යම් නීති විරෝධී ප්‍රයෝජනයකට යෙදවුවහොත්, ඔහු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

ලකුණු උල්ලංඝනය කිරීම.

150. ලකුණක යම් ලියාපදිංචි හිමියකුගේ, පැවරුම්ලාභියකුගේ හෝ අවසරලාභියකුගේ අයිතිවාසිකම් ඕනෑකමින්ම උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

වෙළෙඳ ලකුණු පිළිබඳව අසත්‍ය කරුණු දැක්වීම.

151. (1) (අ) ලියාපදිංචි ලකුණක් නොවන ලකුණක් සම්බන්ධයෙන්, ඒ ලකුණ ලියාපදිංචි ලකුණක් බවට;

(ආ) යම් භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි නොකරන ලද ලියාපදිංචි ලකුණක් ඒ භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ලියාපදිංචි කරන ලද ලකුණක් බවට; හෝ

(ඇ) ලේඛනයේ සටහන් කරන ලද සීමාකිරීම් සැලකිල්ලට ගත් කළ, ලකුණ ලියාපදිංචි කිරීමෙන් ඒ ලකුණ පාවිච්චි කිරීමේ අනන්‍ය අයිතිවාසිකම නොලැබෙන යම් අවස්ථාවල දී, එය පාවිච්චි කිරීමේ අනන්‍ය අයිතිවාසිකම ඒ ලියාපදිංචි කිරීමෙන් ලැබෙන බවට

කාර්මික හෝ වාණිජ කාර්යයන් සඳහා, කරුණු දක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් ලකුණක් සම්බන්ධයෙන් "ලියාපදිංචි" යන වචනය හෝ ඒ ලකුණ ලියාපදිංචි කර ඇති බව ප්‍රකාශ කෙරෙන හෝ හඟවන යම් වචනයක් හෝ වචන භාවිත කළ හොත් ඒ ලකුණ ලියාපදිංචි කර ඇති බවට ඔහු කරුණු දක්වන බව සැලකිය යුතු ය.

ලකුණු හා වෙළෙඳ විස්තර පිළිබඳ වෙනත් වැරදි.

152. (1) (අ) යම් ලකුණක් කුට ලෙස සැදුන; හෝ

(ආ) නොමඟ යැවීමට ඉඩ ඇති තරම් ලියාපදිංචි ලකුණකට සමාන පෙනුමක් තිබෙන යම් ලකුණක් හෝ ලකුණු භාණ්ඩවලට ව්‍යාජ ලෙස යොදන; හෝ

(ඇ) ලකුණක් කූට ලෙස සැදීමේ කාර්යය සඳහා හෝ ලකුණක් කූට ලෙස සැදීම පිණිස උපයෝගී කර ගැනීමේ කාර්යය සඳහා යම් මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් සාදන; හෝ

(ඈ) යම් ව්‍යාජ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට යොදන; හෝ

(ඉ) ලකුණක් කූට ලෙස සැදීමේ කාර්යය සඳහා යම් මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් විකුණන හෝ තම සන්තකයෙහි තබා ගන්නා; හෝ

(ඊ) මේ උපවගන්තියේ ඉහත සඳහන් දේවල් අතුරින් යමක් කිරීමට සලස්වන

යම් තැනැත්තෙක්, වංචා කිරීමේ චේතනාවෙන් තමා ක්‍රියා නොකළ බව ඔප්පු කළ හොත් හැර, මේ කොටසේ විධිවිධානවලට යටත්ව, වරදක් කරන්නේ ය.

(2) අවස්ථාවෝචිත පරිදි, යම් කූට ලකුණක් හෝ ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යොදන ලද හෝ නොමඟ යැවීමට ඉඩ ඇති තරම් ලියාපදිංචි ලකුණකට සමාන පෙනුමක් තිබෙන යම් ලකුණක් ව්‍යාජ ලෙස යොදන ලද යම් භාණ්ඩ හෝ දේවල් විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම සඳහා තම සන්තකයේ තබා ගෙන සිටින හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයක් සඳහා විකුණන, ප්‍රදර්ශනය කර තබන හෝ තමා සන්තකයේ තබා ගෙන සිටින යම් තැනැත්තකු විසින්—

(අ) කරන ලදැසි කියනු ලබන වරද කරනු ලැබූ වේලාවේ දී ලකුණේ හෝ වෙළෙඳ විස්තරයේ නීර්ව්‍යාජභාවය ගැන සැක කිරීමට තරම් කිසි හේතුවක්, වරදක් කිරීම වැළැක්වීම පිණිස සියලු සාධාරණ පූර්වෝපායයන් යෙදීම නිසා තමාට නොතිබුණු බව; සහ

(ආ) තමා ඒ භාණ්ඩ හෝ දේවල් ලබාගත්තේ යම් තැනැත්තන් ගෙන් ද, ඒ තැනැත්තන් සම්බන්ධයෙන් තමා විසින් සපයනු ලැබිය හැකිව තිබූ සියලු තොරතුරු චෝදක විසින් හෝ වෙනුවෙන් කරන ලද ඉල්ලීමක් අනුව සැපයූ බව; හෝ

(ඇ) වෙනත් කරුණු අනුව තමා නිර්දෝෂී ලෙස ක්‍රියා කර ඇති බව

ඔප්පු කරනු ලැබුවහොත් හැර, ඔහු වරදක් කරන්නේ ය.

(3) ශ්‍රී ලංකා දේශ සීමාවලින් පිටත සාදනු ලැබූ සහ සාමාන්‍ය යෙන් දිග ප්‍රමාණය අනුව හෝ කැලි වශයෙන් හෝ විකුණනු ලබන යම් කැලි භාණ්ඩ ආනයනය කරන යම් තැනැත්තෙක් හෝ ශ්‍රී ලංකාවේ දේශසීමා ඇතුළත හෝ දේශ සීමාවලින් පිටත හෝ සාදනු ලැබූ සහ සාමාන්‍යයෙන් ඉහත කී පරිදි විකුණනු ලබන සහ එක් එක් කැල්ලේ නියම දිග ප්‍රමාණය අනුව, එකී දිග ප්‍රමාණය සම්මත මීටර වලින් හෝ සම්මත මීටරවලින් සහ ඒ මීටරයක භාගයකින් ඒ එක් එක් කැල්ලේ ප්‍රකටව පෙනෙන ලෙස ඉංග්‍රීසි ඉලක්කම්වලින්

මුද්‍රණය කරනු ලැබ නොමැති යම් කැලි භාණ්ඩ විකුණන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම සඳහා තම සන්තකයේ තබා ගෙන සිටින හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයන් සඳහා විකුණන, ප්‍රදර්ශනය කර තබන හෝ තම සන්තකයේ තබා ගෙන සිටින යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය:

එසේ වුව ද, ශ්‍රී ලංකා දේශ සීමා ඇතුළත දී දැතේ ශ්‍රමයෙන් පමණක් සාදනු ලබන යම් කැලි භාණ්ඩවලට මේ උපවගන්තියේ සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ වරදක් කළ යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය. තව ද, දෙවන වරට හෝ තදනන්තරව හෝ වරදකරු කරනු ලැබූ විට, ඉහත කී දඩය හෝ බන්ධනාගාරගත කිරීමේ කාලය හෝ ඒ දෙකම හෝ දෙගුණ කරනු ලැබිය හැකි ය.

(5) වරද කළැයි කියනු ලබන තැනැත්තා වරදකරු කරනු ලැබුව ද නොලැබුව ද, වරද කර ඇත්තේ හෝ කළ හැකිව තිබුණේ යම් බඩු බාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ උපයෝගී කොටගෙන ද ඒ බඩු බාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ හෝ වරද කර ඇත්තේ හෝ කළ හැකිව තිබුණේ යම් බඩුබාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ සම්බන්ධයෙන් ද ඒ බඩුබාහිරාදිය, භාණ්ඩ, උපකරණ හෝ දේ විනාශ කරන ලෙස හෝ රාජ්‍ය සන්තක බව ප්‍රකාශ කරන ලෙස හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සුදුසු යයි අදහස් කරන ආකාරයකින් ඒ පිළිබඳව ක්‍රියා කරන ලෙස හෝ මහෙස්ත්‍රාත් වරයා විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

සංස්ථා විසින් කරනු ලබන වැරදි.

153. මේ සංග්‍රහය යටතේ වරදක් සංස්ථාවක් විසින් කරනු ලැබ ඇති අවස්ථාවක, වරද කරනු ලැබූ වේලාවේ දී සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරීවරයකු, ලේකම්වරයකු වූ හෝ සංස්ථාවේ වෙනත් එවැනි නිලධරයකු වූ හෝ එවැනි යම් තත්ත්වයකින් ක්‍රියා කිරීමට බැඳි සිටි හෝ සෑම තැනැත්තෙක් ම, ඒ වරද තමාගේ කැමැත්ත හෝ අපසහායකත්වය නොමැතිව සිදු කර ඇති බව සහ ඒ තත්ත්වය අනුව තම කර්තව්‍යවල ස්වභාවය සහ සැලකිල්ලට ගත් කළ, සියලු අවස්ථානුගත කරුණු අනුව, ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් ක්‍රියා කළ යුතුව තිබූ නිසි අනලස් භාවයෙන් යුතුව තමා ක්‍රියා කළ බවත් ඔහු ඔප්පු කළහොත් හැර, ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

154. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, 97 වන වගන්තියේ ඇතුළත් අර්ථකථනය මේ කොටසේ කාර්ය සඳහා අදාළ විය යුතු ය.

වෘජ තම හෝ මුල් අකුරු.

155. (1) භාණ්ඩවලට වෘජ වෙළෙඳ විස්තරයක් යෙදීම සම්බන්ධයෙන් වූ හෝ වෘජ වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ භාණ්ඩ සම්බන්ධයෙන් වූ හෝ මේ කොටසේ විධිවිධාන—

(අ) යම් භාණ්ඩ ඇත්ත වශයෙන් ම යම් තැනැත්තකු විසින් සාදන ලද දේ හෝ වෙළෙඳ බඩු වුව ද, ඒවා වෙනත්

තැනැත්තකු විසින් සාදන ලද දේ හෝ ඔහුගේ වෙළෙඳ බඩු බව තැනැත්තන්ට විශ්වාස කිරීමට ඉඩ ඇති පරිදි, ලියාපදිංචි ලකුණක් ඇතුළත් වන හෝ නොවන යම් ඉලක්කම්, වචන හෝ ලකුණු හෝ ඒවායේ සංයෝජන යක් හෝ සංයෝගයක් ඒ භාණ්ඩවලට යෙදීම පිළිබඳව ව්‍යාප්ත විය යුතු ය;

(ආ) යම් තැනැත්තකුගේ ව්‍යාජ නමක් හෝ මුල් අකුරු යම් භාණ්ඩවලට යෙදීම පිළිබඳව ද තැනැත්තකුගේ ව්‍යාජ නමක් හෝ මුල් අකුරු වෙළෙඳ විස්තරයක ආකාරයෙන් යොදන ලද භාණ්ඩවලට ද ව්‍යාප්ත විය යුතු ය.

තව ද, මේ කොටසේ කාර්ය සඳහා, "ව්‍යාජ නමක් හෝ මුල් අකුරු" යන යෙදුමෙන්, යම් භාණ්ඩවලට යොදන ලද,—

(i) ලකුණක් හෝ ලකුණක කොටසක් නොවන; සහ

(ii) එකම විස්තරයකට අයත් භාණ්ඩ සම්බන්ධයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන්නා වූ ද ස්වකීය නම හෝ මුල් අකුරු භාවිත කිරීමට බලය පවරා නැත්තා වූ ද තැනැත්තකුගේ නමට හෝ මුල් අකුරුවලට සමාන හෝ ඒ නමෙහි හෝ මුල් අකුරුවල ව්‍යාජ අනුකරණයක් වන; සහ

(iii) අඟුත තැනැත්තකුගේ හෝ ඒ භාණ්ඩ සම්බන්ධයෙන් නිර්ව්‍යාජ ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන නොයන යම් තැනැත්තකුගේ හෝ යම් නමක් හෝ මුල් අකුරු වන,

යම් තැනැත්තකුගේ යම් නමක් හෝ මුල් අකුරු අදහස් වේ.

(2) යම් වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ යම් භාණ්ඩවල ඇති නියම මිටර් ගණනට හෝ සම්මත මිටර් ගණනට වැඩි මිටර් හෝ සම්මත මිටර් ගණනක් ඒ භාණ්ඩවල අඩංගුව ඇති බව ඒ වෙළෙඳ විස්තරයෙන් දක්වන හෝ හඟවන විට එය ව්‍යාජ වෙළෙඳ විස්තරයක් වන්නේ ය.

කූට ලකුණු සැදීම.

156. (අ) යම් ලකුණක හිමියාගේ අනුමතය නොමැතිව, ඒ ලකුණු සාදන හෝ නොමග යැවීමට ඉඩ ඇති තරම් ඒ ලකුණට සමාන පෙනුමක් ඇති ලකුණක් සාදන; හෝ

(ආ) යම් නිර්ව්‍යාජ ලකුණක් අමූතු කිරීමෙන්, යමක් එකතු කිරීමෙන්, මැකීමෙන් හෝ අන්‍යාකාරයකින් එය වංක ලෙස වෙනස් කරන,

තැනැත්තකු ලකුණක් කූට ලෙස සැදූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ සාදන ලද හෝ වංක ලෙස වෙනස් කරන ලද යම් ලකුණක් කූට ලකුණක් ලෙස මේ කොටසේ සඳහන් කරනු ලැබේ:

එසේ වුව ද, ලකුණක් කූට ලෙස සැදීම සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක දී, හිමියාගේ අනුමතය ලබා ගත් බව ඔප්පු කිරීම චුදිතයා විසින් කළ යුතු ය.

පනත

157. (1) (අ) යම් වෙළෙඳ ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට ම යොදන; හෝ

ලකුණු සහ විස්තර. යෙදීම.

(ආ) භාණ්ඩ විකිණීමේ දී හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තැබීමේ දී නැතහොත් විකිණීම, වෙළෙඳාම හෝ සැදීම පිළිබඳ යම් කාර්යයක් සඳහා තම සන්තකයෙහි තබා ගැනීමේ දී, ඒ භාණ්ඩ බහාලනු ලැබ තිබූ හෝ ඒවා සමග වූ යම් ආවරණයකට, ලේබලයකට, බීරළුවකට හෝ වෙනත් දෙයකට යම් ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් යොදන; හෝ

(ඇ) විකුණනු ලබන හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර තබන හෝ විකිණීම, වෙළෙඳාම හෝ සැදීම පිළිබඳ යම් කාර්යයක් සඳහා තම සන්තකයෙහි ඇති යම් භාණ්ඩ, ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් යොදනු ලැබූ යම් ආවරණයක්, ලේබලයක්, බීරළුවක් හෝ වෙනත් දෙයක් තුළ තබන, ඊට ඇතුළත් කරන හෝ ඒ සමග අමුණන; හෝ

(ඈ) යම් ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් පාවිච්චි කරනු ලබන්නේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ ඒ ලකුණෙන් හෝ වෙළෙඳ විස්තරයෙන් දක්වන බව හෝ විස්තර කරන බව විශ්වාස කිරීමට ඉඩ ඇති යම් ආකාරයකින් ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය පාවිච්චි කරන

යම් තැනැත්තකු ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය ඒ භාණ්ඩවලට යොදා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) "ආවරණය" යන යෙදුමට යම් ආවරණයක්, පීප්පයක්, බෝතලයක්, භාජනයක්, පෙට්ටියක්, වැස්මක්, කෝෂයක්, කොපුවක්, රාමුවක් හෝ දවටනයක් ඇතුළත් වන අතර "ලේබලය" යන යෙදුමට යම් පටියක් හෝ සීවිටුවක් ඇතුළත් වේ.

(3) ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට හෝ යම් ආවරණයකට, ලේබලයකට, බීරළුවකට හෝ වෙනත් දෙයකට හොත්තා, ඔබ්බවා, මුද්‍රා තබා, හණ ගසා හෝ වෙනත් ආකාරයකින් නිර්මාණය කොට හෝ අමුණා හෝ සවිකොට තිබුණ ද, ඒ ලකුණ හෝ වෙළෙඳ විස්තරය ඊට යොදා ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) ලකුණක හිමියාගේ අනුමතය නොමැතිව ඒ ලකුණ හෝ නොමග යැවීමට ඉඩ ඇති තරම් ඒ ලකුණට සමාන පෙනුමක් ඇති යම් ලකුණක් හෝ යොදන තැනැත්තකු භාණ්ඩවලට ලකුණක් ව්‍යාජ ලෙස යෙදූ ලෙස සලකනු ලැබිය යුතු අතර භාණ්ඩවලට ලකුණක් ව්‍යාජ ලෙස යෙදීම සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක දී, හිමියාගේ අනුමතය ලබාගත් බව ඔප්පු කිරීම චුදිතයා විසින් කළ යුතු ය.

සාමාන්‍ය කුඩයුතුවල නියුක්ත ඇතැම් නෑනැත්තන් නිදහස් කිරීම.

158. ලකුණක් තුට ලෙස සෑදීමේ කාර්යය සඳහා හෝ තුට ලෙස සෑදීම් පිණිස උදයෝගි කර ගැනීමේ කාර්යය සඳහා යම් මුද්‍රාවක්, අච්චුවක්, යන්ත්‍රයක් හෝ වෙනත් උපකරණයක් සාදන ලද බවට හෝ යම් ලකුණක් හෝ නොමග යැවීමට ඉඩ ඇති තරම් ලකුණකට සමාන පෙනුමක් ඇති, යම් ලකුණක් භාණ්ඩවලට ව්‍යාජ ලෙස යොදන ලද බවට හෝ යම් ව්‍යාජ වෙළෙඳ විස්තරයක් භාණ්ඩවලට යොදන ලද බවට හෝ මේ වගන්තියේ සඳහන් දේවලින් යමක් කිරීමට සලස්වන ලද බවට නෑනැත්තකුට චෝදනා නගනු ලැබ ඇති අවස්ථාවක.—

(අ) ලකුණු සෑදීම සඳහා හෝ ලකුණු සෑදීමේ දී පාවිච්චි කිරීම සඳහා මුද්‍රා, අච්චු, යන්ත්‍ර හෝ වෙනත් උපකරණ සෑදීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි, භාණ්ඩවල ලකුණු හෝ විස්තර යෙදීම පිණිස තම සාමාන්‍ය කටයුතු වශයෙන් වෙනත් නෑනැත්තන් වෙනුවෙන් තමා සේවයේ නියුක්තව සිටින බව හා චෝදනාවට විෂය වූ කාරණයෙහි දී තමා ශ්‍රී ලංකාවෙහි වාසික යම් නෑනැත්තකු විසින් තමා එසේ සේවයේ නියුක්ත කරනු ලැබූ බව හා ඒ භාණ්ඩ විකිණීම මත රඳා පවත්නා ලාභ හෝ කොමිස් මුදල් ලැබීමේ අපේක්ෂාවෙන් ඒ භාණ්ඩ විෂයයෙහි තමාට සම්බන්ධතා වක් නොමැති බව; සහ

(ආ) චෝදිත වරද කිරීම වැළැක්වීම පිණිස තමා සාධාරණ පූර්වෝපායයන් යෙදූ බව; සහ

(ඇ) සරන ලදැයි කියනු ලබන වරද කරනු ලැබූ වේලාවේ දී ලකුණේ හෝ වෙළෙඳ විස්තරයේ නීර්ව්‍යාජත්වය ගැන සැක කිරීමට තමාට කිසිම හේතුවක් නොතිබුණු බව; සහ

(ඈ) ලකුණ හෝ වෙළෙඳ විස්තරය යොදන ලද්දේ යම් නෑනැත්තකු වෙනුවෙන් ද, ඒ නෑනැත්තා සම්බන්ධයෙන් තමා විසින් සපයනු ලැබිය හැකිව තිබූ සියලුම තොරතුරු තමා චෝදකට සැපයූ බව,

ඒ නෑනැත්තා විසින් ඔප්පු කරනු ලැබූ අවස්ථාවක, ඔහු චෝදනාවෙන් නිදහස් කළ යුතු ය. එහෙත් ඔහු ඉහත කී විත්තිවාචකයේ පිහිට පතන බව චෝදක වෙත විධිමත් ලෙස දැනුම් දී නිබුණහොත් හැර චෝදක විසින් දරන ලද විභාගී ගෙවීමට ඔහු යටත් විය යුතු ය.

ඔර්ලෝසු.

159. ඔර්ලෝසුවක් සෑදූ රට පිළිබඳ විස්තරයක් සංයුක්ත වන හෝ සාමාන්‍ය ප්‍රසිද්ධිය අනුව, ඒ ඔර්ලෝසුව සෑදූ රට පිළිබඳ විස්තරයක් සංයුක්ත වෙතැයි සලකනු ලබන යම් වචන හෝ ලකුණු ඒ ඔර්ලෝසු කොපවේ නිබෙන සහ ඔර්ලෝසුව සෑදූ රට පිළිබඳ විස්තරයක් ඔර්ලෝසුවෙහි සඳහන්ව නොමැති අවස්ථාවක, මේ කොටසේ අර්ථානුකූලව, ඒ වචන හෝ ලකුණු මල් බාල්මට ඒ රට පිළිබඳ විස්තරයක් ලෙස සැලකිය යුතු අතර ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යොදා ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සහ ව්‍යාජ වෙළෙඳ විස්තරයක් යෙදූ භාණ්ඩ විකිණීම හෝ විකිණීම පිණිස ප්‍රදර්ශනය කරනවීම හෝ තම සන්තකයෙහි තබා ගෙන සිටීම හෝ යම් වෙළෙඳ හෝ නිෂ්පාදන කාර්යයන් සඳහා ප්‍රදර්ශනය කර තැබීම හෝ තම සන්තකයෙහි තබාගෙන සිටීම සම්බන්ධයෙන් වූ මේ කොටසේ විධිවිධාන එපරිද්දෙන් ම අදාළ විය යුතු ය. තව ද මේ වගන්තියේ කාර්යය සඳහා "ඔර්ලෝසුව" යන යෙදුමෙන් ඔර්ලෝසුවක කොපුව හැර, එහි සෙසු සියල්ල අදහස් වේ.

ලකුණ උත්තරවාදයක විස්තර කළ යුතු ආකාරය.

160. යම් ලකුණක් හෝ කුට ලෙස සාදන ලද ලකුණක් ගැන සඳහන් කරනු ලැබීමට අදහස් කෙරෙන යම් අධිචෝදනාවක, චෝදනාවක, නඩු කටයුත්තක හෝ ලේඛනයක වැඩි විස්තරයක් හා යම් පිටපතක් හෝ ප්‍රතිකෘතියක් ඇතුළත් නොකර ඒ ලකුණ හෝ කුට ලෙස සාදන ලද ලකුණ, ලකුණක් හෝ කුට ලෙස සාදන ලද ලකුණක් ලෙස එහි සඳහන් කිරීම ප්‍රමාණවත් විය යුතු ය.

සාක්ෂි පිළිබඳ විශේෂ.

161. මේ කොටස යටතේ කරන ලද වරදක් සඳහා වූ යම් නඩු පැවරීමක දී—

(අ) වුදිතයා ද සුදුසු යයි වුදිතයා අදහස් කරන්නේ නම්, අවස්ථෝචිත පරිදි, ඔහුගේ භාර්යාව හෝ ඇගේ සැමියා සාක්ෂි කරුවකු ලෙස කැඳවනු ලැබිය හැකි අතර එසේ කැඳවනු ලැබුවහොත් වෙනත් යම් සාක්ෂිකරුවකු මෙන් ම, දිවුරවා, වුදිතයාගෙන් සහ අවස්ථෝචිත පරිදි, ස්වාමිපුරුෂයා ගෙන් හෝ භාර්යාවගෙන් ප්‍රශ්න කළ යුතු අතර හරස් ප්‍රශ්න ඇසීම සහ නැවත ප්‍රශ්න ඇසීම ද කරනු ලැබිය හැකි ය.

(ආ) ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වූ විටක, භාණ්ඩ නැවිගත කළ වරාය හෙලි කරන සාක්ෂි, භාණ්ඩ සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද ස්ථානය හෝ රට හෙළි කෙරෙන සාක්ෂි ලෙස මුල් බැල්මට සැලකිය යුතු ය.

අපයෝගයක ඝන්ව දඬුවම් කිරීම.

162. ශ්‍රී ලංකාව ඇතුළත දී කරනු ලැබුවහොත් මේ කොටස යටතේ වරදක් වන යම් ක්‍රියාවක් ශ්‍රී ලංකාවෙන් පිටත දී කිරීමට ශ්‍රී ලංකාව තුළ සිට අනුබල දෙන යම් තැනැත්තකු ඒ වරද කළ ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාව තුළ ඔහු වෙසෙන කවර හෝ දිස්ත්‍රික්කයක දී හෝ ස්ථානයක දී ඒ වරද කරනු ලැබූ විටක මෙන් ඒ දිස්ත්‍රික්කයේ දී හෝ ස්ථානයේ දී ඔහුට විරුද්ධව අධිචෝදනා කිරීමට, නඩු පැවරීමට, නඩු විභාගයක් පැවැත්වීමට හා විරදකරු කිරීමට ඔහු යටත් විය යුතු ය.

සෝදිසි වරෙන්තු.

163. (1) මේ කොටස යටතේ වූ වරදක් පිළිබඳව ලැබුණ තොරතුරක් අනුව, මහෙස්ත්‍රාත්වරයකු විසින්, ඒ තොරතුර මගින් චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාට තමන් ඉදිරියේ පෙනී සිටීට උත්තර දෙන ලෙස නියම කෙරෙන සිතාසියක් හෝ ඒ තැනැත්තා අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තුවක් නිකුත් කරන ලද අවස්ථාවක සහ ඒ සිතාසිය හෝ වරෙන්තුව නිකුත් කරනු ලැබූ විට හෝ ඉන් පසුව, ඒ වරද කිරීමට උපයෝගී කර ගන්නා ලැබූ භාණ්ඩ හෝ දේවල් හෝ ඒ වරද කරන්නා ලැබවේ යම් භාණ්ඩ හෝ දේවල් සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ හෝ දේවල් ඒ තොරතුර මගින් චෝදනා නගනු ලැබූ තැනැත්තාගේ යම් නිවසක හෝ ස්ථානයක තිබෙන බව හැතෑහෙන් යම් තැනක ඔහුගේ සන්තකයේ හෝ ඔහුගේ පාලනයට යටත්ව තිබෙන බව සෑක කිරීමට සාධාරණ හේතුවක් තිබෙන බවට දිවුරුම් පිට සපයන ලද තොරතුරකින් එකී මහෙස්ත්‍රාත්වරයා හෝ වෙන යම් මහෙස්ත්‍රාත්වරයකු සෑහීමට පත් වූ අවස්ථාවක, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් තම අත්සනින් යුතුව නිකුත් කළ හැකි වරෙන්තුවක් අනුව, යම් පොලිස් නිලධරයක විසින් හෝ වරෙන්තුවේ සඳහන් හෝ නම් කොට ඇති වෙනත් තැනැත්තකු විසින් හෝ දිවා කාලයෙහි යම් සාධාරණ වේලාවක ඒ නිවසට, ස්ථානයට හෝ

පනත

තැනට ඇතුළු වී ඒ භාණ්ඩ හෝ දේවල් සොයා ගෙන ඒවා තහනම්ට ගෙන ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය; තව ද, එවැනි යම් වරෙන්තුවක් යටතේ තහනම්ට ගත් භාණ්ඩ හෝ දේවල් කිසිවක් මේ කොටස යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත් වේද, නොවේ ද යන්න නිශ්චය කිරීමේ කාර්යය සඳහා ඒවා මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) භාණ්ඩ හෝ දේවල් කිසිවක හිමියා වරදකරු කරනු ලැබූ විටක, මේ කොටස යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත් වන ඒ භාණ්ඩවල හෝ දේවල්වල හිමියා කවරකු දැයි දැන නොසිටී නම් හෝ ඔහු සොයා ගත නොහැකි නම්, හුදෙක් ඒ රාජ්‍ය සන්තක කිරීම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා තොරතුරු සැපයිය හැකි ය; නැතහොත් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි ය. දැන්වීමෙහි සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී පටහැනි හේතු දක්වුවහොත් හැර, ඒ භාණ්ඩ හෝ දේවල් රාජ්‍ය සන්තක කරනු ලබන බවට මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දැන්වීමක් පළ කිරීමට සැලැස්විය හැකි ය. තව ද, ඒ වේලාවේ දී සහ ඒ ස්ථානයේ දී, හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙන යම් තැනැත්තකු විසින් හෝ භාණ්ඩ හෝ දේවල් විෂයයෙහි සම්බන්ධතාවක් ඇති වෙන යම් තැනැත්තකු විසින් හෝ ප්‍රමාණවත් පටහැනි හේතු දක්වනු ලැබුවහොත් හැර, ඒ භාණ්ඩ හෝ දේවල් හෝ ඉන් කිසිවක් රාජ්‍ය සන්තක කරන ලෙස මහෙස්ත්‍රාත් අධිකරණය විසින් ආඥා කළ හැකි අතර එවැනි සෑම ආඥාවක් ම අභියාචනයකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ හෝ මේ කොටසේ වෙනත් යම් විධි විධාන යටතේ රාජ්‍ය සන්තක කරන ලද භාණ්ඩ හෝ දේවල් කිසිවක් ඒවා රාජ්‍ය සන්තක කළ අධිකරණය විසින් ආඥා කළ හැකි ආකාරයකින් විනාශ කළ හැකි ය; නැතහොත් අන් ලෙසකින් බැහැර කළ හැකි ය. තව ද ඒ භාණ්ඩ පිළිබඳව කටයුතු කිරීමේ දී යම් නිර්දෝෂී පාර්ශ්වකරුවකු විසින් නිර්දෝෂී ලෙස දරන ලද යම් අලාභයක්, ඒ භාණ්ඩ (වෙළෙඳ ලකුණු හා වෙළෙඳ විස්තර පළමුවෙන් මකා හැර) බැහැර කිරීමෙන් ලබා ගත හැකි යම් මුදලකින් ඔහුට ගෙවන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

චිත්තීගේ සහ පැමිණිල්ලේ නඩු ගාස්තු.

164. මේ කොටස යටතේ වූ යම් නඩු පැවරීමක දී පිළිවෙලින් චුදිතයා විසින් හා පැමිණිලිකරු විසින් සපයන ලද තොරතුරුවලට ත්, චුදිතයාගේ සහ පැමිණිලිකරුගේ පැවැත්මටත් අධිකරණය විසින් සැලකිල්ල දක්වා, පැමිණිලිකරු විසින් චුදිතයාට නැතහොත් චුදිතයා විසින් පැමිණිලිකරුට ගාස්තු ගෙවිය යුතු යයි අධිකරණය විසින් ආඥා කළ හැකි අතර එසේ ප්‍රදානය කරනු ලබන ඒ මුදල් දඩයක් වූ විටක මෙන් එය අය කර ගත හැකි විය යුතු ය.

නඩු පැවරීමේ සීමාව.

165. මේ කොටස යටතේ වරදක් කිරීමෙන් පසු අවුරුදු තුනක කාලයක් ඉකුත් වීම හෝ පැමිණිලිකරු විසින් එය ප්‍රථමවරට අනාවරණය කර ගත් තැන් සිට අවුරුද්දක් ඉකුත් වීම යන මේ දෙකින් පළමුව ඉකුත් වන කාලයෙන් පසු ඒ වරද සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් ආරම්භ නොකළ යුතු ය.

ආනයනය කිරීම. තහනම් කිරීම.

166. (1) විකුණුවහොත් මේ කොටස යටතේ රාජ්‍ය සන්තක කිරීමට යටත් භාණ්ඩ ද, නම හෝ ලකුණ සමග භාණ්ඩ සැදූ හෝ නිෂ්පාදනය කළ ස්ථානය හා රට, නමෙහි හෝ වෙළෙඳ ලකුණෙහි වූ යම් අකුරක් තරම් විශාලවූත්, ප්‍රකටව පෙනෙන්නාවූත් අකුරු දක්වන සංඥුවක් තිබුණහොත් හැර, ශ්‍රී ලංකාවේ යම් සාදන්නකුගේ, බෙදන්නකුගේ හෝ වෙළෙන්දකුගේ නම හෝ ලකුණ වූ යම් නමක් හෝ ලකුණක් හෝ ශ්‍රී ලංකාවේ යම් සාදන්නකුගේ, බෙදන්නකුගේ හෝ වෙළෙන්දකුගේ නම හෝ ලකුණ යයි හැඟෙන හෝ එහි ව්‍යාජ අනුකරණයක් වූ යම් නමක් හෝ ලකුණක් යොදා ශ්‍රී ලංකා දේශ සීමාවලින් පිටස්තරව සාදනු ලැබූ හෝ නිෂ්පාදනය කරනු ලැබූ සියලුම භාණ්ඩ ද, සාමාන්‍යයෙන් දිග ප්‍රමාණය අනුව හෝ කැලි වශයෙන් විකුණනු ලබන, එක් එක් කැල්ලේ දිග ඒ මත ඉංග්‍රීසි ඉලක්කම්වලින් දැක්වෙන සම්මත මීටරවලින් හෝ එහි නියම දිග ප්‍රමාණය අනුව සම්මත මීටර වලින් හා ඒ මීටරයේ භාගයකින් ප්‍රකටව පෙනෙන ලෙස මුද්‍රිතව නොමැති සියලුම කැලි භාණ්ඩ ද ශ්‍රී ලංකාවට ආනයනය කිරීම මෙයින් තහනම් කරනු ලබන අතර ඒවා රේගු ආඥාපනතේ 43 වන වගන්තියේ සඳහන් කරනු ලැබූ සහ ඒ ආඥාපනතේ "ආ" උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ විටක මෙන්, ආනයනය කිරීම තහනම් කරන ලද භාණ්ඩ ගණයට මේ වගන්තියේ විධි විධානවලට යටත්ව, ඇතුළත් කළ යුතු ය.

(2) ඒ භාණ්ඩ කිසිවක් රඳවා ගැනීමට පෙර හෝ රේගුවට සම්බන්ධ නීතිය යටතේ ඒවා රාජ්‍ය සන්තක කරනු ලැබීම පිණිස තවදුරටත් කටයුතු කිසිවක් කිරීමට පෙර, ප්‍රධාන රේගු අයකැමි විසින් හෝ තත් කාර්යය සඳහා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විශේෂයෙන් පත් කළ වෙනත් නිලධරයකු විසින්, මේ වගන්තිය යටතේ වූ තොරතුරු, ඇප, කොන්දේසි හෝ වෙනත් කරුණු පිළිබඳ නියෝග පිළිපදින ලෙස නියම කළ හැකි අතර ඒ භාණ්ඩ, ආනයනය කිරීම මේ වගන්තියෙන් තහනම් කර ඇති භාණ්ඩයයි ඒ නියෝග වලට අනුකූලව තමන් සෑහීමට පත්වීම සඳහා අවශ්‍ය කටයුතු කළ හැකි ය.

(3) ආනයනය කිරීම මේ වගන්තිය යටතේ තහනම් කරන ලද භාණ්ඩ රඳවා ගැනීම හෝ රාජ්‍ය සන්තක කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ නියෝග හා ඒ රඳවා ගැනීමට හෝ රාජ්‍ය සන්තක කිරීමට පෙර පිළිපැදිය යුතු කොන්දේසි කිසිවක් වුවහොත්, ඒවා කලින් කල පැනවීම, ප්‍රත්‍යාදිෂ්ට කිරීම හා වෙනස් කිරීම ද, සැපයිය යුතු තොරතුරු, දැන්වීම් හා ඇප, සාක්ෂි සහ ඒ සාක්ෂි ඉදිරිපත් කිරීමේ ක්‍රමය ද ඒ නියෝග මඟින් නිශ්චය කිරීම, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ප්‍රධාන රේගු අයකැමි විසින් කරනු ලැබිය හැකි ය.

(4) ශ්‍රී ලංකාව තුළ වූ ස්ථානයක නමට සමාන නමක් හෝ ඒ නමෙහි ව්‍යාජ අනුකරණයක් භාණ්ඩ කිසිවක් මත දැක්වෙන අවස්ථාවක, ඒ ස්ථානය පිහිටි රටේ නම ඒ ස්ථානයේ නම ලියූ අකුරුවල විශාලත්වය තරමට ම විශාල වූ ද ප්‍රකටව පෙනෙන්නා වූ ද අකුරුවලින් ඒ සමගම දක්වා නොමැති නම්, මේ වගන්තියේ කාර්ය සඳහා, එය ශ්‍රී ලංකාව තුළ වූ ස්ථානයක නමක් ලෙස සැලකිය යුතු ය.

(5) ආනයනය කිරීම මේ වගන්තිය මගින් තහනම් කරන ලද සියලුම භාණ්ඩවලට ඒ නියෝග අදාළ කරනු ලැබිය හැකි ය, නැතහොත් ඒ භාණ්ඩවල විවිධ පන්ති සම්බන්ධයෙන් හෝ ඒ භාණ්ඩවලට අදාළ වැරදිවල විවිධ පන්ති සම්බන්ධයෙන් හෝ ඒ දෙනම නියෝග පැනවිය හැකි ය.

(6) තොරතුරු සපයන්නා විසින් සපයන ලද තොරතුරු අනුව කරන ලද යම් රඳවා තැබීමක් සම්බන්ධයෙන් හෝ ඒ රඳවා තැබීමට ආනුෂංගික වූ කටයුතු කිසිවක් සම්බන්ධයෙන් ප්‍රධාන රේගු අයකැමිට දරන්නට සිදු වූ සියලුම වියදම් හා අලාභ තොරතුරු සපයන්නා විසින් ප්‍රධාන රේගු අයකැමිට ආපසු ගෙවීම සඳහා නියෝග මගින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(7) මේ වගන්තිය යටතේ වූ සියලුම නියෝග ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය.

(8) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් සේ බලපැවැත්විය යුතු ය.

ලකුණු හෙළූ භාණ්ඩ විකිණීම පිළිබඳ විශේෂිත ප්‍රතිඥාර.

167. ලකුණක් හෝ වෙළෙඳ විස්තරයක් යෙදූ භාණ්ඩ කිසිවක් විකිණීමේ දී හෝ විකිණීම සඳහා වූ ගිවිසුමක දී පටහැනි තත්ත්වයක් ඇති බව ප්‍රකාශ කෙරෙන යම් ලියවිල්ලක් විකුණුම්කරු විසින් හෝ වෙනුවෙන් හෝ අත්සන් කොට විකිණීම කරනු ලබන වේලාවෙහි හෝ ගිවිසුමට බැඳෙන වේලාවෙහි ගැනුම්කරුට භාරදීම හෝ ගැනුම්කරු විසින් භාරගැනීම කරනු ලැබුවහොත් හැර, ලකුණ නිර්ව්‍යාජ ලකුණක් බවට හා එය කුට ලකුණක් හෝ ව්‍යාජ ලෙස යෙදූ ලකුණක් හෝ නොවන බවට හෝ මේ කොටසේ අර්ථානුකූලව වෙළෙඳ විස්තරය ව්‍යාජ වෙළෙඳ විස්තරයක් නොවන බවට විකුණුම්කරු විසින් ප්‍රතිඥාරයක් දෙන ලෙස සැලකිය යුතු ය.

ව්‍යාජ විස්තර පිළිබඳ විධිවිධාන ඇතැම් අවස්ථාවල දී අදාළ නොවීම.

168. මේ නීති සංග්‍රහය ක්‍රියාත්මකවීම ආරම්භයේ දී විශේෂ පන්තියක භාණ්ඩවල හෝ විශේෂ ක්‍රමයකින් සාදනු ලබන භාණ්ඩවල ද විශේෂ නිශ්චිත පන්තිය හෝ ඒ විශේෂ සෑදීමේ ක්‍රමය දැන්වීම පිණිස වෙළෙඳ විස්තරයක් ඒ භාණ්ඩවලට නීත්‍යනුකූලවත් සාමාන්‍ය ලෙසත් යොදනු ලබන අවස්ථාවක, ඒ වෙළෙඳ විස්තරය එසේ යොදනු ලැබූ විට, මේ කොටසේ ව්‍යාජ වෙළෙඳ විස්තරවලට අදාළ විධිවිධාන ඊට අදාළ නොවිය යුතු ය:

එසේ වුව ද, ඒ වෙළෙඳ විස්තරයට ස්ථානයක හෝ රටක නම ඇතුළත් වූ ද, එය යොදන ලද භාණ්ඩ ඇන්න වශයෙන් සෑදූ හෝ නිෂ්පාදනය කළ ස්ථානය හෝ රට පිළිබඳව නොමඟ යැවීමක් කළ හැකි වූ ද, ඇන්න වශයෙන් ඒ ස්ථානයෙහි හෝ රටෙහි භාණ්ඩ සෑදීම හෝ නිෂ්පාදනය කිරීම නොකරන ලද්දා වූ ද අවස්ථාවක, ඒ ස්ථානයෙහි හෝ රටෙහි නමට පෙරාතුව ම හෝ ඉක්බිතිව ම ඇන්න වශයෙන් භාණ්ඩ සෑදූ හෝ නිෂ්පාදනය කළ ස්ථානයෙහි හෝ රටෙහි නම, අනෙක් රටේ නමත් සමඟ ඒ වෙළෙඳ විස්තරය ලෙසම ප්‍රකට්ව පෙනෙන ආකාරයකින්, ඒ භාණ්ඩ එහි සෑදූ හෝ නිෂ්පාදනය කළ බවට ප්‍රකාශයක් ද සහිතව වෙළෙඳ විස්තරයට එකතු කරනු ලැබුවහොත් හැර, මේ වගන්තිය අදාළ නොවිය යුතු ය.

ආරක්ෂා කිරීම.

169. (1) මේ කොටසේ විධිවිධාන නිසා නොවේ නම්, යම් තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කළ හැකිවන යම් නඩුවකින්, සිවිල් නඩුවකින් හෝ වෙනත් නඩු කටයුත්තකින්, ඒ තැනැත්තා මේ කොටසේ විධිවිධාන නිසා නිදහස් නොවිය යුතු ය.

(2) යම් නඩුවක දී සම්පූර්ණ අනාවරණයක් කිරීම හෝ යම් ප්‍රශ්නයකට හෝ විචාරණයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ හිමිකම යම් තැනැත්තකුට මේ කොටසේ කිසිවකින් නොලැබිය යුතු ය. එහෙත් මේ කොටස යටතේ වූ වරදක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ඇති අපරාධ නඩු විභාගයක දී ඒ අනාවරණය කිරීම හෝ පිළිතුර ඒ තැනැත්තාට විරුද්ධව සාක්ෂියක් ලෙස ඇවේශ්‍ය කළ නොහැකි විය යුතු ය.

(3) ශ්‍රී ලංකාව තුළ වාසය කරන තම ස්වාමියාගේ උපදෙස්වලට අවනතව සද්භාවයෙන් ක්‍රියා කරන සහ චෝදක විසින් හෝ චෝදකයා වෙනුවෙන් හෝ කරන ලද ඉල්ලීමක් අනුව තම ස්වාමියා පිළිබඳ සම්පූර්ණ තොරතුරු සපයන ඔහුගේ යම් සේවකයකු, යම් අපරාධ නඩුවකට හෝ දඩුවමකට යටත් කරන්නක් ලෙස මේ කොටසේ ඇති කිසිවක් තේරුම් නොගත යුතු ය.

සංඥේය සහ ඇප දිය හැකි වැරදි.

170. මේ කොටස යටතේ වූ සියලු වැරදි 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථකථනය කර ඇති පරිදි "සංඥේය" සහ "ඇප දිය හැකි" යන පදවල අර්ථානුකූලව "සංඥේය" සහ "ඇප දිය හැකි" වැරදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

VII වන කොටස

විවිධ කරුණු

XXXI වන පරිච්ඡේදය

නියෝග

නියෝග.

171. (1) මේ නීති සංග්‍රහයේ විධිවිධාන හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්යය සඳහා ද නියම කළ යුතු යයි විශේෂයෙන්, මේ සංග්‍රහය යටතේ නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ද අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සියල්ල හෝ එයින් කිසිවක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) ලියාපදිංචි කිරීමේ ක්‍රියා පිළිවෙල;

(ආ) ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා භාණ්ඩ සහ සේවා වර්ගීකරණය;

(ඇ) ලියාපදිංචි කිරීම සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තු;

(ඈ) භාවිත කළ යුතු ආකෘති පත්‍ර;

(ඉ) මේ නීති සංග්‍රහයේ III වන, IV වන සහ V වන කොටස් යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ විධානය හෝ පාලනය යටතට පත් කර ඇති සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර ඒ පළ කිරීමේ දිනයෙහි සිට හෝ නියෝග යෙහි සඳහන් කළ හැකි පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු, ඉක්මණින් එය අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ අවලංගු කරන ලද සේ සැලකිය යුත්තේ යම් දිනයක සිට ද, ඒ දිනය දැක්වෙන නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

XXXII වන පරිච්ඡේදය

රෙජිස්ට්‍රාර්වරයා වෙත සහ අධිකරණය වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම සහ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පැවැත්වෙන කටයුතු සහ අධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු කටයුතු

ලේඛනයේ වැරදි හදිසැස්සීම් සහ ලේඛනය නිවැරදි කිරීම.

172. (1) යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක හිමියා විසින් හෝ වෙනුවෙන් නියමිත ආකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක ලියාපදිංචි හිමියාගේ නමෙහි, ලිපිනයෙහි හෝ විස්තරයෙහි; හෝ

(ආ) කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ වෙනත් යම් විස්තරයක් පිළිබඳව

නියෝගවලින් අවසර දී ඇති පරිදි, යම් වරදක් හරිගැස්සීම හෝ වෙනස් කිරීමක් ඇතුළත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) මේ නීති සංග්‍රහයේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව,—

(අ) යම් සටහනක් ලේඛනයෙහි ඇතුළත් නොකිරීමෙන් හෝ එහි ඇතුළත් කිරීම පැහැර හැරීමෙන් හෝ ප්‍රමාණවත් හේතු නොමැතිව යම් ලේඛනයක කරන ලද සටහනකින් හෝ යම් ලේඛනයක වැරදි ආකාරයකින් පවතින යම් සටහනකින් හෝ යම් ලේඛනයක යම් සටහනක ඇති වරදකින් හෝ දෝෂයකින් හෝ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් නියමිත ආකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට එවැනි සටහනක් කිරීම හෝ ඉවත් කිරීම හෝ වෙනස් කිරීම සඳහා අධිකරණය සුදුසු යැයි සලකන ආඥාවක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(ආ) යම් ලේඛනයක් නිවැරදි කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීමට අවශ්‍ය හෝ අවස්ථාවෝචිත යම් ප්‍රශ්නයක් මේ වගන්තිය යටතේ වූ යම් කටයුත්තක දී අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකිය.

(ඇ) යම් ලියාපදිංචි කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් ලියාපදිංචි කිරීම, පැවරීම හෝ අන්සතු කිරීම පිළිබඳ යම් වංචාවක් සම්බන්ධයෙන් වන විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ම මේ වගන්තියේ විධිවිධාන යටතේ අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(3) මේ නීති සංග්‍රහය යටතේ වූ නඩු කටයුත්තක දී ඉල්ලා ඇති සහනයට යම් ලේඛනයක වැරදි හරිගැස්සීම, එය වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම ඇතුළත් වන අවස්ථාවක පෙනී සිටීමට සහ කරුණු ඇසීමට රෙජිස්ට්‍රාර්වරයාට අසීමිතාසිකම් ඇති අතර, පෙනී සිටින ලෙස අධිකරණය විසින් විධාන කළහොත් ඔහු පෙනී සිටිය යුතු ය. අධිකරණය අන්‍යාකාර විධානයක් කළහොත් මිස, අධිකරණයේ පෙනී සිටි කරුණු කියා පෑම වෙනුවට ප්‍රශ්නයට විෂය වී ඇති කාරණය සම්බන්ධයෙන් තමා ඉදිරියේ පැවැත් වූ කටයුතු පිළිබඳව හෝ තමා විසින් දෙන ලද ඒ කාරණාවට බලපාන යම් තීරණයකට හේතු පිළිබඳව හෝ එවැනි කාරණාවල දී කාර්යාලයේ අනුගමනය කරනු ලබන ක්‍රියා මාර්ගය පිළිබඳව හෝ ඒ ප්‍රශ්නයට අදාළ වෙනත් යම් කරුණු පිළිබඳව හෝ සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරන්නා වූ ද රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් තමා දන්නා වූ ද විස්තර දැක්වෙන, තමා විසින් අත්සන් කරන ලද ලිඛිත ප්‍රකාශයක් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඒ ප්‍රකාශය ඒ නඩු කටයුත්තේ සාක්ෂිවල කොටසක් ලෙස සැලකිය යුතු ය.

(4) යම් ලේඛනයක වැරදි හරිගැස්සීමේ, එය වෙනස් කිරීමේ හෝ නිවැරදි කිරීමේ ප්‍රශ්නයක් පිළිබඳව අධිකරණය විසින් කටයුතු කිරීමේ දී ප්‍රශ්නයට විෂය වී ඇති සටහන පිළිබඳව හෝ කරන ලෙස ඉල්ලා සිටින වැරදි හරිගැස්සීම්, වෙනස් කිරීම හෝ නිවැරදි කිරීම පිළිබඳව හෝ රෙජිස්ට්‍රාර්වරයා කර ඇති තීරණ සමාලෝචනය කිරීමට ඒ අධිකරණයට බලය තිබිය යුතු ය.

යම් ලේඛනයක පළුදු වූ වෙළුම්වල පිටපත් ගැනීමට සහ ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරු පිළියෙල කොට ඇතුළත් කිරීමට ඇති බලය.

173. (1) මේ නීති සංග්‍රහය යටතේ තබාගෙන ඇති යම් වෙළුමක් ප්‍රතිසංස්කරණය කළ නොහැකි වන තරම් පළුදු වී ඇතැයි රෙජිස්ට්‍රාර් වරයා සැහීමට පත්වන කවර අවස්ථාවක දී වුව ද, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් එහි පිටපතක් සැදීමට සලස්වා, එය සත්‍ය පිටපතක් බව සහතික කිරීමට සැලැස්විය යුතු ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සහ සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද යම් පිටපතකින්, ඒ පිටපතේ මුල් වෙළුම ප්‍රතියෝජනය වන අතර ඒ පිටපතින් ප්‍රතියෝජනය කෙරෙන වෙළුමේ ඇති නෛතික බලය හා බලපෑම ම ඒ පිටපතට ඇතැයි සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පිටපතක් සාදවන ලද සෑම පළුදු වූ වෙළුමක් ම අවශ්‍ය විය හැකි යම් ආශ්‍රිත කටයුත්තක් සඳහා සාධාරණ ලෙස පරිරක්ෂණය කළ හැකිතාක් කල්, පරිරක්ෂණය කිරීමට රෙජිස්ට්‍රාර්වරයා විසින් සැලැස්විය යුතු ය.

(4) යම් වෙළුමක යම් පත් ඉරුවක් නැතිවී, එය සොයාගත නොහැකි බවට පත්වී හෝ එසේ වූ යම් පත්ඉරුවක් නිත්‍ය වශ යෙන් ම විකෘත වී ඇති බවට හෝ එහි වූ සටහන් හෝ ඒ සටහන් වලින් සැලකිය යුතු කොටසක් කියවිය නොහැකි වන සේ මැකී හෝ

පළුදු වී ඇති බවට, නිසි විමර්ශනයකින් පසු රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත්වන කවර අවස්ථාවක වුව ද, ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුවක් පිළියෙල කිරීමට ඔහු විසින් සැලැස්විය යුතු ය.

(5) පහත දැක්වෙන කරුණු සඳහා විධිවිධාන සැලැස්වෙන නියෝගවලට අනුකූලව මිස, කිසිම පත්ඉරුවක්, (4) වන උප වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ප්‍රතිසංස්කරණය නොකළ යුතු ය:—

(අ) නැති වූ හෝ විකෘති වූ හෝ පළුදු වූ පත්ඉරුවෙහි කලින් අඩංගුව තිබූ කරුණු නිශ්චය කොට දැන ගැනීමෙහි ලා ආවේශ්‍ය කළ යුතු හා උපයෝගී කරගත යුතු සාක්ෂි;

(ආ) ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුවක් පිළියෙල කිරීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් නිවේදනය කිරීම;

(ඇ) ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුවේ අඩංගු කරුණු කිසිවක් බලපෑ හැකි යම් තැනැත්තකු විසින් විරුද්ධත්වය ප්‍රකාශ කිරීම; සහ

(ඈ) රෙජිස්ට්‍රාර්වරයා විසින් එවැනි යම් විරුද්ධත්වයක් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම.

(6) මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් පත්ඉරුවක් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අවස්ථාවක ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුව සත්‍ය පත්ඉරුවක් බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකාරයෙන් සහතික කොට ඉන් ඉක්බිතිව, අවස්ථාවෝචිත පරිදි, ලේඛනයෙහි උචිත වෙළුමෙහි නැතිවූ පත්ඉරුව කලින් තිබූ ස්ථානයෙහි හෝ විකෘති වූ හෝ පළුදු වූ පත්ඉරුව තිබූ ස්ථානයෙහි හෝ මේ වගන්තියේ විධිවිධාන යටතේ පිළියෙල කරන ලද වෙළුමක පිටපතක හෝ එය අන්තර්ගත කිරීමට සැලැස්විය යුතු ය. තව ද ප්‍රතිසංස්කරණය කරන ලද පත්ඉරුව එසේ සෑබෑ පත්ඉරුවක් බවට සහතික කොට, අන්තර්ගත කරනු ලැබූ කල්හි, ඒ පත්ඉරුවෙන් ප්‍රතියෝජිත පත්ඉරුවේ ඇති නෛතික බලය හා බලපෑම් ඒ පත්ඉරුවට තිබෙන බව සියලු කාර්ය සඳහා සැලකිය යුතු ය.

(7) මේ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ තබාගන්නා ලද ලේඛනයක වූ යම් සටහනක හෝ නිකුත් කරන ලද යම් සහතිකයක හෝ තිබී සමුවිය හැකි යම් ලිපිදෝෂයක් හෝ අත්හැරීමක්, රෙජිස්ට්‍රාර් වරයා විසින් අවශ්‍ය යයි සලකන පරීක්ෂණයකින් පසු ඔහු විසින් නිවැරදි කරනු ලැබිය හැකි අතර තත් කාර්යය සඳහා එසේ වූ යම් සහතිකයක් ආපසු ගෙන්වා, එය සංශෝධනය කරනු ලැබිය හැකි ය; නැතහොත් ඒ වෙනුවට අලුතෙන් සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

රෙජිස්ට්‍රාර් වරයාගේ සහතිකය සාක්ෂි විය යුතු බව.

174. මේ නීති සංග්‍රහයෙන් හෝ ඒ යටතේ සාදන ලද නියෝග වලින් හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් යෙදීමට හෝ කිරීමට බලය පැවරෙන යම් සටහනක්, කරුණක් හෝ දෙයක් පිළිබඳව. රෙජිස්ට්‍රාර් වරයා විසින් අත්සන් කරන ලදැයි හැඟෙන සහතිකයක්, ඒ සටහන යෙදූ බවට හා එහි අඩංගු කරුණු පිළිබඳව ද ඒ කරුණ නැතහොත් දෙය කළ හෝ නොකළ බවට ද බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

සාක්ෂික කරන ලද විටපත් සාක්ෂි විය යුතු බව.

175. මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යාලයෙහි ගොනු කොට හෝ තබා ගෙන හෝ ඇති යම් ලියවිල්ලක, ලේඛනයක හෝ වෙනත් පොතක, මුද්‍රිත, යාන්ත්‍රිකව පිළියෙල කළ, යතුරු ලිඛිත හෝ ලිඛිත සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් සහතික කරනු ලැබූ බව හැඟවෙන පිටපත් හෝ උඛෘත, තවදුරටත් ඔප්පු කිරීමක් හෝ මුල්පිටපත් ඉදිරිපත් කිරීමක් නොමැතිව, ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණවල දී ද සියලු නඩු කටයුතුවල දී ද සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ යුතු ය.

සාක්ෂි දීමේ ක්‍රමය.

176. (1) මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ පැවැත්වෙන යම් කටයුත්තක දී හෝ අධිකරණය ඉදිරියේ පැවැත්වෙන යම් නඩු කටයුත්තක දී, පවතින විධාන දී නොමැති විටක, දිවුරුම් පත්‍රයක් මගින් සාක්ෂි දිය යුතු ය. එහෙත් දිවුරුම් පත්‍රයක් මගින් සාක්ෂි ගැනීම වෙනුවට හෝ ඊට අතිරේකව හෝ, වාචික සාක්ෂි ගැනීම සුදුසු යයි රෙජිස්ට්‍රාර්වරයාට හෝ අධිකරණයට හෝ හැඟෙන යම් අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ අධිකරණය විසින් හෝ එසේ කරනු ලැබිය හැකි ය.

(2) පැමිණීමට සාක්ෂිකරුවන්ට බලකිරීම සඳහාත් ලේඛන ඉදිරිපත් කරන ලෙස බලකිරීම සඳහාත් තමන් ඉදිරිපිට සාක්ෂි දෙනු ලබන සියලුම තැනැත්තන් දිවුරවීම සඳහාත්, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ පත් කරන ලද කොමිෂන් සභාවක් වෙත පැවරෙන බලතල, සාක්ෂිවලින් යම් කොටසක් සම්මුඛව ගනු ලබන අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීම.

177. මේ නීති සංග්‍රහය මගින් හෝ ඒ යටතේ සාදන ලද නියෝගවලින් හෝ රෙජිස්ට්‍රාර්වරයා වෙත යම් අභිමතානුසාරී බලයක් හෝ වෙනත් බලයක් හෝ පැවරී ඇති අවස්ථාවක (කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් දෙන ලෙස නියමිත කාලය ඇතුළත විධිමත් ලෙස ඉල්ලා සිටියහොත්) කරුණු ඉදිරිපත් කිරීමට, කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම්කරුට හෝ ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියාට අවස්ථාවක් නොදී, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ බලය ඒ ඉල්ලුම්කරුට හෝ ඒ හිමියාට හානිකර ලෙස බලපාන අන්දමින් ක්‍රියාත්මක නොකළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා විසින් නීති නිලධරයාගේ උපදෙස් ලබා ගත හැකි බව.

178. මේ නීති සංග්‍රහයේ විධිවිධාන කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී උද්ගත වන යම් සැකයක් හෝ ගැටළුවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් නීතිපතිවරයාගේ හෝ නියෝජ්‍ය නීතිපතිවරයාගේ හෝ උපදෙස් ඉල්ලා සිටිය හැකි ය.

කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක්, ලකුණක් උල්ලංඝනය කිරීම පිළිබඳව එහි ලියාපදිංචි හිමියා විසින් පවරනු ලබන නඩු කටයුතු.

179. යම් තැනැත්තකුගෙන් යම් කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් උල්ලංඝනය කිරීමේ තර්ජනයක් පවතින බව හෝ යම් තැනැත්තකු විසින් යම් කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් උල්ලංඝනය කර ඇති බව හෝ ඒ උල්ලංඝනය සිදුවීමට ඉඩ ඇති ක්‍රියා සිදුවන බව, අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියා විසින් ඔප්පු කරන ලද අවස්ථාවක, ඒ උල්ලංඝ

නය සිදු කිරීමෙන් හෝ කරගෙන යාමෙන් හෝ එකී ක්‍රියාවන් කිරීමෙහි හෝ එකී තැනැත්තා වළක්වන ඉන්ජන්ක්ෂන් තහනමක් අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි අතර අධිකරණයට සාධාරණයයි ද උචිතයයි ද පෙනී යන අලාභ නියම කිරීම සහ සහන සැලසීම ද කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, ඒ නඩු කටයුත්තේ දී ම, අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ හෝ එහි යම් කොටසක ලියාපදිංචිය බලරහිත හෝ ශූන්‍ය බව ප්‍රකාශයට පත් කරන ලෙස චිත්තිකරු විසින් අධිකාරණයෙන් ඉල්ලුම් කළ හැකි අතර එසේ වූ විට 57 වන, 58 වන, 95 වන, 96 වන, 130 වන සහ 131 වන වගන්තිවල විධිවිධාන උචිත පරිදි අදාළ විය යුතු ය.

උල්ලංඝනය පිළිබඳව අවසරලාභී විසින් හෝ අවසරලාභීගේ ඉල්ලීම පිට හෝ පවරනු ලබන නඩු කටයුතු.

180. කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් සම්බන්ධයෙන් වූ අවසර හිමිසුමක පටහැනි විධිවිධාන කිසිවක් නොමැති විට, අවසරලාභි විසින්—

(අ) 179 වන වගන්තියේ සඳහන් තර්ජිත උල්ලංඝනය, උල්ලංඝනය හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටීමෙන් කාර්මික සැලසුමේ පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියාගෙන් ඉල්ලා සිටිය හැකි ය:

එසේ වුව ද තර්ජිත උල්ලංඝනය, උල්ලංඝනය හෝ, සිදු කෙරෙන ක්‍රියා, අවසරලාභි විසින් පෙන්වා දී, ඔහු අපේක්ෂා කරන සහනය ද නිශ්චිතව සඳහන් කළ යුතු ය.

(ආ) එකී ඉල්ලීම ලැබී මාස තුනක් ඇතුළත ඉන්ජන්ක්ෂන් තහනමක් ඉල්ලුම් කිරීම එකී කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියා ප්‍රතික්ෂේප කළහොත් හෝ පැහැර හැරියහොත්, ලියාපදිංචි හිමියාට දැනුම් දී, තමාගේ ම නමින් ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කරන ලෙස ඉල්ලුම් කළ හැකි අතර ලියාපදිංචි හිමියාට ද ඒ නඩු කටයුත්තට සම්බන්ධ විය හැකි ය:

එසේ වුවද, අනල්ප අලාභ සිදුවීම වළක්වාලනු පිණිස වහා ක්‍රියා කිරීම අවශ්‍ය බව අවසරලාභී විසින් ඔප්පු කරනු ලැබුවහොත්, අවසරලාභීගේ ඉල්ලීම පරිදි, (ආ) වන උපවගන්තියේ සඳහන් මාස තුනක කාල සීමාව ඉකුත්වීමට පෙර වුව ද, අධිකරණය විසින් ඉන්ජන්ක්ෂන් තහනමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශය.

181. (1) යම් කාර්මික සැලසුමකට, පේටන්ට් බලපත්‍රයකට හෝ ලකුණකට නීත්‍යනුකූල සම්බන්ධතාවක් පෙන්වන යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද සහ අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියා ද පාර්ශ්වකරුවකු කරනු ලැබිය යුතු ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට, තර්ජිත ක්‍රියාව කිරීමෙන් හෝ යම් නිශ්චිත ක්‍රියාවක් කිරීමෙන් එකී කාර්මික සැලසුම, පේටන්ට් බලපත්‍රය හෝ ලකුණ විෂයෙහි තර්ජිත උල්ලංඝනයක් හෝ උල්ලංඝනයක් සංයුක්ත නොවන බව අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(2) එකී ඉල්ලුම් පත්‍රය පිළිබඳව, අවස්ථාවෝචිත පරිදි, ඒ කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ හෝ ලකුණේ ලියාපදිංචි හිමියා විසින් යම් පැවරුම්ලාභියකුට හෝ අවසරලාභියකුට දෙනුම් දිය යුතු අතර, ලියාපදිංචි හිමියා සමග ඇතිකර ගන්නා ලද යම් එකඟවීමක පටහැනි විධිවිධාන කිසිවක් නොමැති නම්, ඒ පැවරුම් ලාභියාට හෝ අවසරලාභියාට හෝ ඒ නඩු කටයුත්තට සම්බන්ධ වීමට හිමිකම නිබිය යුතු ය.

(3) උල්ලංඝනය නොකිරීම පිළිබඳ ප්‍රකාශයක් සඳහා නඩු කට යුතු, යම් කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක ලියාපදිංචිය බලරහිත හා ශූන්‍ය බව ප්‍රකාශ කිරීම සඳහා වූ නඩු කට යුතු හා සමගාමීව පවරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, උල්ලංඝනය නොකිරීම් පිළිබඳ ප්‍රකාශයක් සඳහා වූ නඩු කටයුත්තක ප්‍රස්තුත කරුණු, ඒ වනවිටත් උල්ලංඝනය පිළිබඳ නඩු කටයුත්තක විෂයය වී ඇති කරුණු නොවිය යුතු ය.

(4) මේ නීති සංග්‍රහය යටතේ ඉන්ජන්ක්ෂන් තහනමක් සඳහා අධිකරණය වෙත කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයකට ම 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ සහ සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ විය යුතු ය.

අභියාචන.

182. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ නීති සංග්‍රහයේ යම් විධි විධානයක් යටතේ කරන ලද යම් තීරණයකින් හෝ නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඊට විරුද්ධව අධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් අභියාචනයක දී, මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති අභිමතානුසාරී බලතල ම අධිකරණයට නිබිය යුතු අතර අධිකරණය විසින් එම බලතල ක්‍රියාත්මක කළ යුතු ය.

(3) මේ නීති සංග්‍රහය යටතේ දිසා අධිකරණයේ සෑම නඩු තීන්දුවක් ම හෝ ආඥාවක් ම අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබීමට යටත් වන අතර ඒ අභියාචනය, දිසා අධිකරණවලින් කෙරෙන අතුරු අභියාචන පාලනය කෙරෙන රීතිවලට ඒ යටත් විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට පැවැත්වෙන කටයුතු පිළිබඳ හා අධිකරණය ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු පිළිබඳ ගාස්තු.

183. (1) මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරිපිට පැවැත්වෙන සියලුම කටයුතුවල දී රෙජිස්ට්‍රාර්වරයා විසින් සාධාරණයයි සැලකිය හැකි ගාස්තු යම් පාර්ශ්වකරුවකුට ප්‍රදානය කිරීමේ හා කවර පාර්ශ්වකරුවන් විසින් කවර පාර්ශ්වකරුවන්ට ඒ ගාස්තු ගෙවිය යුතු දැයි නියම කිරීමේ බලය ඔහු සතුව නිබිය යුතු ය; තව ද ඒ නියමය අධිකරණයේ ගොනුකොට තැබිය හැකි අතර එතැන් පටන් ඒ නියමය අධිකරණයේ නියමයක් වූ විටක මෙන් බලාත්මක කරනු ලැබිය හැකි ය.

(2) මේ නීති සංග්‍රහය යටතේ අධිකරණයක් ඉදිරිපිට පැවැත්වෙන සියලුම නඩුකටයුතුවල දී රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු ගාස්තු අධිකරණයේ අභිමතය පරිදි විය යුතු ය; එහෙත් පාර්ශ්වකරුවන් අතුරෙන් වෙනත් යම් පාර්ශ්වකරුවකුට ගාස්තු ගෙවනු ලෙස රෙජිස්ට්‍රාර්වරයා මෙම නියම කොඩාළ යුතු ය.

මුද්දර ගාස්තු.

184. මුද්දර සම්බන්ධයෙන් තත් කාලයෙහි බලපවත්නා ප්‍රඥප්තියෙහි විධිවිධාන යටතේ සිවිල් නඩු කටයුතුවල දී දිසා අධිකරණය විසින් අය කරනු ලැබිය හැකි සහ අභියාචනාධිකරණය විසින් අය කරනු ලැබිය හැකි අවම මුද්දර ගාස්තු, ඒවා අදාළ කළ හැකිතාක් දුරට සහ මෙහි අන්‍යාකාර විධිවිධාන සලසා ඇති පරිදි හැර, දිසා අධිකරණයෙහි සහ අභියාචනාධිකරණයෙහි මේ නීති සංග්‍රහය යටතේ පැවැත්වෙන ඉයලු නඩුකටයුතුවල දී අය කළ යුතු ය:

එසේ වුවද, කිසිම අවස්ථාවක දී, යම් මුද්දරයක් පාවිච්චි කරන ලෙස රෙජිස්ට්‍රාර්වරයාට නියම කිරීම හෝ යම් මුද්දර ගාස්තුවක් ඔහුගෙන් අයකිරීම හෝ නොකළ යුතු ය.

අරමුදල.

185. (1) මේ නීති සංග්‍රහයේ කාර්ය සඳහා වෙළෙඳ ඉිෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් විධාන කළ හැකි ආකාරයකින් පවත්වාගෙන යා යුතු අරමුදලක් පිහිටුවිය යුතු ය.

(2) මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරගනු ලබන සෑම ගාස්තුවකින් ම හෝ අයකිරීමකින් ම තුනෙන් දෙකොටසක් අරමුදලට ගෙවිය යුතු ය.

(3) රෙජිස්ට්‍රාර්වරයා විසින් නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින් ම හා අය කිරීමකින් ම ශේෂ වන තුනෙන් එක් කොටස ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(4) මේ නීති සංග්‍රහය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තම බල තල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේහි, ඉටු කිරීමෙහි හා කිරීමෙහි ලා දරන ලද යම් වියදමක් පියවීම පිණිස අවශ්‍ය සියලුම මුදල් හා (1) වන උපවගන්තියේ සඳහන් අරමුදලින් ගෙවීමට මේ නීති සංග්‍රහය මගින් හෝ ඒ යටතේ හෝ මේ නීති සංග්‍රහය යටතේ සාදන ලද යම් නියෝගයක් මගින් හෝ ඒ යටතේ හෝ නියමකර නිබෙන සියලුම මුදල් ඒ අරමුදලින් ගෙවිය යුතු ය.

(5) වෙළෙඳ විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් එක් එක් ලින් අවුරුද්ද අවසාන වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පිළියෙල කිරීම ද. එක් එක් ලින් අවුරුද්ද සම්බන්ධයෙන් අරමුදල පිළිබඳව පූර්ණවූත්, ඵලිතවූත් ගිණුමක් පවත්වාගෙන යෑමට සැලැස්වීම ද කළ යුතු ය.

(6) විගණකාධිපතිවරයා විසින් අරමුදලේ ගණන් විගණනය කළ යුතු ය.

(7) අරමුදලේ මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතු ය.

අර්ථ නිරූපණය.

186. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ නීති සංග්‍රහයෙහි—

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මූදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;

"සම්මුති රට" යන්නෙන් කාර්මික දේපළ ආරක්ෂා කිරීම සඳහා වූ පැරිස් සම්මුතියට එකඟත්වය ප්‍රකාශ කොට හෝ එය අනුමත කොට ඇති හෝ මින් මතු එකඟත්වය ප්‍රකාශ කළ හැකි හෝ අනුමත කළ හැකි යම් රටක් අදහස් වන අතර, යම් රටක් හා ශ්‍රී ලංකාව අතර කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු සම්බන්ධයෙන් සහ ඒවා ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අන්‍යොන්‍ය අයිතිවාසිකම් හා බැදීම් ඇති කෙරෙන යම් ගිවිසුමකට, සම්මුතියකට හෝ වැඩ පිළිවෙලකට ඇතුළත් වී ඇති හෝ මින් මතු ඇතුළත් විය හැකි විටක ඒ රට ද ඊට ඇතුළත් වේ;

"අධිකරණය" යන්නෙන් කොළඹ දිසා අධිකරණය අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ නීති සංග්‍රහය මගින් හෝ ඒ යටතේ වූ නියෝග කිසිවක් මගින් හෝ නියමිත යන්න අදහස් වේ.

XXXIII වන පරිච්ඡේදය

පරිච්ඡින්න කිරීම් සහ ආරක්ෂා කිරීම්

ප්‍රකාශන අයිතිය: 154 වන අධිකාරය පරිච්ඡින්න කිරීම සහ ආරක්ෂා කිරීම්.

187. (1) (154 වන අධිකාරය වූ) ප්‍රකාශන අයිතිය පිළිබඳ ආඥා පනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) නියමිත දිනයෙන් පසු යම් ප්‍රකාශන අයිතියක් විෂයෙහි ලා අත්කර ගනු ලබන යම් අයිතිවාසිකමකට හෝ හිමිකමකට එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ 1911 ප්‍රකාශන අයිතිය පිළිබඳ පනත හෝ එහි යම් විධිවිධානයක් හෝ අදාළ නොවිය යුතු ය.

(3) ඉහත කී ආඥාපනත පරිච්ඡින්න කරනු ලැබුව ද, ඒ ආඥා පනත යටතේ සහ එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ 1911 ප්‍රකාශන අයිතිය පිළිබඳ පනතේ 14 වන වගන්තිය යටතේ සාදන ලදුව, නියමිත දිනයෙහි බලපවත්නා සෑම නියෝගයක් ම, මේ නීති සංග්‍රහයේ II වන කොටසේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ නීති සංග්‍රහය යටතේ සාදන ලද නියෝගයක් සේ සැලකිය යුතු අතර, මේ නීති සංග්‍රහය යටතේ සාදන නියෝග මගින් ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

කාර්මික සැලසුම්: 153 වන අධිකාරය පරිච්ඡින්න කිරීම හා ආරක්ෂා කිරීම්.

188. (1) (153 වන අධිකාරය වූ) සැලසුම් පිළිබඳ ආඥාපනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) ඉහත කී ආඥාපනත පරිච්ඡින්න කරනු ලැබුව ද, ඒ ආඥාපනත යටතේ සාදන ලදුව, නියමිත දිනයෙහි බලපවත්නා සෑම නියෝගයක් ම මේ නීති සංග්‍රහයේ III වන කොටසේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ නීති සංග්‍රහය යටතේ සාදන ලද නියෝගයක් සේ සැලකිය යුතු අතර, මේ නීති සංග්‍රහය යටතේ සාදන නියෝග මගින් ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම, පරිච්ඡින්න කරන ලද ආඥාපනතක් යටතේ පැවති සැලසුම් ලේඛනයේ හෝ කලින් තිබූ යම් ආඥාපනතක් යටතේ පැවති සහ පළමු කී ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ, එහිම කොටසක් විය යුතු යයි ප්‍රකාශයට පමුණුවන ලද යම් සැලසුම් ලේඛනයක හෝ ඇතුළත් සැලසුමක් පිළිබඳ මුල් සටහනේ වලංගුභාවය, ඒ සටහන කළ දිනයේ බලපැවැත් වූ නීතියට අනුකූලව නිශ්චය කළ යුතු අතර ඒ සෑම සැලසුමක් ම සඳහා එහි මුල් දිනය වෙන්කොට තැබිය යුතු ය. එහෙත් සියලුම කාර්ය සඳහා මේ නීති සංග්‍රහයේ III වන කොටස යටතේ එය ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

පේටන්ට් බලපත්‍ර: 152 වන අධිකාරය පරිච්ඡින්න කිරීම සහ ආරක්ෂා කිරීම්.

189. (1) (152 වන අධිකාරය වූ) පේටන්ට් බලපත්‍ර පිළිබඳ ආඥාපනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) ඉහත කී ආඥාපනත පරිච්ඡින්න කරනු ලැබුව ද, ඒ ආඥාපනත යටතේ සාදන ලදුව, නියමිත දිනයෙහි බලපවත්නා සෑම නියෝගයක් ම මේ නීති සංග්‍රහයේ IV වන කොටසේ විධිවිධාන වලට අනනුකූල නොවනතාක් දුරට, මේ නීති සංග්‍රහය යටතේ සාදන ලද නියෝගයක් සේ සැලකිය යුතු අතර, මේ නීති සංග්‍රහය යටතේ සාදන නියෝග මගින් ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) නියමිත දිනයට පෙරාතුව ම, පරිච්ඡින්න කරන ලද ආඥාපනත යටතේ පැවති පේටන්ට් බලපත්‍ර ලේඛනයේ හෝ කලින් තිබූ යම් ආඥාපනතක් යටතේ පැවති සහ පළමු කී ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ, එහිම කොටසක් විය යුතු යයි ප්‍රකාශයට පමුණුවන ලද යම් පේටන්ට් බලපත්‍ර ලේඛනයක හෝ ඇතුළත් පේටන්ට් බලපත්‍රයක් පිළිබඳ මුල් සටහනේ වලංගුභාවය, ඒ සටහන කළ දිනයේ බලපැවැත් වූ නීතියට අනුකූලව නිශ්චය කළ යුතු අතර ඒ සෑම පේටන්ට් බලපත්‍රයක් ම සඳහා එහි මුල් දිනය වෙන් කොට තැබිය යුතු ය. එහෙත් සියලුම කාර්ය සඳහා මෙම නීති සංග්‍රහයේ IV වන කොටස යටතේ එය ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) පරිච්ඡින්න කරන ලද ආඥාපනතේ 46 වන වගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් වුව ද, නියමිත දිනයට පෙර රෙජිස්ට්‍රාර් වරයා වෙත ලැබුණු 46 වන වගන්තිය යටතේ ඉල්ලුම්පත්‍ර සම්බන්ධයෙන්, රෙජිස්ට්‍රාර්වරයා විසින් තම අභිමතය පරිදි මේ නීති සංග්‍රහයේ 76 වන වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකිය.

ලකුණු: 150 වන සහ 151 වන අධිකාර පරිච්ඡින්න කිරීම සහ ආරක්ෂා කිරීම්.

190. (1) (150 වන අධිකාරය වූ) වෙළෙඳ ලකුණු පිළිබඳ ආඥාපනත සහ (151 වන අධිකාරය වූ) වෙළෙඳ බඩු ලකුණු පිළිබඳ ආඥාපනත මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) ඉහත කී ආඥාපනත් පරිච්ඡින්න කරනු ලැබුව ද—

(අ) ඒ ආඥාපනත් යටතේ සාදන ලදුව, නියමිත දිනයෙහි බලපවත්නා සෑම නියෝගයක් ම මේ නීති සංග්‍රහයේ V වන කොටසේ විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ නීති සංග්‍රහය යටතේ සාදන ලද නියෝගයක් සේ සැලකිය යුතු අතර, මේ නීති සංග්‍රහය යටතේ සාදන නියෝග මගින් එය සංශෝධනය කිරීම් හෝ අවලංගු කිරීම් හෝ කරනු ලැබිය හැකි ය;

(ආ) පරිච්ඡින්න කරන ලද වෙළෙඳ ලකුණු පිළිබඳ ආඥාපනතේ III වන කොටසේ විධිවිධාන ප්‍රකාර, වෙළෙඳ ලකුණු ලේඛනයේ (ආ) කොටසේ ලියාපදිංචි කරන ලද යම් වෙළෙඳ ලකුණක් වලංගු ලෙස සහ බලාන්විත ලෙස සැලකිය යුතු අතර මේ නීති සංග්‍රහයේ විධිවිධාන යටතේ ඒ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ හිමිකම තමාට ඇති බවට ඒ ලකුණේ හිමියා විසින් රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් කරන තාක් කල්, එනමුත් නියමිත දිනයේ සිට අවුරුදු පහකට නොවැඩි කාලයක් ඒ වෙළෙඳ ලකුණු වලංගු හා බලාන්විත බව සැලකිය යුතු අතර එය මුලින් කී පරිදි දිගටම ලියාපදිංචිව පැවතිය යුතු ය;

(ඇ) නියමිත දිනයට පෙරාතුව ම, පරිච්ඡින්න කරන ලද වෙළෙඳ ලකුණු පිළිබඳ ආඥාපනත යටතේ පැවති වෙළෙඳ ලකුණු ලේඛනයේ හෝ කලින් නිබූ යම් ආඥාපනතක් යටතේ පැවති සහ පළමු කී ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ එහිම කොටසක් විය යුතු යයි ප්‍රකාශයට පමුණුවන ලද යම් වෙළෙඳ ලකුණු ලේඛනයක ඇතුළත් වෙළෙඳ ලකුණක් පිළිබඳ මුල් සටහනේ වලංගුභාවය, ඒ සටහන කළ දිනයෙහි බලපැවැත් වූ නීතියට අනුකූලව නිශ්චය කළ යුතු අතර ඒ සෑම වෙළෙඳ ලකුණක් ම සඳහා එහි මුල් දිනය වෙන් කොට තැබිය යුතු ය. එහෙත් සියලුම කාර්යයන් සඳහා මේ නීති සංග්‍රහයේ V වන කොටස යටතේ එය ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය;

(ඈ) පරිච්ඡින්න කරන ලද වෙළෙඳ ලකුණු පිළිබඳ ආඥාපනත ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයෙහි ලේඛනයෙහි ඇතුළත්ව තැබුණු වූ සහ ඒ අවස්ථාවේ ඒ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීමට සුදුසු වෙළෙඳ ලකුණක් වූ කිසිම වෙළෙඳ ලකුණක්, එය ලියාපදිංචි කිරීමේ දිනයෙහි වලංගුව පැවති නීතිය යටතේ ලියාපදිංචි කිරීමට නොහැකිකම හේතු කොට ගෙන, ලේඛනයෙන් ඉවත් නොකළ යුතු ය;

(ඉ) නියමිත දිනයට පෙරාතුව ම ලේඛනයෙහි ඇතුළත් කොට තිබුණා වූ සහ V වන කොටස යටතේ ලියාපදිංචි කිරීමට හැකිකම නිබෙන ලකුණක් වූ කිසිම වෙළෙඳ ලකුණක්, එය ලියාපදිංචි කිරීමේ දිනයෙහි වලංගුව පැවති නීතිය යටතේ ලියාපදිංචි කිරීමට නොහැකිකම හේතුකොට ගෙන, ලේඛනයෙන් ඉවත් නොකළ යුතු ය;

(ඊ) V වන කොටසේ කිසිවකින්—

(i) නියමිත දිනයට පෙරාතුව ම විධිමත් ලෙස ලේඛනයේ ඇතුළත් කොට තුබූ වෙළෙඳ ලකුණක මුල් ලියාපදිංචිය නිර්බල නොවිය යුතුය; තවද

(ii) යම් තැනැත්තකු නියමිත දිනයට පෙර කරන ලද යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන්, ඒ ක්‍රියාව හෝ දෙය කරනු ලැබූ කාලයේ වලංගුව පැවති නීතිය යටතේ ඒ තැනැත්තා යටත් කරනු ලැබිය නොහැකිව තිබූ යම් බැඳීමකට යටත් නොකළ යුතු ය.

පනත

අතිරේක පරිච්ඡේද කිරීම්.

191. (156 වන අධිකාරය වූ) පේටන්ට් බලපත්‍ර, සැලසුම් සහ වෙළෙඳ ලකුණු (නියුඇටල් හිවිසුම) පිළිබඳ පනත, (157 වන අධිකාරය වූ) පේටන්ට් බලපත්‍ර, සැලසුම්, ප්‍රකාශන අයිතිය සහ වෙළෙඳ ලකුණු (හදිසි අවස්ථා) පිළිබඳ ආඥාපනත සහ 1964 අංක 30 දරන වෙළෙඳ ලකුණු පිළිබඳ පනත මෙයින් පරිච්ඡේද කරනු ලැබේ.

අතිරේක ආරක්ෂා කිරීම්.

192. 187 වන වගන්තියේ සිට 191 වන වගන්තිය තෙක් වූ වගන්තිවල සඳහන් පනත් සහ ආඥාපනත් පරිච්ඡේද කරනු ලැබුව ද,—

(1) නියමිත දිනයට පෙරාතුව යම් කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රයක් හෝ ලකුණක් ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලුම් පත්‍රයක් ම, පිළිවෙලින් මේ නීති සංග්‍රහයේ III වන, IV වන හෝ V වන කොටස යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයක් ලෙස සැලකිය යුතු අතර, නියමිත දිනයෙන් පසුව ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රවලට අදාළව, මේ නීති සංග්‍රහයේ ඇති විධි විධාන යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලුම් පත්‍ර සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ය.

(2) පරිච්ඡේද කරන ලද පනත් සහ ආඥාපනත්වල විධිවිධාන යටතේ, නියමිත දිනය වන විට ඉදිරිපත් කරනු ලැබ, නියමිත දිනයෙහි දී යම් මුල් අධිකරණයක හෝ අභියාචනාධිකරණයක විභාගයට විෂයව පවත්නා, ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර සහ ලකුණු සම්බන්ධයෙන් වූ සෑම නඩුවක් ම, නඩු කටයුත්තක් ම හෝ වෙනත් සෑම කරුණක් ම, පරිච්ඡේද කරන ලද පනත් සහ ආඥාපනත්වල විධිවිධාන යටතේ, අවසාන නඩු තීන්දුව දීම, පරිසමාප්ත කිරීම සහ තීන්දු ක්‍රියාත්මක කිරීම දක්වා දිගට ම පවත්වාගෙන යා යුතු ය.

(3) මේ නීති සංග්‍රහයෙන් පරිච්ඡේද කරන ලද පනත් සහ ආඥාපනත් යටතේ කරන ලද යම් නියමයක් හෝ නිකුත් කරන ලද ගාස්තු චක්‍රයක් හෝ සහතිකයක් හෝ කරන ලද දැනුම් දීමක්, තීරණයක්, නිශ්චය කිරීමක්, විධානයක් නැතහොත් දෙන ලද අනුමතයක් හෝ කරන ලද ඉල්ලුම් පත්‍රයක් හෝ කරන ලද දෙයක් කෙරෙහි මේ නීති සංග්‍රහයේ III වන, IV වන සහ V වන කොටස්වල කිසිවක් බල නොපෑ යුතු ය; තව ද, එවැනි සෑම නියමයක්, ගාස්තු චක්‍රයක්, සහතිකයක්, දැනුම්දීමක්, තීරණයක්, නිශ්චය කිරීමක්, විධානයක්, අනුමතයක්, ඉල්ලුම් පත්‍රයක් හෝ දෙයක් නියමිත දිනයට ඉහතින් දිනයේ දී බලපැවැත්වූයේ නම්, එය තවදුරටත් බලපැවැත්විය යුතු අතර එය මේ නීති සංග්‍රහය යටතේ කළ හැකි වූ, නිකුත් කළ හැකි වූ, හෝ දිය හැකි වූ තෙක් දුරට, එය මේ නීති සංග්‍රහයේ අනුරූප විධිවිධාන යටතේ කරන ලද, නිකුත් කරන ලද හෝ දෙන ලද සේ බලපැවැත්විය යුතු ය.